

# ජිනාලංකාරය

# ජි නා ල ඞ්කා ර ය.

හෙ ව ත්

සර්වඥයන්වහන්සේගේ අතිවිචිත්‍රචරිතයප්‍රකාශිත ධර්මප්‍රකරණය.

---

ත්‍රි පි ට ක වා ගී ශ්ව රා චා ර්ය

භදන්ත බුද්ධරක්ඛිත මහාස්වාමිපාදයන්වහන්සේ විසින්

වි ර චි ත යි.

---

දෙ ඩ න් දූ ව

ශෛ ල බි ම්බා රා ම වි හා ර වා සී

ගෞරවාර්හ ආචාර්ය සීලක්ඛන්ධස්ථවිරපාදයන් වහන්සේගේ

ශි ෂ්‍ය වූ

වැලිපටන්විල දීපඞ්කරසාමින්වහන්සේ විසින්

ස හ

බටපොලේ ධම්මපාලසාමින්වහන්සේ විසින්

ලියනලද පදාර්ථව්‍යාඛ්‍යානයෙන් සමුපෙතයි.


නැ දි මා ලේ

ජයසූරියආරච්චිගේ හෙලේනිස්ප්‍රේරා විසින්

මුද්‍රණයකරවා ප්‍රසිද්ධකරණලදී.

---

ගා ල් ලේ

විද්‍යාලොක මුද්‍රායන්ත්‍රාලයේ මුද්‍රණයකරණලදී.

---

1900.

THE

# JINĀLAṄKĀRA.

A treaties or the Life and Teachings of Sákyamuni.

BY

TRIPITAKA VĀGĪSWARĀCARYA

## The Venerable Buddharakkhita Mahā Thera

ROHANA OF CEYLON.

---

TRANSLATED IN TO SINHALESE AND EDITED

BY

REV. W. DĪPAṄKARA,

AND

REV. B. DHAMMAPĀLA,

at the suggestion of their Teacher

**The Very Rev. C. A. Seelakkhandha Thera,**

*Sailabimbàráma Vihàra,*

DODANDUWA.

---

Published by

J. A. HELENIS PERERA,

*of Nedimàla.*

Printed at the Vidyaloka Press,

GALLE.

---

1900.

# PREFACE.

This book " Jinálankára " was composed by a Sinhalese scholar of renown viz:– ane Venerable Buddharakkhita. He was learned in the thri Pitakas and various sciences such as grammer, Nyáya philosophy, metrical science, rhetoric etc. He attained to great eminence in Ceylon as a scholar and his fame extended to countries beyond Ceylon.

The book treats of the life of Buddha and is written in verse and prose and in excellent style. Not only is the book older in composition than other works such as Jinacarita, Samantakúta Vannaná, describing the life of the Buddha, but is universally admitted by the learned to be superior to them in all respects.

This book will be found very useful to those who wish to acquire a knowledge of the interesting legends connected with the life of Sakyamuni and of important doctrines taught by Him. The following verses appearing at the conclusion of the book show that it was written in the year 1700 (Buddhist era) or about 1200 A. D.

" Evam hi Buddhabhùtassa
Katakiccassa tádino,
Parinibbutassa mallànam
Yamakasálana mantare.

Sattarasasate vasse
Gate lankátale tada,
Rohane sacivamsamhi
Játo patthata kittimá.

Buddharakkhita námo so
Bikkúnam ganavácako
Abhidhammanabhe vâyu
Vegova matiyá gato.

Nánásina titikkhena
Jitamàrabalam jinam
Jinàlankára nàmena
Alankàrena' lankari. "

" In the seventeen hundreth year, Buddharakkhita Thera born in the Rohona principality of Lanka in an unsallied clan, of wide renown, teacher of a number of Bhikkhus and endowed with a knowledge

of Abhidhamma as widespread as a gale in the heavens, did adorn with the jewel of "Jinàlankàra" the lord Sàkyamuni, who with the extinguishing of passions and with the sword of wisdom vanquished evils of attachment etc." This venerable Buddharakkhita Thera lived in a famous temple in the principality of Rohona in Mágampattu in the Southern Province. The name of the Vihàra (temple) where he lived is mentioned neither in this book nor elsewhere. He lived in the reign of the great king Sri Paràkrama bàhu who reigned in Ceylon with Polonnaru (Pulatthi) as his capital and who extended his rule to countries beyond the Island.* Mahàkàsyapa, Moggallàna, Sáriputta and other learned priests, authers of well known works on grammer, metrical science, rhetoric etc., were contemporaries of Buddharakkhita in this famous age of learning.

This book consists of sixteen chapters and describes seperately the various wonderful attributes of the Buddha. While this book is highly valued by Buddhist scholars of all countries, the absence of a Sinhalese translation has prevented those ignorant of Pàli from making use of the book. Several educated friends who felt this want, having invited us to write and publish a paraphrase into Sinhalese we, for the present, give a Sinhalese version of the "gàthas" (verses).

We submitted this publication to our respected tutor the Very Rev: C. A. Seelakkhandha Thera, who upon seeing our work approved of it and corrected a number of errors. We have to thank other friends also helped us in procuring old manuscripts of the work.

*Welipatanwila Deepankara Bhikkhu.*
*Batapole Dhammapala Bhikkhu.*

*Sailabimbàráma Vihàra,*
*Dodanduwa, 1st October 1900.*

---

* Vide Mahàwamsa, Chapters LXII–LXXIX.

# විඥාපනය.

---

ශ්‍රීවචිජිරීඥනශාසනොදයකාමී සමස්ත විද්වජ්ජන හෘදයානන්දජනනවූ ජිනාලඞ්කාරනම් මේ ශුද්ධමාගධීභාෂාමය ප්‍රශස්තධර්ම ප්‍රකරණය සම්බුද්ධවර්ෂයෙන් එක්දහස්සත්සියවන්නෙහි හෙවත් මෙයින් හවුරුදු සත්සියසූසාළිසකට පූර්වයෙහිදී මෙම ලක්දිව රොහණජනපදයෙහි සුපරිශුද්ධවංශාභිජාතවූ ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය්‍ය තර්ක ව්‍යාකරණකාව්‍යාලඞ්කාරාදි නානාශාස්ත්‍රාන්තර ප්‍රවීණ විමල විපුල බුද්ධිඇති බුද්ධරක්ෂිතමහාස්වාමිපාදයන් විසින් ස්වහිත පරහිතසාධනයෙහි පැවති පරම කරුණාධ්‍යාසය පූර්වාඞ්ගම කොට ගෙණ බුද්ධ ගුණානුස්මරණ ස්වරූපයෙන් රචනාකරණලද ධර්මකථාඞ්ගසඞ්ගත මාහැඟි ප්‍රකරණයෙකි.

මේ ප්‍රකරණයෙහි ශ්‍රීශාක්‍යමුනීන්ද්‍රභූත අප තථාගත සම්‍යක් සම්බුද්ධ සර්වඥරාජොත්තමයානන්වහන්සේගේ අනන්‍යසාධාරණවූ නෛසර්ගිය ගුණසමුදය වනාහි හෙතුඵලනිදර්ශනමුඛයෙන් සර්වප්‍රකාරයෙන් වර්ණනාකරණලද්දේය, "ජිනාලඞ්කාර" යන එතද්ග්‍රන්ථප්‍රතිපාදිත අන්වර්ථාභිධෙයයෙන්ම තදර්ථය සුප්‍රතීතයි, අප සම්‍යක් සම්බුද්ධයන්වහන්සේගේ ශුද්ධාතිශුද්ධ චරිතය ප්‍රකාශකොට තදනීන්තනස්වාධීන කවිවරයන් විසින් ශුද්ධමාගධිභාෂායෙන් විරචිත ජිනචරිත-සමන්තකූටවර්ණනාදි පද්‍යාත්මක අන්‍යප්‍රකරණයන්ට වඩා මේධර්මප්‍රකරණය සවිස්තර සම්බුද්ධචරිතයෙන් සමුපෙතකොට තිබේ, එහෙයින් සම්බුද්ධචරිතය දැනගැණීමෙහි අභිලාෂීවූ සකලසුධීන්ගේ තදභිලාෂාපරිපූරණයෙහි මේ ධර්මප්‍රකරණය අතිශයප්‍රයොජනජනකබැව් සුධීන්ට මනාවවැටහේ.

ආචාර්ය්‍ය බුද්ධරක්ෂිතමහාස්වාමිපාදයන් විසින් මේ ග්‍රන්ථනිර්මාණය කළ කාලනිර්ණය හා තදාචාර්ය්‍යයන්වහන්සේගේ පාණ්ඩිත්‍යමාහාත්ම්‍යයත් දැනගැණීමට ග්‍රන්ථාවසානයෙහි ග්‍රන්ථකර්තෘවූ මේ ආචාර්ය්‍යවරයන්විසින්ම යොදනලද ගාථාපඞ්ක්තියද අතිශයොපකාරීවන්නීමැයි. ඒ මෙසේයි:—

"එවංහි බුද්ධභූතස්ස කතකිච්චස්ස තාදිනො,
පරිනිබ්බුතස්ස මල්ලානං යමකසාලාන මන්තරෙ.

සත්තරසසතෙ වස්සෙ ගතෙ ලඞ්කාතලෙ තදා,
රොහණෙ සුචිවංසම්හි ජාතො පඤ්ඤකිත්තිමා.

බුද්ධරක්ඛිතනාමො සො භික්ඛූනං ගණවාචකො,
අභිධම්මනයෙ වායුවෙගොව මතියා ගතො.
ජුණ්ණසිතා ' තිහිතෙබන ජිතමාරබලං ජිනං,
ජිනාලඞ්කාරනාමෙන අලඞ්කාරෙන ' ලඞ්කරි " යි.

මෙහි දක්වනලද මේවර්ෂසඞ්ඛ්‍යාවේ හැටියට මේකාලයෙහි ලක්දිව රජපැමිණ රාජ්‍යානුශාසනාකරණලද්දේ පුලස්තිපුරය හෙවත් පොලොන්නරුනුවර අග්‍රරාජධානිය කොට විසූ අනෙකතෙජෝබලපරාක්‍රමාන්විත ශ්‍රීපරාක්‍රමබාහුනමින් ප්‍රකටවූ මහලු පැරකුම්බා මහරජතෝයි, මේ රාජෝත්තමතෙම ශත්‍රුකුඤ්ජර කුම්භවිදාරණයෙහි කෙශරසිංහ වික්‍රමාතිශයෙන් සකල ලඞ්කාවීප තලය එකච්ඡත්‍ර කොට රාජ්‍යශ්‍රීපදප්‍රාප්තවූයේ ශ්‍රීබුද්ධවර්ෂයෙන් එක්දහස්සසිය අටානූවන්නේදීබව මහාවංශාගත නියායෙන් පෙණේ, මේ වර්ෂසඞ්ඛ්‍යාව මීට මදක් වෙනස්ව සම්බුද්ධපරිනිර්වාණයෙන් එක්දහස් සසිය සයානු හවුරුද්දක් ගියපසු මහලු පැරකුම්බා මහරජතුමා සිරිලක රජපැමිණියේයයි ශාසනාවතාරයෙහි කියාතිබේ, මහාවංශයෙහි හා ශාසනාවතාරයෙහිත් පෙණෙන වර්ෂසඞ්ඛ්‍යාවල එකිනෙකට මදමද වෙනසක් දකින්ට ලැබෙතත් ශාසනාවතාරයෙහි පෙණෙන වර්ෂසඞ්ඛ්‍යාවම මෙහිදී ගරු වශයෙන් ගතයුතුවේ, මෙසේ මේ පරාක්‍රමබාහු මහරජනත් රජපැමිණි වර්ෂය හා ග්‍රන්ථනිර්මාණය කළවර්ෂයත් සමකොට බැලූවිට පරාක්‍රමබාහු මහරජනත් රජපැමිණි සිව්වනවර්ෂයේදී මෙම පොත රචනාකරණලදබැව් පෙණේ, මේ මහරජතුමා රාජ්‍යශ්‍රීපදප්‍රාප්තව බුදුසසුනෙහි අතිශයින් පහන්සිත්ඇතිව නොයෙක් කුශලකර්මයන්හි යෙදෙමින් තෙතිස් හවුරුද්දක් ලක්දිව රාජ්‍යානුශාසනා කළබැව්ද මහාවංශයෙහි ප්‍රකාශව තිබේ. ඒ මෙසේයි:—

"ඉති විහිතවිවිධානෙකපුඤ්ඤප්පකාරො
සතතමතිපසන්නො සත්ථුනො සාසනස්මිං,
වරධිතිමතියුත්තො සො පරක්කන්ති බාහු
නරපති රපිරජ්ජං ' කාසි තෙත්තිංසවස්සං."

මේ මහලු පැරකුම්බා මහරජනත්ගේ කාලයත් ජිනශාසනාභරණවිභූෂිතවූ ශ්‍රද්ධාශීලාද්‍යනන්තගුණගණාභරණයෙන් සමලඞ්කෘත පිටකත්‍රයධාරී පූජ්‍යහිමහාස්ථවිරයන් වහන්සේලාගෙන් ලක්දිව ශෝභමානවතුබුනු කාලයක්වීය, මේ කාලයෙහි බුද්ධරක්ෂිතමහාස්වාමිපාදයන්වහන්සේ සවදෙශදෙශාන්තරයන්හි පතළකීර්තිඇති ව ප්‍රසිද්ධපණ්ඩිතවරයන්ගෙන් පවා බොහෝ ගරුබුහුමන් ලබමින් නොයෙක් භික්ෂුසමූහයාට ආචාර්යභාවයෙන් විජෘම්භමාණවූ බවට වැදගත් සාක්ෂි තිබේ, මෙයින් මුන්වහන්සේගේ පාණ්ඩිත්‍යයේ

ගරුභාවය සිතාගැනීම සියල්ලන්ටම අපහසුනොවේ. මුන්වහන් සේගේ ජාතභූමියත් රොහණජනපදයබැවිං ග්‍රන්ථාවසානයෙහි කියා තිබෙනනමුත් කිනම් ප්‍රදෙශයක කිනම් විහාරයක වැඩවිසූයේ දැයි නිශ්චයක් නොමැතිබැවින් මුන්වහන්සේ රොහණජනපද යෙහි එක්තරා ප්‍රසිද්ධවිහාරයකම වැඩවිසූයේයයි සිතියහැකියි, මහලු පැරකුම්බා මහරජතුමා තමන් රාජ්‍යශ්‍රීපදප්‍රාප්තවූ සතරවන හවුරුද්දේදී තත්කාලශාසනානුශාසක අඛණ්ඩාච්ඡිද්‍රතාදි විවිධ ගුණගණොපලක්ෂිත ඖදුම්බරගිරිඅරණ්‍යවාසී මහාකාශ්‍යපස්ථවිර යන්වහන්සේ ඉවහල් කොටගෙණ නිකායත්‍රයවාසී භික්ෂූන් සාමාග්‍රියට පමුණුවා කරණලද ශාසනශුද්ධියටද මේ බුද්ධරක්ෂිතමාහිමියන්වහන්සේත් ආධාරකාරත්වයෙන් පමුණුවාගත්තා ලද්දේ දැයි නිශ්චයවශයෙන් දැනගැනීමට සෑහෙනතරම් සැලකියයුතු යමක් කිසිපොතකපතක සඳහන්ව තිබෙනවා මේතාක් අපට දකින්ට නොලැබුණේය, එසේ නමුත් එම ශාසනශුද්ධිය සඳහා අනුරාධපුරය සපරගමුව රොහණජනපදය ආදි ලක්දිව නොයෙක් දිශාවල වැඩසිටි නිකායත්‍රයවාසී භික්ෂූන්වහන්සේලා පොළොන්නරුවට මහලු පැරකුම්බා මහරජතුමා විසින් කැඳවනු ලැබූබැවි මහාවංශයෙහි පෙණේ. ඒ මෙසේයි:—

“අනුරාධපුරෙ. ඤාණපාලථෙරං සසිස්සකං,
රට්ඨෙ ච සප්පරෙ භික්ඛූ පුලත්ථිපුර මානයි.
ස මොග්ගල්ලානථෙරඤ්ච ථෙරං නාගින්දපල්ලියං,
යුවරාජස්ස රට්ඨස්මිං අඤ්ඤෙ සබ්බෙ ච භික්ඛවො.
නන්දථෙරවරං සෙලන්තරායතනවාසිනං,
රොහණෙ පමුඛං කත්වා නිකායත්තයවාසිනො” යි.

මේ ආචාර්ය්‍ය බුද්ධරක්ෂිතමහාස්වාමිපාදයන්වහන්සේගේ නාමය මෙහි සඳහන්නුවූවත් ඒකාලේදී මුන්වහන්සේත් පතළ කීර්ත්තියක්ඇති ගණප්‍රධාන ස්ථවිරකෙනෙක්ව වැඩසිටි බැවින් එම ශාසනශුද්ධියට කැඳවන ලදුව එහි මහාකාශ්‍යපස්ථවිරප්‍රමුඛ වූ විනිශ්චයාධිකාරීසඞ්ඝසභාවට ඇතුළත්කරගන්ට ඇතුවාට අනුමානනැත.

තවද අටුවාචාරී බුද්ධඝොෂ මහාස්වාමිපාදයන්පටන් මේඅතුරෙහි නොයෙක් ටීකාඅත්ථකථාහා තත්ප්‍රවංශාපායවූ අනෙකප්‍රකාර ධර්මප්‍රබන්ධනා සන්න ගැටපද පිටපත්ආදිය උපදවා බුදුන්ගේ පර්ය්‍යාප්තිශාසනය බැබලවූ පූජ්‍යපාද මහාස්ථවිරයන්ට මුන්වහන්සේත් ඇතුලත්බැව් ශාසනාවතාරයෙහි කියාතිබේ. ඒ මෙසේයි:—

“යටකී මහානාමරජුදවස බුද්ධඝොෂනම් අටුවාචාරී මහාස්ථවිරපාදයන් පටන් මේඅතුරෙහි බුද්ධදිනාය-ධම්පාලය-ජොතිපා

ලය-ඛෙමය-ධර්මප්‍රිය-නන්දය-ආනන්දය-අනුරුද්ධය-උපතිෂ්‍යය-බුද්ධ රක්ෂිතය-මෞද්ගල්‍යායනය-යනාදිවූ ආචාර්‍ය මහාස්ථවිරයන්හා එකශ්‍රැතීන් නෛකසහස්‍ර ග්‍රන්ථධාරණයට සමර්ථවූ වජ්‍රඥානඇති ශාරිපුත්‍රමහාස්වාමිපාදයන් පටන් සඞ්ඝරක්ෂිතය-සුමඞ්ගලය-වාගීශ්ව රය-ධර්මකීර්තිය-නාගසේනය-ආනන්දය-වෛදේහය-බුද්ධප්‍රියය-අනව මදර්ශීය-යනාදී මහාස්ථවිරවරයෝ නොයෙක් ටීකාටීකාර්ථහා තන් ප්‍රවේශෝපායවූ අනේකප්‍රකාර ධර්මප්‍රබන්ධහා සන්න ගැටපද පිට පත්ආදිය උපදවා බුදුන්ගේ පර්‍යාප්තිශාසනය බැබලවූහ" යනුයි.

මෙහි නම් සඳහන්වූ බුද්ධරක්ෂිත මහාස්වාමි පාදයෝනම් ජිනාලඞ්කාර කර්තෘවූ මේආචාර්‍ය බුද්ධරක්ෂිත ස්වාමිපාදයෝමැයි, මුන්වහන්සේ විසින් ඉපදවූ ධර්මප්‍රකරණයත් මේ ජිනාලඞ්කාර යම මිස අනිකක් නොවේ, එහෙයින් ආචාර්‍ය ගෞරවයහා ග්‍රන්ථ ගෞරවයත් හැගවීමට වැඩිදුර කරුණු නොදක්වූවාට මෙතෙක්ම ප්‍රමාණවේමැයි.

ආචාර්‍ය බුද්ධරක්ෂිත මහාස්වාමිපාදයන් විසින් මේ පොත පළමු කොට පද්‍යාත්මක ශ්‍රව්‍ය කාව්‍ය ස්වරූපයෙන් රචනාකොට පසුව මිට වර්ණනාව ලියන ලද්දේවනැයි සිතීමට කරුණු පෙ ණෙන නමුත් "**ජිනාලඞ්කාර**" යන නාමය අටවිසි බණවරකින් සම්පිණ්ඩනය කරණලද වර්ණනාවත් සමගම ග්‍රන්ථයට ව්‍යවහාරවූ නාමයයි වැඩිදෙනා සලකනබැව්ද පෙණේ, එහෙයින් මෙහිදී ඒ ගැණ වැඩිදුර කාරණා ලියන්ට අපි නොකැමැත්තෙමු, එතකු දුවූවත් ග්‍රන්ථාරම්භයෙහි "**ජිනෙනානුම්පොතසො**" යනාදි ගාථාවගේ භාවාර්ථ දක්වන ප්‍රස්තාවෙහි පෙණෙන **ජිනාලඞ්කාරං සුවණ්ණ සං වණ්ණයිස්සාමි ති වුත්තං හොති**" යී යන මෙයින්හා ග්‍රන්ථාව සානයෙහි "**ජිනාලඞ්කාරවණ්ණනා නිට්ඨිතා**" යන මෙයිනුත් වෙනත් මෙබඳු කියමන්වලිනුත් හැඟෙන්නේ මේ ධර්මප්‍රකරණ යට ඇතුළත් පද්‍යාත්මකකාව්‍යයට ජිනාලඞ්කාරය කියාත් තදර්ථ වර්ණනාවට ජිනාලඞ්කාරවර්ණනාවය කියාත් ව්‍යවහාර කළබවයි, එසේවූවහොත් ග්‍රන්ථයාගේ ආදියෙහිවූ "**සුඛඤ්ච දුක්ඛං**" යනා දි ගාථාත්‍රයහා පරිච්ඡේදාවසානයන්හි දෘශ්‍යමාන නමස්කාර ස්වරූ පගාථාත් අවසානයෙහි "**ලද්ධාභිසෙකො වරපණ්ඩිතෙහි**" යනා දි ගාථාත්‍රයත් වර්ණනාවට අයත් ඒවාමිස මූලග්‍රන්ථයට අයත් ඒ වා,යයි නොහැඟේ, කුමක්හෙයින්දයත්? "**සො ලොකනාථසම්බුද්ධො**" යනාදි ගාථාවෙන් නමස්කාර දක්වා ජිනාලඞ්කාර කාව්‍යය ප්‍රා රබ්ධකොට "**ජිනාලඞ්කාර නාමන්තං පටිගණ්හාථ සාධවො**" යන්නෙන් අවසානකළ හෙයිනි, මෙතෙකින්ම මේ ජිනාලඞ්කා රකාව්‍යයාගේ පරිනිෂ්ඨාසෞෂ්ඨවය මනාව හැඟෙයි, [illegible]ලී පරිච්ඡේදවෙන්කිරීමත් වර්ණනාවට සුදුසුපරිද්දෙන්මිස කාව්‍යයට

සුදුසුපරිද්දෙන් නොවනබවද පෙණේ, එසේවීනමුත් වර්ණනාංශතක්‍රමයෙන්ම මෙහිදී අපිදු පරිච්ඡේද වෙන් කෙළෙමු, මේ පොත පරිච්ඡේද සොළසකින් සමාප්තකොට තිබේ, විචිත්‍රාලඞ්කාරයන්ගෙන්හා යමකබන්ධනාදි දුෂ්කරබන්ධනයන්ගෙන් උපලක්ෂිතවූ ශුද්ධමාගධීභාෂාමය පද්‍යාත්මක ප්‍රශස්තකාව්‍යයක් මේජිනා වෙන නොමැත්තේයයි කියහැකිය, එහෙයින් ශුද්ධමාගධී පද්‍යබන්ධනයෙහි නියැලි ආධුනිකයන්විසින් මේ පොත සමාදරයෙන් පරිශීලනය කටයුතුවේ, මීට කරණලද වර්ණනාවද තන්හි තන්හි නොයෙක් දෙශනාපීකථාදියෙන් හොබවා බුදුරජානන්වහන්සේගේ විශිෂ්ටතර අතිශයාද්භූත චරිතය විද්‍යාර්ථින්ට නිරායාසයෙන් අවබොධකරගැණීමට හැකිවනලෙස පිඩුකොට ලියනලද විචිත්‍ර ව්‍යාඛ්‍යානයකි, ජිනාලඞ්කාර කාව්‍යයහා තද්වර්ණනාවත් මේතාක් එකටම පැවැත්තාමිස හුදු ජිනාලඞ්කාර කාව්‍යය පමණක් වෙන් වශයෙන් නොපැවැත්තේය, මේ ග්‍රන්ථය වර්ණනා සහිතව ශුද්ධකොට සම්පූර්ණයෙන් මුද්‍රණය කරවීමට අපේ අදහස තිබුනනුමුත් මේ වරට ජිනාලඞ්කාර කාව්‍යය පමණක් සිංහලාර්ථව්‍යාඛ්‍යානයක් සමග මුද්‍රණය කරවා විසුරුවා හැරියොත් එයින් වර්තමානකාලයෙහි විද්‍යාර්ථින්ට විපුල ප්‍රයෝජනයක් වේයයි ප්‍රාමාණික කීපදෙනෙකුන් විසින් එසේ කරන්ට ආරාධනා කළහෙයින් එසේ කිරීම යොග්‍යයයි අපටද වැටහුනු බැවින් පරණ පිටපත් කීපයක් එකතුකරවාගෙණ එකිනෙක සමකොට බලා බොහෝ උත්සාහයෙන් චිරකාලාකීර්ණවූ ලිපිකරප්‍රමාදයෙන් ජනිතදොෂයන් පහකොට මෙහි මතු නම් සඳහන්වන අප දෙනම විසින් පළමුකොට මේ පොත ශුද්ධ කරගැණීමෙන් තද්වර්ණනාවත් ඇසුරුකොටගෙණ යථාශක්තීන් මේ සිංහලාර්ථ ව්‍යාඛ්‍යානය ලියා අපගේ ධර්මාචාර්යවූ දෙඩන්දුව ශෛලබිම්බාරාමාධිවාසී ගෞරවාර්හ ආචාර්ය සීලක්ඛන්ධාභිධාන ස්ථවිරපාදයන්වහන්සේට භක්තිපුරඃසරව ගෞරවයෙන් ඔප්පුකරණ ලද්දේය, එවිට උන්වහන්සේ විසින්ද යථාවකාශවශයෙන් බලා මේ ව්‍යාඛ්‍යානය යහපත්යයි සතුටුවී අපේ ප්‍රමාදභ්‍රමාදියෙන් වැටීතුබුනු දොෂස්ථාන කීපයක්ද කරුණාසිතින් ශුද්ධකර දෙනලද්දේය, මේ ව්‍යාඛ්‍යානය ලියන අපවිසින් පදාර්ථමාත්‍රයකින් ගාථාවල අර්ථසුගම නොවන තැන්වලදී භාවාර්ථත් දක්වා ආධුනිකජනතාවට පහසුවෙන් අර්ථාවබෝධය වනසේ මේ ව්‍යාඛ්‍යානය ලියන ලද්දේය.

බාලාවස්ථාවෙහි පටන් අපට ධර්මශාස්ත්‍රෝද්ග්‍රහණය කරවීමාදියෙන් බොහෝසේ උපස්තම්භකව ක්‍රියාකළාවූ අපගේ ආචාර්යයන්වහන්සේලාවූ වැලිපටන්විල පුලිනතලාරාමාධිවාසී සරණතිස්සාභිධාන ස්ථවිරයන්වහන්සේද බටපොළේ සුභද්‍රාරාමාධිවාසී

# THE JINALANKARA.

J. H. HELENIS PERE... KEDIMALE

සන්නසහිත.

# ජිනාලඞ්කාරය.

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

1 සුඛඤ්ච දුක්ඛං සමතායුපෙක්ඛං
නෙ විච්ඡි යො කාමමකාමනීතං,
අසඞ්ඛතං සඞ්ඛතසම්භවං භවං
හිත්වා ගතො තං සුගතං නමාමි.

---

මධුරතරවිචිත්‍රකවිසමයෙහි අසදෘශවාගම්වූ ත්‍රිපිටකපර්‍ය්‍යාප්ති ප්‍රභෙදනවාඞ්ග ශාස්ත්‍රශාසනයෙහි උද්ග්‍රහප්‍රතිපෘච්ඡායොනිසොමනස්කාරවශයෙන් යහපත්සේ අභිනිවේශයට අතිශයප්‍රගල්භවූ ස්වසමයසමයාන්තරයන්හි අනල්පකෞශල්‍යයෙන් යුක්තවූ ගණිත ජ්‍යොතිෂ තර්ක ව්‍යාකරණාලඞ්කාරාදි නානා ශාස්ත්‍රපාරප්‍රාප්තවූ සුනිශිත විශද විමල විපුල බුද්ධිප්‍රභාවඇති බුද්ධරක්ෂිතමහාස්වාමිපාදයෝ ස්වහිත පරහිතකරණබුද්ධියෙන් බුද්ධාදිවස්තුත්‍රයෙහි අසඤ්ජාතප්‍රසාදඇත්තවුන්ගේ ප්‍රසාදාවහනයපිණිසත් ප්‍රසන්නවූවන්ගේ ප්‍රසාදාභිවෘද්ධිය පිණිසත් මිථ්‍යාදෘෂ්ටියගේ පරිමොචනයපිණිසත් සම්‍යක්දෘෂ්ටියගේ නිශ්චලවපිහිටීමපිණිසත් අනන්තදුඃඛානුභවයටහෙතුවූ සකලක්ලෙශයන්ගේ නිරවශෙෂප්‍රහාණයපිණිසත් සියලුගුණසමූහයාගේ ප්‍රතිලාභයපිණිසත් සමාධිසමාපත්තීන්ගේ අභිනිෂ්පත්තියපිණිසත් විද්‍යාවිමුක්ත්‍යාදිවිශිෂ්ටතරගුණයන්ගේ සමධිගමයපිණිසත් නිත්‍යසුඛස්වරූපවූ පරමශාන්තනිර්වාණයාගේ ප්‍රත්‍යක්ෂකිරීමපිණිසත් ජිනාලඞ්කාරනම්වූ බුද්ධානුස්මෘතිප්‍රකාශක මේප්‍රශස්තග්‍රන්ථය කරනුවූවෝ ග්‍රන්ථාරම්භයෙහි රත්නත්‍රයට නමස්කාරකරණුසඳහා "සුඛඤ්චදුක්ඛං" යනාදිගාථාවය උපන්‍යාස කළෝ.

1. යො, (පරදුඃඛානුකම්පිතලක්ෂණකරුණාවෙන්යුක්තවූ) සර්වඥයෙක්; සුඛං, කායිකචෛතසිකසුවද; හෙවත් (අපරිමිත කුශලබලයෙන් පැමිණි) සක්විතිරජසුවද; දුක්ඛං, කායිකචෛතසිකදුක්ද; හෙවත් (දුෂ්කරක්‍රියාකරණසමයෙහි හා පාරමීසම්භරණ කාලයෙහි නෙත්‍රපරිත්‍යාගකිරීමෙන්හා නෙරයිකාදිසංසාරගතියෙන් පැමිණි) දුක්ද; නෙවඉච්ඡි, නොකැමතිවූසේක්ද; (මෙයින් කාම

## ස න් න ස හි ත .

2. යඤ්ඤා නුභුත්වාන 'ජරාමරා' සුඛං
යෙ චානු භුත්වාන 'ජරාමරා' සුඛං,
තං තෙ නමිත්වාන ගුණණ්ණවස්ස
වණ්ණෙස්සත පුරෙම් මනණ්ණවස්ස.

---

සුඛල්ලිකානුයොගඅාත්මකලමථානුයොග යනඅන්තවයාගේ ප්‍රහාණයම සන්දර්ශිතයි.) සමතාය, මධ්‍යමප්‍රතිපදාසඞ්ඛ්‍යාතසමතාවෙන්; (ලැබියයුතුවූ) උපෙක්ඛං, (උපෙක්ෂාසම්‍යතිපාරිශුද්ධිසඞ්ඛ්‍යාත චතුර්ථධ්‍යානයෙන්හා තත්පාදකකොටඇතිඅර්හත්ඵලවිමුක්තියෙන් ලත් ෂඩඞ්ගොපලක්ෂිතවූ) මධ්‍යස්ථතාවද; නෙවඉච්ඡි, නොකැමතිවූසේක්ද; (මෙහි පරිනිර්වාණයම කැමතිවීයයනු අභිප්‍රායි) කාමම කාමනීතං– කාමනීතං, කාමතෘෂ්ණාවෙන් එළවනලදභවසම්පත්ද; අකාමනීතං, කාමච්ඡන්දප්‍රහාණයෙන් ලක් ලොකොත්තරසම්පත්ද; නොහොත් කාමනීතං, සෙච්ඡාවෙන් එළවනලද දුක්ද; හෙවත් දීපඞ්කරබුදුන්ගේ පාමුල්හි අභිනීහාරය කොට අප්‍රමෙයකාලයක් නෙත්‍රදානාදියෙහිදී උපන්දුක් ඉවසා මහොත්සාහයෙන් ලත් බුද්ධත්වයද ඒපිණිස සියකැමැත්තෙන්ම ඉවසූ දුක්ද; අකාමනීතං, නිර්වාණාලම්බනකොටඇති අර්හත්ඵලයද; නෙවඉච්ඡි, නොකැමතිවූසේක්ද; අසඞ්ඛතසම්භවං, නිර්වාණය සාක්ෂාත්කිරීමෙන් ලත්; භවං, මාර්ගඵලසර්වඥතාඥනාදි සම්පත් හා ප්‍රඥප්තිආලම්බනකොටඇති ධ්‍යානසම්පත්ද; සඞ්ඛතසම්භවං, අපරිමිත කුශලඵලයෙන් ජනිතවූ; භවං, භවභොගසම්පත්ද; හිත්වා, හැරපියා; ගතො, (නිරුපධිශෙෂනිර්වාණධාතුවට) පැමිණිසේක්ද; සුගතං, ශොභනගමන්ඇති හෙයින් සුගත්නම්වූ; තං, ඒසර්වඥයන්; නමාමි, (කායාදිමාරත්‍රයෙන් සකසා) වඳිමි.

2. යඤ්ච, නවවිධවූ යම්ලොකොත්තරසද්ධර්මයක්; අනුභුත්වාන (සෙවනාභාවනාවශයෙන්) ප්‍රතිවෙධකොට; හෙවත් තත්වාවබොධකොට; අජරාමරා, (ප්‍රමාණාතික්‍රාන්තාදිව්‍යමනුෂ්‍යයෝ) ජරාමරණරහිතවූවාහු; හෙවත් ජරාමරණාදිවෘත්තදුඃඛයෙන් මිදුනාහු; ආසුං, වූද; තං, ඒසපර්‍යාප්තිකනවලොකොත්තරසද්ධර්මයද; යෙ, යම් ශාරිපුත්‍රමෞද්ගල්‍යායනාදිආර්‍යසඞ්ඝකෙනෙක්; අනුභුත්වාන, (ඒසද්ධර්මය පූර්ණාකාරයෙන්) අවබොධකොට; අජරාමරා,

## ජි නා ල ඞ්කා ර ය.

3. ජිනෙන්දමත්තෙභකුම්භචාරිණී
ජිනොරසානං මුඛපඞ්කජාලිනී,
සරස්සතී මෙ මුඛගබ්භගබ්භිනී
රමන්තු' නායාස සදත්ථසූදනී.

---

ජරාමරණනැත්තෝ; ආසුං, වූද; තෙව, සුප්‍රතිපන්නාසුජුභාවා දීන් යුක්තවූ ඒ ආර්‍ය්‍යසඞ්ඝයාද; නමිඤ්ඡාන, වැද; ඇණ ණණාවස්ස, ගුණාණ්ණවවූ; අස්ස, (ෂඩභිඥාදියෙන්සමුප ලක්‍ෂිතවූ) ඒසර්වඥයන්ගේ; වණ්ණෙණක, ගුණකීර්තනනැමැතිජල යෙන්; නොහොත් ගුණදීපකවූ ජිනාලඞ්කාරනම්ප්‍රකරණයෙන්; මනණ්ණවං, ශ්‍රොතෘජනයන්ගේ සිත්නැමැතිසාගරය; පූරෙමි, පුරම්;

3. ජිනෙන්ද්‍ර, සර්වඥයන්නැමැති; මත්තෙභ, මදත්හුගේ; හෙවත් ආකාශගාමීෂඩ්දන්තාහස්තිරාජයක්හුගේ; (අෂ්ටපර්ෂද්හි අකම්ප්‍යභාවයහෙතුකොටගෙණ සර්වඥයෝ මත්තවරවාරණයකුබඳුවෙතියි දක්වූහ) කුම්භ, ආසභිවාක්නැමැතිමදජලයෙහි; චාරිණී, හැසිරෙණසුලුවූ; (සත්වයන්ගේ මානමදාදිය අභිභවනයකරන්නාවූ භගවත්හුගේ චතුඃසත්‍යදෙශනාවශයෙන් පැවති අභීත නාදයම මෙහි මදජලයයි කියනලදී) ගබ්භිනී, ගැබිනිවූ; හෙවත් (භගවත්හුගේ ආසභිවාක්සඞ්ගමයකරණකොටගෙණ නෙයාර්ථනීතාර්ථාදිපරමාර්ථයන්ගෙන් පිරුණුහෙයින්) ගන්නාලද ගැබ්ඇති; ජිනොරසානං, සර්වඥපුත්‍රයන්ගේ; මුඛපඞ්කජ, මුවපියුම්වල; අලිනී (සංවෘතිපරමාර්ථකාව්‍යකථාදීන්හි කාව්‍යරසයත් අර්ථරසයත් හකුලුවාගෙණ ගාථාශ්ලොකබන්ධනවශයෙන් මධුරවූ මධුපටලයකරණහෙයින් පද්මාදියෙහි රසයගෙණ මීපටලයකරණ) භෘඞ්ගධෙනුවක්වැනිවූ; සරස්සතී, (සර් සභාවයෙන් හෙබියාවූ) වාගවනිතාතොමෝ; (තථාගතයන්ගේ ආසභිවාක්සඞ්ගමයෙන් ගන්නාලදගැබ්ඇත්ති සර්වඥපුත්‍රයන්ගේ මුඛපද්මයෙහි මීරසපානයකොට ලත්රසාස්වාද ඇත්තී දූන් ඒ උත්තමයන්පිරිනිවීහෙයින් අනෘප්‍රසවස්ථානයක්නොලබන්නී බුද් රක්‍ෂිතාචාර්‍ය්‍යවූ මාකරාපැමිණ) අනායාසං, නිරායාසයෙන් සදත් උත්තමාර්ථනැමැති දරුවන්; නොහොත් පරමාර්ථයන්; සූදනී, පූස කරන්නී; නොහොත් ප්‍රකාශකරන්නී; මෙ, (බුද්ධරක්‍ෂිතාචාර්‍ය්‍ය මාගේ; මුඛගබ්භ, මුඛනැමැතිගර්භයෙහි; හෙවත් මුඛයෙහි; රමන් (ඉෂ්ටාර්ථසාධනයෙන්) අභිරමනය කෙරේවා; හෙවත් වෙසේව

## සන්නසහිත.

4. යො ලොකත්ථාය බුද්ධො ධනසුතභරියාඅඞ්ගජීවෙ චජිත්වා
පූරෙත්වා පාරමීයො තිදසමනුපමෙ බොධිපක්ඛියධම්මෙ *,
පත්වා බොධිං විසුද්ධං සකලගුණදදං සෙට්ඨභූතො තිලොකෙ
කත්වා දුක්ඛස්ස අන්තං කතසුභජනතං දුක්ඛතො මොචයිත්ථ.

5. නත්වා නාහං ජිනං තං සමුපචිතසුභං සබ්බලොකෙකබන්ධුං
නාහූ යෙනාපි තුල්‍යො කුසලමභිමතො උත්තමො භූතලොකෙ,
තස්සෙ’ වෙදං සුවිමහං සුවිපුලමමලං බොධිසම්භාරභූතං
හෙතුං හෙත්වා’ නුරූපං සුගතගතඵලං භාසතො මෙ සුණොථ.

---

4. යොබුද්ධො, සම්සම්බුදුයෙක්; ලොකත්ථාය, සත්වයන්ට හිත සුවකරණුපිණිස; ධන, (ඇත්අස්ආදිසවිඥානකධනයා මුතුමැණික් ආදි අවිඥානක) ධනද; සුත, පුත්‍රදුහිතෘන්ද; භරියා, (කෙලශසංසර්ගී යට පැමිණි) අඹුවන්ද; අඞ්ග, (හස්තපාදදීශරීර) අවයවයන්ද; ජීවෙ; ජීවිතෙන්ද්‍රියපිළිබඳවූ සියසිරුරද; චජිත්වා (දනමුඛයෙහි) පරිත්‍යාගකොට; (මෙයින් පඤ්චමහාපරිත්‍යාගයදක්වත්) තිදසපාර මියො, සමතිස්පෙරුම්ද; අනුපමෙ, උපමාවිෂයාතික්‍රාන්තවූ: බොධි පක්ඛියධම්මෙ, ආර්යමාර්ගසාධනයකරණ බොධිපාක්‍ෂිකධර්මයන්ද, පූරෙත්වා, සම්පූර්ණකොට; විසුද්ධං, (රාගාදිපාපාපගමයෙන්) පිරිසිදුවූ; සකලගුණදදං, සියලුබුද්ධගුණදායකවූ; බොධිං, චතුර්මාර්ග ඥානාධිගමයට; හෙවත් සම්‍යක්සම්බොධියට; පත්වා, (ඥානගතියෙන්) පැමිණ; තිලොකෙ, ත්‍රිවිධලොකයෙහි; සෙට්ඨභූතො, (ඥානොත්තම ර්යයට පැමිණීමෙන්) ශ්‍රෙෂ්ඨවූයේ; දුක්ඛස්ස, සකලවෘත්තදුඃඛයාගේ; අන්තං, පර්යවසානය; කත්වා, කොට; කතසුභ, පෙරබුදුවරයන්සම යෙහි කළ පින්ඇති; ජනතං, ජනසමූහයා; දුක්ඛතො, සංසාරදුඃඛ යෙන්; හෙවත් වෘත්තමූලකදුඃඛහෙතුවෙන්, මොචයිත්ථ, මිදූසේක් ද; හෙවත් නිවණටපැමිණවූසේක්ද.

5. සමුපචිත, සම්‍යග්හෙතුක්‍රමයෙන් රැස්කළාවූ; සුභං, ඉෂ්ට විපාකදායකකුසල්ඇති; සබ්බලොක, සකලසත්වයන්ට; එකබන්ධුං,

---

* “බොධපක්ඛියධම්මෙ”–සමහර

# ජිනාලඞ්කාරය.

6. ජාතො යො නවමෙ ඛණෙ සුතධරො සීලෙන සුද්ධින්‍ද්‍රියො
සංසාරං භයතො භවක්ඛයකරං දිස්වා සිවං ඛෙමතො,
තංසම්පාපකමග්ගදෙසකමුනිං සම්පූජයන්තො තතො
බුද්ධානුස්සති භාවනාදිකමතො සම්පාදයෙ තං සිවං.

---

අසදෘශබුද්ධවූ; තං ජිනං (පස්මරුන්දිනූහෙයින් ජිනනම්වූ) ඒසර්වඥයා; අහං, (ගුණකරණාභිරතසිත්ඇති) මම; නත්වාන, (වාරත්‍රයෙන් සකසා) වැඳ; යෙන, යම්තථාගතයකුහා; කුසලමහිමතො, කුශලානුභාවයෙන්; තුල්‍යා, සදෘශවූවෙක්ද; උත්තමො, ජ්‍යෙෂ්ඨයෙක්ද; භූතලොකෙ, සත්වලොකයෙහි; නඅහු, නොවීද; තස්සඑව, ඒභගවත්හුගේම; සුවිම්හං, ඉතාවිස්මයවූ; සුවිපුලං, ඉතාබහුලවූ; අමලං, නිර්මලවූ; බොධිසම්භාරභූතං, සම්බොධිසමධිගමයට පිරිවහල්වූ; ඉදං, (ප්‍රස්තුතප්‍රස්තාවෙහි වක්ෂ්‍යමාණවූ) මේ; හෙතුං, දානශීලාදිහෙතුද; හෙත්වානුරූපං, තද්ධෙතුත්වට අනුකූලවූ; සුගතගතඵලං, සම්බුද්ධභාවයට පැමිණීමෙහි ඵලද; හෙවත් තථාගතයන්ගේ රූපකායධර්මකායපිළිබඳවූ ඵලද; භාසතො, කියන්නාවූ; මෙ, මාගේ වචනය; සුණොථ, අවික්ෂිප්තව ශ්‍රවණයකරව්, හෙවත් ශ්‍රොතවාරයෙන් ග්‍රහණය කොට උද්ග්‍රහණධාරණපරිප්‍රශ්නාදික්‍රමයෙන් ශික්ෂාව කරව්.

6. නවමෙ, (අෂ්ටදුෂ්ටක්ෂණයෙන් විනිර්මුක්තහෙයින්) නවවෙනිවූ; ඛණෙ, බුද්ධොත්පාදකාලයපවත්නාකල්හි; ජාතො, (ප්‍රතිරූපදෙශයෙක්හි) උපන්නාවූ; සො, යම් (සැදැහැවත් සම්‍යක්දෘෂ්ටික) අචාරකුලපුත්‍රයෙක්; සුතධරො, බහුශ්‍රුතවූයේ; සීලෙන, චතුපාරිසුද්ධිසීලයෙන්; සුද්ධින්ද්‍රියො, පාපප්‍රවාහයකරණලද චක්ෂුරාදිෂඩින්ද්‍රියයන්ඇත්තේද; නොහොත් ශ්‍රද්ධාදිපඤ්චෙන්ද්‍රියයන්ඇත්තේද; සො, හේකුලපුත්‍රතෙම; සංසාරං, (භවොත්පත්ත්‍යාදියසිකියනලද අනමතග්‍ර) සංසාරය; භයතො, භයවශයෙන්; දිස්වා, (ඥානචක්ෂුසෙන්) බලා; භවක්ඛයකරං, කර්මභවයවිනාශකරන්නාවූ; සිවං, නිර්වාණය; ඛෙමතො, නිර්භයවශයෙන්; හෙවත් ක්ෂෙමවශයෙන්; දිස්වා, දැක; තංසම්පාපක, ඒනිර්වාණයටපමුණුවන; මග්ග, (විදර්ශනාවසහිත ලොකොත්තර) මාර්ගය; දෙසක, යථාභූතවශයෙන්

සන්නසහිත.

7. එවං යථාවුත්තවිධිං කරොන්තො
මදප්පමාදා විරතො යතන්තො,
බුද්ධානුබුද්ධෙහි නිසෙවිතං තං
පප්පොතු නිබ්බාණවරං වරාහං.

**ඉති සාධුජනානන්දජනනිදානෙ ජිනාලඞ්කාරෙ**
**යොගාවචරදීපනීගාථා නිට්ඨිතා.**

---

8. බුද්ධො ති කො? බුද්ධගුණො ති කො? සො
අචින්තියාදිත්ත මුපාගතො යො,
අනඤ්ඤසාධාරණභූත මත්ථං
අකාසි කිං? සො කි? ම වොච බුද්ධො.

---

ප්‍රකාශකරන්නාවූ; මුනිං, සර්වඥයන්; තතො, ඒමාර්ගීදෙශකත්වය හෙතුකොටගෙණ; සම්පූජයන්තො, (ආමිෂපූජා ප්‍රතිපත්තිපූජා දෙකින්) මොනවට පූජාකරන්නේ, බුද්ධානුස්සති, “ඉතිපිසො භගවා” යනාදී බුද්ධානුස්මෘතිආදීවූ; භාවනාදිකමතො, භාවනාවන්ගේ ක්‍රමයෙන්; (විශුද්ධිමාර්ගයෙහිදක්වනලද ක්‍රමයෙන්ම භාවනා පිළිවෙළින් ගොස්) තං සිවං, (සමස්තෘෂ්ණාමූලික කර්මභවය විනාශකෙරේද) ඒනිර්වාණය; සම්පාදයෙ, සිඬකරන්නේය.

7. එවං, මෙසේ; යථාවුත්තවිධිං, යටදක්වූවිධිය; කරොන්තො, කරමින්; මදප්පමාද, ජිවිතමදාදිමදයෙන්හා සියලුකායික [illegible] බාධකවූ ප්‍රමාදයෙන්ද; නොහොත් මද, පුරුෂමදයෙන්ද; ප්‍රමාද, කාලක්ෂෙපීවූ ප්‍රමාදයෙන්ද; විරතො, නොරවූයේ; යතන්තො, (භවනිඃසරණයෙහි) උත්සාහවත්සිත් ඇත්තේ; බුද්ධානුබුද්ධෙහි, බුද්ධ, සම්‍යක්සම්බුද්ධප්‍රත්‍යෙකබුද්ධයන්විසින්හා; අනුබුද්ධෙහි, [illegible] අනුබුද්ධයන්විසින්ද; නිසෙවිතං, නිතරසෙවිතාලද; වරාහං, [illegible] ම්සැපඵලවත්තාවූ; තං නිබ්බාණවරං, ඒඋත්තමනිර්වාණයට; පප්පොතු, පැමිණේවා.

සාධුජන, හුදිජනයන්ට; ආනන්දජන, සන්තොෂගෙන [illegible], නිදානෙ, කාරණාවූ; ජිනාලඞ්කාරෙ, ජිනාලඞ්කාරනම් ප්‍රකරණ යෙහි; යොගාවචරදීපනීගාථා, යොගාවචරයන් ප්‍රකාශවූගාථාවෝ; ඉති, මෙතෙකින්; නිට්ඨිතා, නිමිහ.

8. (මෙසේ බුද්ධානුස්මෘතිප්‍රතිග්‍රාහකවූ යොගාවචරකුලපුත්‍රයනු දක්වා දැන් තමාවිසින් ප්‍රාරබ්ධවූ ජිනාලඞ්කාරනම් ප්‍රකරණයාගේ අභිධෙයවස්තුව මේයයි චොදනාශොධනයද කියා වස්තු නිරූපණය

ජි නා ල ඞ්කා ර ය.

9. විස්සජ්ජිස්සාමි තං සාධු අවිරුද්ධ මනාකුලං,
සංහරිත්වා යථාවුත්තානං මුනිනා ච මුනීහි ච.

10. විසුද්ධක්ඛන්ධසන්තානො බුද්ධො’ ති නියමො කතො,
ඛන්ධසන්තානසුද්ධී තු ගුණො’ ති නියමො කතො.

---

කොට බුද්ධගුණවර්ණනා කරණුකැමතිවූ බුද්ධරක්ෂිතාචාර්‍ය්‍යයෝ **“බුද්ධො තිකො බුද්ධගුණොති කොසො”** යනාදී ගාථාව කියත්) බුද්ධොඉති, (පළමුව **“යොලොකත්ථාය බුද්ධො”** යී වස්තුනිරූපණයකොට **“හෙතුං හෙත්වානුරූපං සුගතගත ඵලං භාසතො මෙ සුණොථ”** යී ඔහුසම්බන්ධවූම ගුණවර්ණනා වක් ප්‍රතිඥාකරණලද්දේද ඒප්‍රතිඥාවෙහි) බුද්ධයනු; කො, කවරෙක්ද? (සත්වයෙක්ද සංස්කාරයෙක්දයි මෙහි එක්ප්‍රශ්නයෙකි) (නැවතත්බුදුන්ගේ) යො, යම්ගුණයෙක්; අචින්තියාදිත්තං, අචින්ත්‍යබවට; (මෙහි ආදිශබ්දයෙන් ගනුලබන අවේද්‍යබවටද අතුල්‍යබවටද) උපාගතො, පැමිණියේද; සොබුද්ධගුණො, ඒබුදුගුණය: කොඉති, කවරෙක්දයි? (යනුඑක්ප්‍රශ්නයෙකි) (නැවතත්) සො බුද්ධො, හේ සම්‍යක්සම්බුද්ධතෙමේ; අනඤ්ඤසාධාරණ, අන්‍යයන්ට සාධාරණනුවූ; භූතං, (අතීතානාගතවර්තමානවශයෙන්) විද්‍යමානවූහෝ සත්‍යවූ; කිං අත්‍ථං, කිනම්වැඩක්; අකාසි, කළසේක්ද? (යනුඑක්ප්‍රශ්නයෙකි,) (නැවතත්) සො බුද්ධො, හේ සම්‍යක්සම්බුද්ධතෙමේ; අනඤ්ඤසාධාරණ, අන්‍යයන්ට සාධාරණනුවූ; භූතං, (අතීතානාගතවර්තමානවශයෙන්) විද්‍යමානවූහෝසත්‍යවූ; අත්‍ථං, වැඩපිණිසවූ; කිං, කවරඅවවාදනුශාසනාවක්; අවොච, වදාළසේක්ද? (යනු එක්ප්‍රශ්නයෙකි) (මේ ප්‍රශ්නචතුෂ්කයදුන්විසර්ජනය කටයුතුවන්නේය.)

9. මුනිනාච, සර්වඥයන්විසින්ද; මුනීහිච, තවශ්‍රාවකවූ ශාරිපුත්‍රමෞද්ගල්‍යායනාදීන්විසින්ද; යථාවුත්තානං, වදාළපරිද්දෙන්; සංහරිත්වා, හකුළා; හෙවත් පිඩුකොටගෙණ; තං, ඒප්‍රශ්නචතුෂ්කය; අවිරුද්ධං, විරුද්ධයක්නොවනාසේ; අනාකුලං, නිරවුල්කොට; සාධු, (අවිප්‍රතීතියසුගමවනපරිද්දෙන්) මනාකොට; විස්සජ්ජෙස්සාමි, (බුද්ධරක්ෂිතාචාර්‍ය්‍යවූ මම) විසඳන්නෙමි.

10. (මේ **“බුද්ධො ති කො බුද්ධගුණො ති කොසො”** යන්නෙන් ආරබ්ධගාථාවසම්බන්ධවූ විසර්ජනාවයි) විසුද්ධ, අතිපරිශුද්ධවූ; ඛන්ධසන්තානො, ස්කන්ධසමූදයෙන්සමුපෙතවූයේ; හෙවත්

## සන්නසහිත.

11. අකාසි කිච්චානි දිනෙසු පඤ්ච
පසාදයඤ්චිද්ධිබලෙන තෙන,
ජනාන 'සෙසං චරියානුකූලං
ඤත්වාන 'වොචා' නුසයප්පහානං.

12. බුද්ධොච යො බුද්ධගුණෙන සිද්ධො
යො කායවාචාහි තුලාව භූතො,
හෙතුං ඵලඤ්චාපි සමෙක්ඛිතාන
තථාගතං සප්පුරිසා භජන්තු.

**ඉති සාධුජනානන්දනනිදානෙ ජිනාලඞ්කාරෙ**
**වණ්ණසොධනීගාථා නිට්ඨිතා.**

---

(අනන්‍යසාධාරණවූ සවිඥප්තිකසප්‍රාතිහාර්‍ය්‍යරූපකායධර්මකායවශයෙන් පවත්නා) සන්තතිසමුදයෙන් යුක්තවූයේ; බුද්ධොඉති, බුද්ධයයි; නියමො, නියමය; හෙවත් නිශ්චය; කතො, කරණලද්දේය; ඛන්ධසන්තාන, ස්කන්ධසන්තතියගේ; සුද්ධී තු, පරිශුද්ධභාවයවනාහි; ගුණොඉති, (සර්වඥයන්පිළිබඳවූ) ගුණයයි; නියමො, නියමය; හෙවත් නිශ්චය; කතො, කරණලද්දේය.

11. (අටවෙනි ගාථාවෙහි "සො" යන්න මෙහි සම්බන්ධකටයුතුයි) සො, හේසම්‍යක්සම්බුද්ධතෙම; තෙනඉද්ධිබලෙන, (යම් ඉර්ද්ධිබලයකින් හෙවත් තමන්ගේ පුණ්‍යමහිමයෙන් ජනිතවූ රූපකාය ධර්මකායයන්ගේබලයකින් හෝ ඍද්ධිවිධාදිප්‍රාතිහාර්‍ය්‍යබලයකින් විද්‍යමානවේද) ඒඍද්ධිබලාදියෙන්; ජනානං, (චතුඃප්‍රමාණිකලොකසන්නිවාසයෙහි වසන) ජනයන්ගේ; (සිත්) පසාදයඤ්ච, පහදවමින්; (මෙහි "ච" ශබ්දයෙන් ලොකවිවරණප්‍රාතිහාර්‍ය්‍යාදියෙහිදී නිරයාදිය දුකීමෙන් බියපත්වූවන්ට භයසන්ත්‍රාසසංවෙගද උපදවමින් යනුදු සංගෘහීතයි) දිනෙසු, හැමදවස්හි; පඤ්චකිච්චානි, පඤ්චවිධකෘත්‍යයන්; හෙවත් (පූර්වභක්තකෘත්‍යය–පශ්චාද්භක්තකෘත්‍යය–පූර්වයාමකෘත්‍යය–මධ්‍යමයාමකෘත්‍යය–පශ්චිමයාමකෘත්‍යය යන) පඤ්චවිධබුද්ධකෘත්‍යයන්; අකාසි, කළසේක; ජනානං, (උද්ඝටිතඥ–විපඤ්චිතඥ–ඥෙය–යන භෙදයෙන් තුන්වැදෑරුම්වූ) ජනයන්ගේ; චරියානුකූලං, රාගාදිචරිතයන්ට අනුකූලවූවා; අසෙසං, නිරවශෙෂවශයෙන්; ඤත්වා, *(චෙතොපර්‍ය්‍යායඥානයෙන්)* දැන; අනුසයප්පහානං, රාගාදිකෙලශයන්ගේප්‍රහාණය; අවොච, වදාළසේක.

12. සොබුද්ධො, යම්සර්වඥයෙක්; බුද්ධගුණෙන, බුදුන්පිළිබඳ උත්තමගුණයන්ගෙන්; සිද්ධො, පරිනිෂ්පන්නවූයේද; යො

## ජි නා ල ඞ්කා ර ය.

13. අබ්භුග්ගතා යස්ස ගුණා අනන්තා
තිබුද්ධඛෙත්තෙ කදිවාකරො'ති,
ජානාති සො ලොකමිමං පරඤ්ච
සචෙතනඤ්චෙ'ව අචෙතනඤ්ච,
සකස්ස සන්තානගතං පරෙසං *
ව්‍යතීත මප්පත්තක මත්‍රභූතං.

---

යම්සර්වඥයෙක්; කායවාචාහි, කායවාක්සමාචාරකරණකොටගෙණ; තුලාඉවභූතො, තරාදියක්සේ සමානපැවතුම්ඇතිවූසේක්ද ("යත් තන්නිත්‍යසම්බන්ධම්" යී කීහෙයින් තස්ස යනු මිටසම්බන්ධකරණු) තස්ස, හේසර්වඥයන්සම්බන්ධවූ; හෙතුං, කාරණයන්ද; හෙවත් දානශීලාදිබුද්ධකාරකධර්මයන්ද; ඵලඤ්ච, බුද්ධත්වයටපැමිණීම්සඞ්ඛ්‍යාත ඵලයද; සමෙක්ඛියාන, (නුවනින්) බලා; සප්පුරිසා, සාධුජනයෝ; තථාගතං, පූර්වොක්තගුණොපෙතවූ තථාගතයන්; භජන්තු, (ආශ්‍රයපර්‍ය්‍යුපාසනාදිවිධියෙන්නිතර) සෙවනය කෙරෙත්වා.

සාධුජන, සුදිජනයන්ට; ආනන්දදාන, සන්තොෂගෙණදීමට; නිදානෙ, කාරණාවූ; ජිනාලඞ්කාරෙ, ජිනාලඞ්කාරනම්ප්‍රකරණයෙහි; වත්ථුසොධනීගාථා, වස්තුශොධනීගාථාවෝ; ඉති, මෙතෙකින්; නිට්ඨිතා, නිමිහ.

---

13. (මෙසේ වස්තුවිශොධනයද සකලලෝවැස්සන්විසින් පිදියයුතුබවද දක්වා දැන් ඥානවිෂයදක්වන්නෝ "අබ්භුග්ගතා" යනාදියකියත්) තිබුද්ධඛෙත්තෙ, ජාති-ආඥා-විෂය යන ත්‍රිවිධබුද්ධක්ෂෙත්‍රයෙහි; එකදිවාකරොඉති, අද්විතීයසූර්‍ය්‍යයෙක්යයි; යස්ස, යමක්හුගේ; අනන්තා, අපර්‍ය්‍යන්තවූ; ගුණා, ("ඉතිපිසොභගවා අරහං" යනාදි) බුද්ධගුණයෝ; අබ්භුග්ගතා, (භවාග්‍රයදක්වා) උස්වනැංගාහුද; සො, හෙතෙම; ව්‍යතීතං, ඉකුත්වූද; හෙවත් අතීතවූද; අප්පත්තකං, නොපැමිණියාවූද; හෙවත් අනාගතවූද; අත්‍රභූතං, මෙකල්හි පවත්නාවූද; හෙවත් වර්තමානවූද; (යනමේසියල්ලද) ඉමං ලොකං, මේලොකධාතුවද; පරංලොකඤ්ච, අන්‍යලොකධාතුන්ද; හෙවත් ඉමංලොකං, මේලොවද; පරංලොකඤ්ච, පරලොවද; සචෙතනඤ්ච, දිව්‍යමනුෂ්‍යාදිසචෙතනිකසත්වයන්ද; අචෙතනඤ්ච, පෘථිවිපර්වතාදි නිශ්චෙතනිකයන්ද; සකස්ස, තමාගේද; පරෙසං,

---

* "පරස්ස" සමහර.

### ස න් නා ස හි ත .

14. එවංවිධෙසු විසයෙසු හි යස්ස පඤ්ඤා
ධාවෙය්‍ය’ නාගතගතාවිගතෙසු තික්ඛා,
තස්සේව බොධි මුපයාතමනෙන නිච්චං
රත්තිං දිවං මුනිගුණා වත චින්තනීයා.

15. එවංවිධෙසු විසයෙසු හි යස්ස පඤ්ඤා
ධාවෙය්‍ය’ නාගතගතාවිගතෙසු තික්ඛා,
තස්සේව බොධි මුපයාතමනෙන නිච්චං
රත්තිං දිවං මුනිගුණා වත වන්දනීයා.

---

අන්‍යයන්ගේද; සන්තානගතකොට, සිත්හි අරමුණට පැමිණියාවූ පාරි විපශ්‍යාදිධර්මයන්ද; ජානාතිඑව, (ෂඩ්අසාධාරණඥානයකරණකොට ගෙණ පරොපදෙශරහිතව ස්වයංප්‍රතිභානයෙන්) දන්නාසේක්මැයි.

14. යස්සහි, යමක්හුගේවනාහි; තික්ඛා, තියුණුවූ; පඤ්ඤා, ප්‍රඥතොමෝ; හෙවත් නුවණ; අනාගත, අප්‍රාප්තවූද; ගත, ඉක්මියාවූද; අවිගතෙසු, පවත්නාවූද යනකාලත්‍රයසම්බන්ධවූ; එවංවිධෙසු, මෙබදුප්‍රකාරඇති; විසයෙසු, ඥෙයවස්තූන්හි; නිච්චං, අනවරතයෙන්; ධාවෙය්‍ය, දුවාද; හෙවත් ඥානගතිවශයෙන් යේද; තස්ස එව, උන්වහන්සේගේම; බොධිං, සම්‍යක්සම්බොධිඥානයකරා; උපයාත, එළවනලද; මනෙන, සිත්ඇත්තනුවිසින්; (බුද්ධත්වය මෙනෙහි කරන්නානුවිසිනැයිසේයි) මුනිගුණා, බුදුගුණ; රත්තිං දිවං, රෑදවල්; වත, එකාන්තයෙන්; චින්තනීයා, ("ඉතිපිසොභගවාඅරහං" යනාදිවශයෙන්) සිතියයුත්තාහ.

15. යස්සහි, යමක්හුගේවනාහි; තික්ඛා, තියුණුවූ; පඤ්ඤා, ප්‍රඥතොමෝ; අනාගත, අප්‍රාප්තවූද: ගත, ඉක්මියාවූද; අවිගතෙසු, පහනුවූද; හෙවත් පවත්නාවූද යනකාලත්‍රයෙහිවූ; එවංවිධෙසු, මෙබදුප්‍රකාරඇති; විසයෙසු, ඥෙයවස්තූන්හි; නිච්චං, සතතයෙන්; ධාවෙය්‍ය, දුවාද: හෙවත් ඥානගතිවශයෙන් පැමිණේද; තස්ස එව, උන්වහන්සේගේම; බොධිං, සම්‍යක්සම්බොධිඥානයකරා; උපයාත, එළවනලද; මනෙන, සිත්ඇත්තනුවිසින්;(බුද්ධත්වය මෙනෙහි කරන්නානුවිසින් යයි සේයි) මුනිගුණා, බුදුගුණ; රත්තිංදිවං, රෑදවල්දෙක්හි; වත, එකාන්තයෙන්; වන්දනීයා, වැන්දයුත්තාහ.

16. එවංවිධෙසු විසයෙසු හි යස්ස පඤ්ඤා
ධාවෙය්‍ය’ නාගතගතාවිගතෙසු තික්ඛා,
තස්සෙව බොධි මුපයාතමනෙන නිච්චං
රත්තිං දිවං මුනිගුණා වත පූජනීයා.

17. සද්ධෙය්‍යා තෙ විඤ්ඤෙය්‍යා තෙ
වන්දෙය්‍යා තෙ පූජෙය්‍යා තෙ,
බුද්ධාලොකාලොකෙ ලොකෙ
ජාතෙනෙ තං පත්තේනෙතන.

**ඉති සාධුජනානන්දනනිදානෙ ජිනාලඞ්කාරෙ**
**තිවිධබුද්ධඛෙත්තදීපනීගාථා නිට්ඨිතා.**

---

16. යස්සහි, යමක්හුගේවනාහි; තික්ඛා, තීක්ෂණවූ; පඤ්ඤා, ප්‍රඥාතොමෝ; අනාගත, නොපැමිණියාවූද; ගත, ඉක්මගියාවූද; අවිගතෙසු, පහනූවූද යනතුන්කල්හිවූ; එවංවිධෙසු, මෙබඳුප්‍රකාරඇති; විසයෙසු, ඥෙයවස්තූන්හි; නිච්චං, නිරන්තරයෙන්; ධාවෙය්‍ය, දුවාද; හෙවත් ඥානගතිවශයෙන් යේද; තස්සෙව, උන්වහන්සේගේම; බොධිං, සම්‍යක්සම්බොධිඥානයකරා; උපයාත, එළවනලද; මනෙන, සිත්ඇත්තහුවිසින්; (බුඩත්වය මෙනෙහිකරන්නහුවිසින් යයි සේයි) මුනිගුණා, බුදුගුණ; රත්තිං දිවං, රෑදාවල්; වත, එකාන්තයෙන්; පූජනීයා, පිදියයුත්තාහ.

17. බුද්ධාලොක, චරණාදිපඤ්චවිධබුද්ධතෙජසින්හෝ ෂඩ්වර්ණප්‍රභායෙන්; ආලොකෙ, උජ්ජ්වලිතවූ; ලොකෙ, ලෙව්හි; ජාතෙන, උපන්නාවූ; එතං, මේ යටදක්වූසම්බොධිසමධිගමය; පත්තේනෙන, පතන්නහුවිසින්; තෙ, ඒබුද්ධගුණයෝ; සද්ධෙය්‍යා, ඇදහියයුත්තාහ; තෙ, ඒබුද්ධගුණයෝ; විඤ්ඤෙය්‍යා, සිතියයුත්තාහ; තෙ, ඒබුද්ධගුණයෝ; පූජෙය්‍යා, පිදියයුත්තාහ.

සාධුජනහුදිජනයන්ට; ආනන්දන, සන්තොෂගෙණදීමට; නිදානෙ, කාරණාවූ; ජිනාලඞ්කාරෙ, ජිනාලඞ්කාරනම්ප්‍රකරණයෙහි; තිවිධබුද්ධඛෙත්තදීපනීගාථා, ත්‍රිවිධබුඩක්ෂෙත්‍රයන් ප්‍රකාශකවූ ගාථාවෝ; ඉති, මෙතෙකින්; නිට්ඨිතා, නිමියාහ.

## සන්නසහිත.

18\. අනන්තසන්තෙසු ච ලොකධාතුසු
එකො පි සබ්බෙ පි සමා න තෙන,
දිසාසු පුබ්බාදිසු චක්කවාලා
සහස්සසඞ්ඛ්‍යා පි අප්පමෙය්‍යා,
යෙ තෙසු දෙවා මනුජා ච බ්‍රහ්මා
එකජ්ඣ සඞ්ගම්ම' භිමන්ත්‍රයන්තා. *

19\. අනාදිකාලාගත නාමරූපිනං
යථාසකං හෙතුඵලත්තවුත්තිනං,
තබ්භාවභාවිත්ත මසම්භුණන්තා
නානාවිපල්ලාස මනුප්පවිට්ඨා.

---

18 (මෙසේ සර්වඥයන්වහන්සේගේ සකලධර්මයෙහි අප්‍රතිහත ඥානාචාරයදක්වා දූන් මුලුලෙව්හි එබඳුවූ අනිකක්හුගේ අභාවයදක්වන්නෝ "අනන්තසන්තෙසු" යනාදියකියත්) ලොකධාතුසු, අනෙක්ලෝදුහිද; හෙවත් එකිඑකීලොකධාතුවෙක්හිද; අනන්තසන්තෙසුව, අප්‍රමාණසත්‍වයන්විෂයෙහිද; තෙන, ඒභාග්‍යවතුන්හා සමවූ; එකොඅපි, එකදසත්‍වයෙක්, න, නැත්තේය; සබ්බෙඅපි, සියල්ලෝද; (එක්තැනකරුස්වූවාහු) න සමා, නොසමවෙත්; (මෙසේසංක්ෂෙපයෙන් භගවත්හු සියලුලොව අභිභවනයට පොහොසත්බැව්දක්වා දූන් නැවත එම ප්‍රකටකොට දක්වන්නෝ "දිසාසු" යනාදිය කියත්) පුබ්බාදිසු, පූර්වාදීවූ; දිසාසු, දිගුන්හි; සහස්සසඞ්ඛ්‍යාපි, දහස්ගණනිනුත්; අප්පමෙය්‍යා, පමණකළනොහැකිවූ; යෙචක්කවාලා, යම්චක්‍රවාටකෙනෙක්; (වෙද්ද) තෙසු, ඒචක්‍රවාටයන්හි; දෙවා, දෙවියෝද; මනුජා, මනුෂ්‍යයෝද; බ්‍රහ්මාව, බ්‍රහ්මයෝද; එකජ්ඣ, එක්තැනෙක්හි; සඞ්ගම්ම, එක්ව; ( "සච්චං සත්‍ථා පටිසන්ධිප්පච්චයාකාරමෙවච, දුද්දසා චතුරො ධම්මා දෙසෙතුඤ්ච සුදුක්කරං" යී වදාළහෙයින්සත්‍යාදි මෙකියනලදසතරදෙනාඅතුරෙන් එකෙකුදුදූනගන්ට නොහැකිව;) අභිමන්ත්‍රයන්තා, සිතන්නාහුහෝ කථාකරන්නාහුද.

19\. යථාසකං, සවකීයසවකීයපරිද්දෙන්; හෙතුඵලත්තවුත්තිනං, හෙතුඵලසම්බන්ධභාවයහෙතුකොටගෙණ පවත්නාවූ; අනාදිකාල, (පූර්වකෙළවරනොදක්කහැකිහෙයින්) අනාදිමත්කාලවශයෙන්; ආගත, (උත්පත්තිපරම්පරාවෙන්) පැවතආවාවූ; නාමරූපිනං,

---

* "අභිචින්තය න්තා" ඇතැම්.

ඥා නා ල ඞ්කා ර ය.

20. කම්මප්පවත්තිඤ්ච ඵලප්පවත්තිං
එකත්තනානත්තනිරීහධම්මතං,
විඤ්ඤත්තිසන්තානඝනෙන ඡන්නතො
සිවඤ්ජසං නො භණිතුං සමත්ථා.

21. එකො ව සො සන්තිකරො පභඞ්කරො
සඞ්ඛාය ඤෙය්‍යානි අසෙසිතානි,
තෙසං හි මජ්ඣෙ පරමාසභිං වදං
සිවඤ්ජසං දීපයිතුං සමත්ථො.

---

ස්කන්ධපඤ්චකයයි කියනලද නාමරූපීන්ගේ; තබ්භාව, අවිද්‍යාදි තත්තත්ප්‍රත්‍යයධර්මයන්ගේ විද්‍යමානභාවයෙන්; භාවිතත්තං, මතුඵලය උපදනාබව; හෙවත් මේආත්මභාවසඞ්ඛ්‍යාත නාමරූපපුඤ්ජයෙහිලා උත්කෘෂ්ටපරිච්ඡෙදයෙන් විඥානාදිඵලපඤ්චකයඋපදනාබව; අසම්බුණන්තා, (ඥානයෙන්) නොදතහෙන්නාහු; නානාවිපල්ලාසං, අනෙකවිධවිපර්‍යාසයන්ට; හෙවත් අනිත්‍ය–අසුඛ–අශුභ–අනාත්ම–යන මොවුන්කෙරෙහි නිත්‍ය–සුඛ–ශුභ–ආත්ම–වශයෙන් සංඥා–චිත්ත–දෘෂ්ටීන්ගේ දෙලොස්වැදෑරුම්විපර්‍යාසයන්ට; අනුප්පවිට්ඨා, නැවත නැවත ප්‍රවිෂ්ටවූවාහු.

20. කම්මප්පවත්තිඤ්ච, කර්මයාගේපැවැත්මද; ඵලප්පවත්තිඤ්ච, ඵලයාගේපැවැත්මද; එකත්ත, වෙන්නුවූබවද; නානත්ත, වෙන් වූබවද; නිරීහ, නිරුත්සාහබවද; ධම්මතං, ලොකස්වභාවද; (යන මෙකී සය) විඤ්ඤත්තිසන්තානඝනෙන–විඤ්ඤත්ති, කායවාග්විඥප්තිය; සන්තාන, සන්තතිප්‍රබන්ධාකාරය; ඝනෙන, සංඝාතභාවය; හෙවත් විනිර්භෝගකරන්ට නොහැකිබවය යනමෙයින්; ඡන්නතො, ප්‍රතිච්ඡාදනවූහෙයින්; සිවඤ්ජසං, නිර්වාණමාර්ගය; භණිතුං, ප්‍රකාශකරන්ට; නොසමත්ථා, අපොහොසත්වූහ. (මෙතැන්හිදී විස්තරදක්වනුසඳහා සියලුමඅභිධර්මපිටකය කියයුතුනමුදු එසේ කීමද නොහැකිවෙයි).

21. (මෙසේ නයසාගරය අලලා තද්භාවභාවිත්වසඞ්ඛ්‍යාත හෙතුඵලවශයෙන් පවත්නාවූ නාමරූපයන්ගේක්ෂණසන්තතිභඞ්ගයයි කියනලද අනිත්‍යලක්ෂණයද උදයව්‍යයපීඩනාකාරලක්ෂණවූදුඃඛයද අවශවර්ත්තිවූ අනාත්මලක්ෂණයද දක්වා භයසන්ත්‍රාස උපදවා, සසරබියෙන් බියපත්වූ දෙවිමිනිසුන්ට නිවන හා නිවන්මග දෙශ

සන්නසනිත.

22. සො ගොතමො සක්‍යසුතො මුනින්‍දො
සබ්බස්ස ලොකස්ස පදීපභූතො;
අනන්තසත්තෙ භවබන්‍ධනම්හා
මොචෙසි කාරුඤ්ඤබලා' නපෙක්ඛී.

23. යො සංසාරෙ සුදුක්ඛං අමතමිව භජං සබ්බසත්තෙ දයාය
තොසං දෙසග්ගිජාලං කමලසලිලතො සාධුනිබ්බාපයන්තො,
බුද්ධො බොධිඤ්ච පත්තො සකලමතිවසිප්පත්තසබ්බඤ්ඤුභාවං
තඤ්චාහං තස්ස බොධිං පමුදිතමනසා සබ්බකාලං නමාමි.

**ඉති සාධුජනානන්‍දනනිදානෙ ජිනාලඞ්කාරෙ**
**අසාධාරණඤාණදීපනීගාථා නිට්ඨිතා.**

---

නාකොට දූන් නිර්වාණය සම්පාදනයකරන්ට පොහොසත්වූවෙෝ මේමහාපුරුෂයාතෝමයයි දක්වන්නෝ "එකොවසො" යනාදිය කියත්) සනාථිකරො, නිවන්සිදුකරන්නාවූ; පභඞ්කරො, ධර්මාලොකයඇතිකරන්නාවූ; එකො, අවිතීයවූ; සොඑව, හේ මහාපුරුෂතෙම; ඤෙය්‍යානි, (සංස්කාරවිකාරලක්ෂණනිර්වාණප්‍රඥප්තිවශයෙන් පඤ්චවිධවූ) ඥෙයධර්මයන්; අසෙසිතානි, නිරවශෙෂවූවන්කොට; සඞ්ඛාය, දූන; තෙසංහි, ඒප්‍රමාණාතික්‍රාන්තදෙව්මිනිසුන්ගේ; මජ්ඣෙ, අතුරෙහි, පරං, උතුම්වූ; නොහොත් පරම, උතුම්වූ, ආසභිං. විශාරදබවට පැමිණිඅෂ්ටාඞ්ගසමන්විතමධුරධර්මදෙශනාව; වදං, (පරානුකම්පාවිධානයෙන්) තෙපලමින්; සිවඤ්ජසං, නිර්වාණමාර්ගය; දීපයිතුං, හෙළිකරන්ට; සමත්ථො, පොහොසත්වෙයි.

22. ගොතමො, (ගුරුගොත්‍රයෙන්) ගෞතමනම්වූ; සක්‍යසුතො, ශාක්‍යවංශොද්භූතවූසුදොවුන්මහරජහුගේපුත්‍රහෙයින්) ශාක්‍යපුත්‍රවූ; මුනින්‍දො; ෂඩ්විධමුනීන්ගෙන් ශ්‍රෙෂ්ඨවූ; සබ්බස්ස ලොකස්ස, සමස්තසත්ත්වයාට; පදීපභූතො, (ශරීරාලොකයෙන් ලොකත්‍රයෙහි අඳුරුදුරුකරණහෙයින් හා සද්ධර්මලොකයෙන් සත්ත්වසන්තානගතමොහාන්ධකාරවිධ්වංසනයකරණහෙයින්) පහනක්බඳුවූ; සො, ඒමහාපුරුෂතෙම: අනපෙක්ඛී, (තෘෂ්ණාවාසනාසහිතකොට නැසූහෙයින් දිව්‍යබ්‍රහ්මාදීන්ගෙන් චතුර්විධප්‍රත්‍යයන් ලැබීමෙහි හා සත්කාරගරුකාරාදීන් ලැබීමෙහි) අපෙක්ෂානැත්තේ; කාරුඤ්ඤබලා, කරුණාබලයෙන්; අනන්තසත්තෙ, නොයෙක්ප්‍රාණීන්; භවබන්‍ධනම්හා, සංසාරබන්‍ධනයෙන්; මොචෙසි, මිදූසේක.

23. යො, යමෙක්; සබ්බසත්තෙ, සකලසත්ත්වයන්කෙරෙහි; දයාය, කරුණාවෙන්; සංසාරෙ, භවචක්‍රයෙහි; සුදුක්ඛං, දුඃඛවූදුක්;

## ජි නා ල ඞ්කා ර ය.

24. වණ්ණෙථ තස්සී'ධ අනප්පකං ගුණං
න තෙන තුල්‍යො පරමො ච විජ්ජති,
කිං තං ගුණං තංසදිසෙන දින්නං
සයං කතං කින්නු අධිච්ච ලද්ධං.

25. නාධිච්ච ලද්ධං නච පුබ්බබුද්ධා
බ්‍රහ්මාදිනං සම්මුතියා බහූනනං,
සයං කතෙනෙ ව අනූපමෙන
දානාදිනා ලද්ධ මිදං විපාකං.

---

අමතංඉව, අමාරසයක්මෙන්; (සිතා) භජං, සෙවිනෝ; තෙසං, ඒ ඝනි ඝන්ගේ; දෙසගයිජාලං, (රාගවෙෂාදි) කෙලශාග්නිජාලාව; කමලසලි ලතො, (කම්පාවීම්ලක්‍ෂණවූ) කරුණානැමැතිජලයෙන් සාධු, මනාකොට; නිබ්බාපයතො, නිර්‍වාපණයකරමින්; සකල, සියලු; මනිවසි, සර්‍වඥයන්වහන්සේලාවිසින්; පත්ථ, පැමිණෙනලද; සබ්බඤ්ඤුභාවං, සර්‍වඥබවඇති; බොධිඤ්ච, බොධිවෘක්‍ෂයකරාද; පත්තො, පැමිණියේ; බුද්ධො, චතුඃසත්‍යාවබොධයකළසේක්ද; තං, ඒසර්‍වඥයන්ද, තස්ස, උන්වහන්සේගේ; බොධිඤ්ච, බොධියද; අහං, මම; පමුදිතමනසා, ප්‍රමොදයවූසිතින්; සබ්බකාලං, සෑමකල්හි; නමාමි, (සකසා) වදිමි.

සාධුජන, හුදිජනයන්ට; ආනන්‍දදන, සන්තොෂගෙණදීමට; නිදානෙ, කාරණාවූ; ජිනාලඞ්කාරෙ, ජිනාලඞ්කාරනම්ප්‍රකරණයෙහි; අසාධාරණඤාණදීපනී ගාථා, සර්‍වඅසාධාරණඥානයප්‍රකාශකවූ ගාථාවෝ; ඉති, මෙතෙකින්; නිට්ඨිතා, නිමිහ.

24. ඉධ, මෙලෙව්හි (උපන්නාවූ) තස්ස, ඒසර්‍වඥයන්ගේ; අනප්පකං, ඉතාබොහෝවූ; ගුණං, ගුණ; වණ්ණෙථ, කියව්; තෙන, උන්වහන්සේහා; තුල්‍යො, සමානවූවෙක්ද; පරමො ච, උත්තමයෙක්ද; නවිජ්ජති, නැති; කිං, කිමෙක්ද?; තංගුණං, ඒබුධගුණ; තංසදිසෙන, උන්වහන්සේවැනි අන්ක්බුදුවරයකුවිසින්; දින්නං, දෙනලද්දේද?; (නැතහොත්) සයං කතං, ස්වයඞ්කෘතද; හෙවත් ස්වකීයබාහුබලයෙන් රැස්කරණලද්දේද?; කින්නු, කිම?; (තොප අදහස්විචාරම්සි සේයි) අධිච්චලද්ධං, යථාසම්භවවශයෙන් ලද්දේද?; හෙවත් සියලුබුදුගුණඑක්ව හැසිරෙත්තෝ ඔහුදක ඔහුකෙරෙහි ප්‍රවිෂ්ටවූවාහුද?; නොහොත් දානශීලාදිහෙතුබලයකින් තොරම ලද්දේද?. (කවරහෙතුවකින්ලද්දේදැයි විචාරමි යනු භාවයි)

25. (මෙසේ විචාලකාරණය දක්වන්නෝ "නාධිච්චලද්ධං" යනාදිය කියත්) නාධිච්චලද්ධං, යථාසම්භවවශයෙනුදු නොලද්දේය;

## ස න් න ස හි ත.

26. ඉතො චතුන්නං හි අසඞ්ඛියානං
සතං සහස්සාන ’ධිකාන මත්ථකෙ,
කප්පෙ අතීතම්හි සුමෙධතාපසො
වෙහාසයං ගච්ඡති ඉද්ධියා තදා.

27. දීපඞ්කරො නාම ජිනො සසඞ්ඝො
රම්මං පුරං යාති විරොචමානො,
මනුස්සදෙවෙහ’භිපූජියන්තො
සහස්සරංසී විය භානුමා නභෙ.

---

හෙවත් සියලුබුදුගුණ එක්වහැසිරෙන්නෝ ඔහුද්‍ධක ඔහුකෙරෙහි ප්‍රවිෂ්ටදනුවූහ; නොහොත් දානශීලාදිහෙතුබලයෙන් තොරව නොලද්දේය; පුබ්බබුද්ධාව, පෙරබුදුවරයකුහෙන්ද; නලද්ධං, ලද්දේ නොවෙයි; බහුන්නං, බොහෝවූ; බ්‍රහ්මාදීනං, බ්‍රහ්මාදීන්ගේ; සම්මුතියා, සම්මතියක්හෙන්ද; හෙවත් මහාසම්මතරජුට මෙන් දෙව්බඹුන් එක්ව මේතෙම අපගේශාස්තෘය අපට අනුශාසනාකරණසේක්වයි කළසම්මුතියකිනුත්; නලද්ධං, නොලද්දේය; සයංකතෙනඑව, තමාවිසින්මකළාවූ; අනූපමෙන, (ශීල්දානාදියෙහිලා සමානකොටදක්විය හැකිවූ අනිකෙක්හුගේ අභාවයෙන්) උපමාරහිතවූ; දානාදිනා, දානශීලාදිසමතිස්පෙරුම්බෙලෙන්; ඉදං, මේබුද්ධභාවසඞ්ඛ්‍යාතවූ; විපාකං, ඵලය; හෙවත් බුදුගුණ; ලද්ධං, ලද්දේයි.

26. හි, එසේමැයි; ඉතො, මෙයින්; හෙවත් මේමහාභද්‍රකල්පයෙන්; සතංසහස්සානධිකානං, කල්පලක්ෂයක්අධිකකොටඇති; චතුන්නංඅසඞ්ඛියානං, සාරාසඞ්ඛ්‍යයක්හුගේ; හෙවත් සතරඅප්‍රමෙයකාලයක්හුගේ; මත්ථකෙ, ඔබ්බෙහි; අතීතම්හිකප්පෙ, ඉකුත්කපෙක්හි; සුමෙධතාපසො, (යහපත්නුවනඇතිහෙයින්) සුමෙධනම්වූතවුස්තෙම; ඉද්ධියා; ඍද්ධිමහිමයෙන්; වෙහාසයං, අහසින්; ගච්ඡති, යේ.

27. තදා, එකල්හි; දිපඞ්කරොනාම, (සද්ධර්මනැමැතිප්‍රදීපාලොකයකරණහෙයින්) දීපඞ්කරනම්වූ; ජිනො, සර්වඥතෙමේ; මනුස්සදෙවෙහි, දෙව්මිනිසුන්විසින්; අභිපූජියන්තො, මොනවට පුදනුලබන්නේ; නභෙ, අහස්හි; සහස්සරංසි, දහසක්රැස්ඇති; භානුමාවිය, බාලාකීයාමෙන්; විරොචමානො, (සවර්ණක්රැසින්) වොරදිමින්; සසඞ්ඝො, (සාරලක්ෂයක් ක්ෂීණාශ්‍රවභික්ෂූ) සඞ්ඝයාසහිතව; රම්මං පුරං, රම්මගම්නුවරට; යාති, වඩනාසේක.

## ස න් න ස හි ත .

28. තස්ස’ ඤ්ජසං කාතු මහුස්සහානං
බුද්ධො’ ති සුත්වා සුමනො පතීතො,
මම’ ජ්ජ දෙහං පති මස්ස * දත්වා
බුද්ධො අහම්ප’ ස්ස මනාගතෙ’ දිසො.

29. තස්මිං, ඤ්ජසෙ කන්දරකම්හි පඞ්කෙ
කත්වාන සෙතුං සයි සො සදෙහං,
බුද්ධො අයං ගච්ඡතු පිට්ඨියා මම
බොධිං සචෙ හෙස්සති මෙ අනාගතෙ.

30. උස්සීසක ’ ස්සා, ථ ජිනො හි තස්ස
අජ්ඣාසයං සිජ්ඣති’ මස්ස’ නාගතෙ,
ඤත්වාන ව්‍යාකාසි අසෙසතො හි
බුද්ධො අයං හෙස්සති’ නාගතෙසු.

---

28. තස්ස, උන්වහන්සේට; අඤ්ජසං, (වඩනා) මාර්ගය; කාතුං, (සම) කරන්ට; මහුස්සහානං, මහොත්සාහීජනයන්ගේ; බුද්ධො ඉති, බුද්ධය බුද්ධය යන; වචනං, (ශ්‍රේෂ්ඨ) තෙපුල; සුත්වා, අසා; සුමනො, (අප්‍රමාණකල්ප කෙළලක්ෂයකිනුදු දුර්ලභඉපදුම්ඇති උත්තම සත්වයක්හුගේ දැකීමහා නාමශ්‍රවණයද ලදිම්යි) සොම්නසට පැමිණියේ; පතීතො, බුද්ධාලම්බනප්‍රීතියෙන් හරිතවූයේ; අජ්ජ, අද; මම, මාසතුවූ; දෙහංපන, ශරීරයවනාහි; ඉමස්ස, මේවඩනාභගවත්හට; දත්වා, (දානවශයෙන්) පුදා; අහංපි, මමත්; අනාගතෙ, මතුපැමිණෙනකාලයෙහි; ඊදිසො, (ෂඩ්වර්ණඝනබුද්ධරශ්මින් විරාජමානවූ) මේබුදුන්වැනි; බුද්ධො, සර්වඥයෙක්; අස්සං, වන්නෙමි.

29. සචෙ, ඉදින්; මෙ, මට; අනාගතෙ, මතුකාලයෙහි; බොධි, සම්‍යක්සම්බොධිය; හෙස්සති, වන්නේනම්; අයංබුද්ධො, මේසර්වඥතෙම; මම, මාගේ; පිට්ඨියා; පිටමතුභාගයෙන්; ගච්ඡතු, වඩනාසේක්වයි; (සිතා) සො, ඒසුමෙධතාපසතෙම; තස්මිංඅඤ්ජසෙ, ඒ මාර්ගයෙහි; කන්දරකම්හි, දියෙන්බිඳුනු; පඞ්කෙ, මඩවලෙක්හි; සදෙහං, සියසිරුර; සෙතුංකත්වාන, හෙයක්මෙන්කොටලා; සයි, හොත්තේය.

30. අථ, ඉක්බිති; ජිනොහි, (ඒ) සර්වඥතෙමවනාහි; අස්ස, ඒ සුමෙධතාපසයන්ගේ; උස්සීසකෙ, හිස්දෙර; (වැඩසිට) ඉමස්ස, මේජටිලයාගේ; අජ්ඣාසයං, අදහස; අනාගතෙ, මතුපැමිණෙනකාලයෙහිදී; සිජ්ඣති, සිද්ධවන්නේයයි; ඤත්වාන, (සර්වඥතාඥානයෙන් බලා) දැන; අයං, මේජටිලතෙම; අනාගතෙසු, අනාගතයෙහි; බුද්ධොහෙස්සති, බුදුවන්නේයයි; අසෙසතොහි, නිරවශෙෂවශයෙන්ම; තස්ස, ඔහට; ව්‍යාකාසී, විවරණකළසේක.

---

* “පනමස්ස” සමහර.

## ජිනාලඞ්කාරය.

31. සුත්වාන පත්තො' ව' මතාභිසෙකං
ලද්ධං' ව බොධිං සමනුස්සරන්තො,
පූජෙත්ව යාතෙ මුනිදෙවමානුසෙ
උට්ඨාය සො සම්මසි පාරමී දස.

32. දළ්හං ගහෙත්වා සමතිංසපාරමී
සික්ඛත්තයඤ්ච' ස්ස ජිනස්ස සන්තිකෙ,
කාතුං සමත්ථො' පි භවස්ස පාරං
සත්තෙසු කාරුඤ්ඤවසා භවං ගතො.

33. හත්ථප්පත්තං බොධිං හිත්වා
අසෙසෙ සත්තෙ සන්තාරෙතුං,
වායාමෙන්තො සංසාරා යො
දුක්ඛප්පත්තො වන්දෙ' හං තං.

**ඉති සාධුජනානන්දජනනිදානෙ ජිනාලඞ්කාරෙ පුබ්බාභිනීහාරදීපනීගාථා නිට්ඨිතා.**

---

31. සො, ඒසුමෙධතාපසතෙම; සුත්වාන, (ඒවිවරණය) අසා; අමතාභිසෙකං, අමෘතාභිෂෙකයට; පත්තොඉව, පැමිණියකුමෙන්; (ප්‍රීතිහරිතශරීරඇත්තේ) බොධිං, සම්බොධිය; ලද්ධංඉව, ලද්දක් මෙන්; සමනුස්සරන්තො, සිහිපත්කරමින්; මුනිදෙවමානුසෙ, බුදුන් සහිතදෙවිමිනිසුන්; පූජෙත්වා, (සුමෙධතාපසයන් සුවඳමලින්) පුදා; යාතෙ, (රම්මගම්නුවරමගට) පිළිපන්කල්හි; උට්ඨාය, (හොත්තැනින්) නැගිට; දසපාරමී, දසපෙරුම්දම්; සම්මසි, (බුද්ධකාරකධර්මයෝ මූතුමූයයි) සිතින්සැලකූය.

32. අස්සජිනස්ස, ඒසර්වඥයන්ගේ; සන්තිකෙ, හමුවේදී; භවස්ස, භවවෘත්තයාගේ; පාරංකාතුං, කෙළවරකිරීමට; සමත්ථොඅපි, පොහොසත්නමුදු; සික්ඛත්තයං, අධිශීල–අධිචිත්ත–අධිප්‍රඥා–යන ශික්ෂාත්‍රයද; සමතිංසපාරමී, සමතිස්පෙරුම්ද; දළ්හංකත්වා, දෘඪවශයෙන් ඉටාගෙණ; සත්තෙසු, සත්වයන්කෙරෙහි; කාරුඤ්ඤවසා, කරුණාවශයෙන්; භවංගතො, සසරට පිවිසියේක.

33. යො, (කෘපාකූපාරාවතීර්ණවූ) යමෙක්; හත්ථප්පත්තං, (දීපඞ්කරබුදුන්හමුයෙහිදී තමන්) අතටපත්; බොධිං, ශ්‍රාවකබොධිය; හිත්වා, හැරලා; අසෙසෙසත්තෙ, සෙසුසත්වයන්; සංසාරා, භවයෙන්; සන්තාරෙතුං, එතරකරන්ට; හෙවත් නිවන්පමුණුවන්ට; වායාමෙන්තො; උත්සාහකරමින්; දුක්ඛප්පත්තො, දුකටපැමිණියේද; අහං, මම; තං, උන්වහන්සේ; වන්දෙ, වඳිමි.

සාධුජන, හුදීජනයන්ට; ආනන්දජන, සන්තොෂගෙණදීමට; නිදානෙ, කාරණාවූ; ජිනාලඞ්කාරෙ, ජිනාලඞ්කාරනම්ප්‍රකරණයෙහි; පුබ්බාභිනීහාරදීපනී, පූර්වාභිනීහාරකථාප්‍රකාශිතවූ; ගාථා, ගාථාවෝ; ඉති, මෙතෙකින්; නිට්ඨිතා, නිමියාහුය.

## ස න් න ස හි ත.

34. උප්පන්නානුප්පන්නකෙ සො ජිනවරමතුලෙ පූජයිත්වා අසෙසං
බුද්ධො එසො හි පොසො භවති නියමතො ව්‍යාකතො තෙහි තෙහි,
තෙසං තෙසං ජිනානං වචනමනුපමං පූජයිත්වා සිරෙන
තං තං දුක්ඛං සහිත්වා සකලගුණදදං පාරමිං පූරයිත්වා.

35. ඉති ගහිතමහන්තං බොධිසම්භාරසාරං
ගණනපථ මතීතං පාරමීපූරිතත්තං,
කරචරණසිරාදිං දින්නදානාතිදානං
පරහිතනිරතං තං බොධිසත්තං නමාමි.

**ඉති සාධුජනානන්දදානනිදානෙ ජිනාලඞ්කාරෙ**
**ව්‍යාකරණදීපනීගාථා නිට්ඨිතා.**

---

34. සො, ඒබෝසත්තෙම; උප්පන්නානුප්පන්නකෙ, (දීපඞ්කර බුදුන්ගෙන් විවරණලත්තැන්පටන්) උපනුපන්; ජිනවරමතුලෙ, අතුල්‍යවූබුදුවරයන්; අසෙසං, නිරවශෙෂකොට; හෙවත් ජිවිත යෙන්ද; පූජයිත්වා, පුදා; තෙහි තෙහි, ඒඒබුදුවරයන්විසින්; එසො පොසො හි, මේමහාපුරුෂතෙමවනාහි; නියමතො, ඒකාන්තයෙන්; බුද්ධො භවති, බුදුවන්නේයයි; ව්‍යාකතො, ප්‍රකාශකරණලද්දේ; (මෙහි "භවති" යි වර්ත්තමාන නිර්‍දේශය එකෙණෙහි වියයුත්තක් මෙන් ඒකාන්තයෙන් සිඩවනබැව්හඟවන පිණිසයි) තෙසං තෙසං ජිනානං, ඒඒබුදුවරයන්ගේ; තං තං, ඒ ඒ; අනුපමං, අසදෘශවූ; වචනං, විවරණතෙපුල; සිරෙන, සවකීයඋත්තමාඞ්ගයෙන්; පූජයිත්වා, පුදා; හෙවත් මුදුනෙන් පිළිගෙණ; තංතංදුක්ඛං, (ලාමකසත්වයන් විසින් නොඉවසුලැබූ) ඒඒදුක්; සහිත්වා, ඉවසා; සකලගුණදදං, සියලු බුඩගුණදායකවූ; පාරමිං, පාරමිතාවන්; පූරයිත්වා, පිරූසේක.

35. ඉති, මෙසේ; ගහිත, ගන්නාලද; මහන්ත, මහත්වූ; බොධිසම්භාරසාරං, බොධිසම්භාරයාගේහරඇති; ගණනපථං, සඞ්ඛ්‍යා පථය; අතීත, ඉක්මියාවූ; පාරමී, පාරමිතාවන්; පූරිත, පූරණලද, අත්තං, ආත්මභාවඇති; (අනන්තආත්මභාවයන්හිදී පූරණලදපාර මිතාඇති යනුභාවයි) කරචරණසිරාදි–කර, හස්තය; චරණ, පාදය; සිරාදි, ශීර්ෂාදිවූ; දින්න, දුනයකල; දාන, දන්හා; අතිදානං, ශ්‍රෙෂ්ඨ දානඇති; පරහිතනිරතං, පරාර්ථයෙහි නියැලිවූ; තංබොධිසත්තං, ඒබොධිසත්වයන්; නමාමි, වඳිමි.

සාධුජන, හුදිජනයන්ට; ආනන්දදාන, සන්තොෂගෙණදීමට; නිදානෙ, කාරණවූ; ජිනාලඞ්කාරෙ, ජිනාලඞ්කාරනම්ප්‍රකරණයෙහි; ව්‍යාකරණදීපනී, විවරණප්‍රකාශකිරීමසම්බන්ධවූ; ගාථා, ගාථාවෝ; ඉති, මෙතෙකින්; නිට්ඨිතා, නිමියාහුයි.

ජි නා ල ඞ්කා ර ය.

36. සො දුක්ඛිතජනදස්සනදුක්ඛිතෙනා
කාරුඤ්ඤමෙව ජනතාය අකාසි නිච්චං,
තෙසං හි මොචනමුපාය මිදන්ති ඤත්වා
තාදීපරාධ මපි අත්තනි රොපයී සො.

37. දානාදිනෙකවරපාරමිසාගරෙසු
ඔගාළ්හතාය’පි පදුට්ඨජනෙන දින්නං,
දුක්ඛං තථා අතිමහන්තතරම්පි කිඤ්චි
නා’ඤ්ඤාසි සත්තහිත මෙව ගවෙසයන්තො

38. ඡෙත්වාන සීසම්පි සකං දදන්තො
මංසං පචිත්වාන සයං දදන්තො,
සො චත්තගත්තො පණිධානකාලෙ
දුට්ඨස්ස කිං දුස්සති ඡෙදනෙන.

---

36. සො, ඒමහබෝසත්තෙම; දුක්ඛිතාන, දුකින්බෙදයට පත්වූ; ජනදස්සන, ජනයාදැකීමෙන්; දුක්ඛිතෙනා, දුකින් විෂාදබවටපැමිණියේ; හෙවත් දීනබවට පැමිණියේ; ජනතාය, ජනසමූහයාකෙරෙහි; නිච්චං, නිතොර; කාරුඤ්ඤංඑව, කරුණාවම; අකාසි, කළසේක; සො, හෙතෙමේ; තෙසං, ඒජනයන්ගේ; මොචන, මිදීමට; උපායංහි, සාධනහෙතුවචනාහි; ඉදංඉති, මේඉවසීමයයි; ඤත්වා, දැන; තාදී, අෂ්ටලොකධර්මයෙන් අකම්ප්‍යවූ සිත්ඇත්තේ; නොහොත් ඉෂ්ටානිෂ්ටයෙහි එකස්වරූපවූයේ; නොහොත් තාදීපරාධංඅපි, (ක්ෂාන්තිවාදිජාතකාදියෙහිමෙන් විරුඬජනයාකළඅත්පාසිඳීම්ආදි) එබඳුවූ අපරාධයන්පවා; අත්තනි, (මේදුක්මාපෙරකළඅකුසලින්නිපන් බැවින් මම්ම ඉවසමි සිතා) තමාකෙරෙහිම; රොපයී, ආරොපණය කළසේක; හෙවත් ඉවසීමෙන් නිවත්සාදුදෙමියි නුවණින් සැළකූය.

37. තථා, එසේම; සො, ඒමහබෝසත්තෙම; දානාදි, දානශීලාදිවූ; අනෙක, නොයෙක්; වර, උතුම්වූ; පාරමිසාගරෙසු, පාරමිතාසාගරයන්හි; ඔගාළ්හතායඅපි, බැසගත්බැවිනුදු; පදුට්ඨජනෙන, වෛරීජනයාවිසින්; දින්නං, (අත්පාසිඳීම්ආදියෙන්) දෙනලැබූ; අතිමහන්තතරං, ඉතාමහත්වූ; කිඤ්චිදුක්ඛංඅපි, කිසිදුකක්ද; සත්තහිතංඑව, සත්ත්වයන්ට හිතසාධනයක්ම; ගවෙසයන්තො, සොයන්නේ; නඅඤ්ඤාසි, (දුක්වශයෙන්) නොදත්තේය.

38. සො, ඒමහබෝසත්තෙම; පණිධානකාලෙ, බොධිසම්භරණකාලයෙහි; සයං, තෙමේ; සකංසීසංඅපි, සියහිසපවා; ඡෙත්වාන, සිඳ; දදන්තො, දෙන්නේ; සකංමංසං, ස්වකීයමාංසයපවා; පචිත්වාන, පිස; දදන්තො, දානයකරන්නේ; චත්තගත්තො, (බුදුබවපතාඅන්හට) පිදූශරීරඇත්තේ; ඡෙදනෙන, (ක්ෂාන්තිවාදිජාතකාදියෙහි

### ස න් න ස හි ත .

39. එවං අනන්තාමපි ජාතිසතෙසු දුක්ඛං
පත්වාන සත්තහිත මෙව ගවෙසයන්තො,
දීපඞ්කරුග්ගහිතසීලසමාධිපඤ්ඤො
පාලෙසි යාව සකබොධිතලෙ සුතිට්ඨා.

40. යද'භිනීහාර මකා සුමෙධො
යදා ච මද්දිං අදදා සිවින්දො,
එත්ථන්තරෙ ජාතිසු කිඤ්චි පෙකං
නිරත්ථකං නො අගමාසි තස්ස.

41. මහාසමුද්දෙ ජලබින්දුතො 'පි
තදන්තරෙ ජාතිඅනප්පකා' ව,
නිරන්තරං පූරිතපාරමීනං
කථං පමාණං උපමා කුහිං වා.

---

උක්තප්‍රකාරයෙන් හස්තපාදදීන්ගේ) සිඳීම හෙතුකොටගෙණ; දුට්ඨස්ස, (කලාබුරාජාදි) සතුරුජනයාට; කිංදුස්සති, කිමදූෂ්‍යවිද?; දූෂ්‍යනුවූයේමැයි.

39. එවං, මෙසේ; ජාතිසතෙසු, සියගණන්ජාතිවලැ; අනන්තං, අප්‍රමාණවූ; දුක්ඛං, දුකට; පත්වානඅපි, පැමිණත්; සත්තහිතංඑව, ලොකාර්ථසිද්ධියක්ම; ගවෙසයන්තො, සොයන්නේ; දීපඞ්කර, දීපඞ්කාරනම්සර්වඥයන්ගෙන්; උග්ගහිත, ඉගණගන්නාලද; සීලසමාධිපඤ්ඤා, අධිශීල–අධිචිත්ත–අධිප්‍රඥසඞ්ඛ්‍යාතශික්ෂාවන්; සකබොධිතලෙ, තමාගේ බොධිපර්‍ය්‍යඞ්කයෙහි; යාවසුතිට්ඨා, වැඩසිටීමදක්වා; පාලෙසි, (වාලධියරක්නාසෙමරකුමෙන් මනාව) රක්ෂාකළසේක;

40. සො, ඒමහබෝසත්තෙම; යදා, යම්කලෙක්හි; සුමෙධො, සුමෙධනම්තවුස්ව; අභිනීහාරං, (දීපඞ්කරසර්වඥයන්හමුවෙහිදී) බුදුබවපැතීම; අකා, කළසේක්ද; යදාච, යම්කලකවනාහි; සිවින්දො, සිවිරජව; මද්දිං, මද්‍රිදෙවිය; අදදා, (බමුණුවෙස්ගෙණආසක්දෙව්ඳුහට) දිනීද; එත්ථන්තරෙ, මේඅතර; ජාතිසු, උපනුපන්ජාතිඅතුරෙන්; කිඤ්චි, මදවූද; එකංඅපි, එකදජාතියෙක්; තස්ස, උන්වහන්සේට; නිරත්ථකං, ව්‍යර්ථව; හෙවත් වැඩනැතුව; නොඅගමාසි, නොගියේය; (පාරමිතාපිරීමෙන් ඵලසහිතවම ගියේයයනුභාවයි).

41. තදන්තරෙ, (අභිනීහාරයපටන් මද්‍රිදෙවියගේ දීමදක්වා) ඒඅතරෙහි; ජාති, උත්පත්තීහුතොමෝ; මහාසමුද්දෙ, සතරමහාසාගරයෙහි; ජලබින්දුතොඅපි, දියබින්දුවලටත්වඩා; අනප්පකාඑව, ඉතා බොහෝමැයි; (මේසේඇතිකල්හි) නිරන්තරං, නිරතුරුව; පූරිත–

ජිනාලඞ්කාරය.

42. යො මග්ගපස්සෙ මධුරම්බබීජං
ඡායාඵලත්ථාය මහාජනානං,
රොපෙති තස්මිං හි ඛණෙ'ව තෙන
ඡායාඵලෙ පුඤ්ඤ මලද්ධ මුද්ධං.

43. තථෙ'ව සංසාරපථෙ ජනානං
හිතාය' චත්ථාන' භිරොපිතක්ඛණෙ,
සිද්ධං' ච පුඤ්ඤං පරි තස්ස තස්මිං
ධනඞ්ගජීවම්පි හරන්ති යෙ යෙ.

---

පාරමීනං, පිරූපාරමිතාවන්ගේ; පමාණං, ප්‍රමාණයක්හෝ; කථං? කෙසේකළහැකිද?; (නොහැක්කේමැයි;) උපමාවා, සමානවස්තු දක්වීමක්හෝ; කුහිං, කොහිඇද්ද? (නැත්තේමැයි).

42. (මෙසේ භගවත්හුගේ පාරමිතාසාගරයෙහි අප්‍රමෙයභාවය දක්වා දූන් උපමාවක්නෙණහැරදක්වීමෙන් එයසමර්ථනය කරන්නෝ "යොමග්ගපස්සෙ" යනාදිය කියත්) යො, යම්ද්‍රව්‍යජාතිකපුරුෂයෙක්; මග්ගපස්සෙ, මාවත්පසෙක්හි; මහාජනානං, (මගයනඑන) මහාජනයන්ට; ඡායාඵලත්ථාය, සෙවනෙහිහාගෙඩිවලප්‍රයොජනය පිණිස; මධුරම්බබීජං, මිහිරිඅඹඇටයක්; රොපෙති, පැළකෙරේද; උද්ධං, රොපණයකළාටපසු; හෙවත් මල්පලගෙණවඩිනාදිපසු; ඡායාඵලෙ, සෙවනෙහි හා ගෙඩිවල; හෙවත් ඡායාඵලපරිභොගය හෙතුකොටගෙණලැබියයුතුවූ; පුඤ්ඤං, කුසලය; තස්මිංඛණෙඑව, ඒඇසිල්ලෙහිම; හෙවත් ආම්‍රබීජය රොපණය කළකෙණෙහිම; තෙන, ඒබීජරොපකපුරුෂයාවිසින්; අලද්ධං, (යම්සේ) ලද්දේද.

43. තථාඑව, එසේම; සංසාරපථෙ, සසරකතරම්ගෙහි; ජනානං, (චුතිඋත්පත්තිවශයෙන් ගමනාගමනකරන්නාවූ) සත්ත්වයන්ට; හිතායච, ලෞකිකලොකොත්තරහිතකරණුපිණිසද; (මෙහි "ච" ශබ්දයෙන් "සුඛාය" යනුසංගෘහීතහෙයින් ලෞකිකලොකොත්තර සුව උපදවනුපිණිසද) අත්ථානං. ආභාමිය; අභිරොපිතක්ඛණෙ, (දීපඞ්කරපාදයන්හමුවෙහි බුද්ධබීජයක්කොට) රොපණයකළකෙණෙහිම; උපරි, මත්තෙහි; (විවරණලත්තැන්පටන් වෙසතුරුඅත්බව දක්වා මේඅතර) ධන, ධනද; අඞ්ග, ශරීරාවයවද; ජීවංඅපි, ජීවිතයද යනමේසියල්ල; යෙයෙ, යම්යම්කෙනෙක්; හරන්ති, (දානවශයෙන්) හැරගණිද්ද; තස්මිං, ඒවස්තුපරිත්‍යාගයෙහි හා ජීවිත පරිත්‍යාගයෙහි; පුඤ්ඤං, කුසල්; තස්ස, ඒමහබෝසත්හට; සිද්ධංඑව, (එකෙණෙහිම) පරිනිෂ්පන්නමැයි.

## ජිනාලඞ්කාරය.

44. සො සාගරෙ ජලධිකං රුධිරං අදාසි
භූමිං පරාජිය සමංස මදාසි දානං,
මෙරුප්පමාණමධිකඤ්ච සමොළිසීසං
ඛෙ තාරකාධිකතරං නයනං අදාසි.

45. බුද්ධාලොකාලොකෙ ලොකෙ
ජාතො සත්තො කො, නුත්තමතො,
බුද්ධං බුද්ධං ඔඝා තිණ්ණං
සද්ධො පඤ්ඤො කො නො වන්දෙ.

**ඉති සාධුජනානන්දජනනිදානෙ ජිනාලඞ්කාරෙ බොධිසම්භාර දීපනිගාථා නිට්ඨිතා.**

---

46. ගම්භීරාපාරදානාදි සාගරෙසු හි ථාමසා,
තරන්තො මද්දිදානෙන නිට්ඨාපෙන්තො පාරමී.

---

44. සො, ඒමහබෝසත්තෙම; සාගරෙ, සතරමහාසාගරයෙහි; ජලධිකං, දියටත්වැඩිවූ; රුධිරං, ලේ; අදාසි, දුන්සේක; භූමිං, (යොදුන් දෙලක්‍ෂසතළිස්දහසක්පමණඝනවූ) පෘථිවිය; පරාජිය, පරදවා; සමංසං, සවකීයමාංස; දානං, දන්වශයෙන්; අදාසි, දුන්සේක. මෙරුප්පමාණමධිකං, (යොදුන්සැටඅටලක්‍ෂයක්පමණ උස්වූ) මහාමෙරුපර්වතයාගේ උසප්‍රමාණයටත්වැඩිකොට; සමොළිසීසං, ඔටුනුසහිතවූහිස්; අදාසි, දුන්සේක; ඛෙ, අහස්හි; තාරකාධිකතරං, තරුවැලටත්වැඩිවූ; නයනං, නෙත්‍රයන්; අදාසි, දුන්සේක.

45. බුද්ධාලොක, චරණාදිපචවිධබුද්ධතෙජසින්; හෝ ෂඩ්වර්ණ ප්‍රභාවෙන්; ආලොකෙ, දීප්තිමත්වූ; ලොකෙ, (ස්වර්ගමනුෂ්‍යපාතාලසඞ්ඛ්‍යාතත්‍රිවිධ) ලොකයෙහි; ජාතො, උපන්නාවූ; අනුත්තමතො, උතුම්වූ; කොසත්තො, කවරසත්වයෙක්ද; සද්ධො, සැදැහැවත්වූ; පඤ්ඤො, ප්‍රඥාසම්පන්නවූ; කොසත්තො, කවරසත්වයෙක්ද; ඔඝා, (කාම-භව-දෘෂ්ටි-අවිද්‍යාසඞ්ඛ්‍යාත) චතුරොඝයෙන්; තිණ්ණං, එතරවූ; බුද්ධං, චතුඃසත්‍යාවබොධයකළාවූ; බුද්ධං, සර්වඥයා; නොවන්දෙ, නොවදින්නේද; (වදින්නේමැයි).

සාධුජන, සුදිජනයන්ට; ආනන්දජනන, සන්තොෂගෙණදීමට; නිදානෙ, කාරණාවූ; ජිනාලඞ්කාරෙ, ජිනාලඞ්කාරනම්ප්‍රකරණයෙහි; බොධිසම්භාරදීපනී, බොධිසම්භාරයප්‍රකාශවූ; ගාථා, ගාථාවෝ; ඉති, මෙතෙකින්; නිට්ඨිතා, නිමියාහ.

---

46. ගම්භීර, ගැඹුරුවූ; අපාර, එතරනොදක්කහැකි; දානාදි සාගරෙසුහි, දානාදිසාගරයෙහි; ථාමසා, වීර්‍යයෙන්; තරන්තො,

**සන්නසහිත.**

47. වසනෙතා තුසිතෙ කායෙ බොධිපරිපාක මාගමා,
ආයාචනාය දෙවානං මාතුගබ්භ මුපාගමි.

48. සතො' ච සම්පජානො' ච මාතුකුච්ඡිම්හි ඔක්කමි,
තස්ස ඔක්කන්තික්ඛණියා සබ්බා දසසහස්සී පකම්පථ.

49. තතො පුබ්බනිමිත්තානි බත්තිංසානි තදා සියුං*
තුට්ඨහට්ඨා' ච සාමාතා පුත්තං පස්සති කුච්ඡියං.

---

ජිතත්තේ; මඳිදුනෙන, (බුදුබවපතා) මද්‍රිදෙවියදීමෙන්; පාරමී, (සමත්‍රිංසත්පාරමිතාධර්මයන්; නිට්ඨාපෙත්වාන, අවසන්කොට.

47. බොධිපරිපාකං, සම්බොධිඥානයාගේ මුහුකිරීම; ආගමා, පැමිණෙනතෙක්; තුසිතෙ කායෙ, තුසීදෙව්ලොව; වසනෙතා, වස නුයේ; දෙවානං, දසදහසක්සක්වළින් රැස්වූ දෙව්බඹුන්ගේ; ආයා චනාය, "කාලොයං තෙ මහාවීර" යනාදීන්කළ) අයදමින්; මාතු ගබ්භං, මාතෘගර්භයට; උපාගමි, (ප්‍රතිසන්ධිග්‍රහණවශයෙන්) එළඹිසේක;

48. සො, ඒමහබෝසත්තෙම; සතොඑව, සිහිඇත්තේම; සම්ප ජානොඑව, සමෘතිසම්ප්‍රජඥයෙන්යුක්තවූයේම; මාතුකුච්ඡිම්හි, මව් කුසෙහි; ඔක්කාමි, පිළිසිඳගත්සේක; තස්ස, ඒමහබෝසත්හුගේ; ඔක්කන්තික්ඛණියා, ගර්භාවක්‍රාන්තියහාසමග; සබ්බා, සියලු; දසසහස්සී, දසදහ සක්සක්වළ; පකම්පථ, (ප්‍රචණ්ඩවාතයෙන්සැලුනුමහත්රුකක්මෙන්) සැලීය.

49. තදා, එකල්හි; තතො, ඒප්‍රතිසන්ධිග්‍රහණයට ඉක්බිති; පුබ්බනිමිත්තානි, පූර්වනිමිති; බත්තිංසානි, දෙතිසෙක්; සියුං, පහළ වූහ; සාමාතා, ඒමව්තොමෝ; කුච්ඡියං, තමාකුසහොත්; පුත්තං, පුත්‍රයා; තුට්ඨහට්ඨාඑව, තුටුපහටුවූවාම; පස්සති, දකී.

---

* පුරාතනකවිවරයකුවිසින් දෙතිස්පූර්වනිමිති දැක්වීමසඳහා ර චනාකරණලදගාථාපඞ්ක්තියක් මීට සම්බන්ධකොට යොදනුලැ බේ, පොතවිසාලවනබැවින් මේවර මීට සන්නයක් නොයෙදීමු.

1. අවාදිතා කෙන චී චම්මනද්ධා සුභපොක්ඛරා දුන්දුභියො ච වීණා'
අඝට්ටිතානා' භරණානි තස්මිං ඛණෙ සමන්තා මධුරා රවිංසු.

2. ජිජ්ජිංසු සබ්බසො ච බන්ධනානි සයං විගච්ඡිංසු ච සබ්බරොගා,
රූපානි පස්සිංසු ච ජාතිඅන්ධා සද්දං සමන්තා බධිරා සුණිංසු.

3. අනුස්සතිං ජාතිජලා, මනුස්සා ලභිංසු යානං පදසා ච පඞ්ගුලා,
විදෙසයාතා සය මෙව නාවා සපට්ටනං සීඝ මුපාගමිංසු.

4. අකාසගං භූමිගතඤ්ච සබ්බං සයං සමන්තා රතනං විරොචි,
නිබ්බායි ඝොරෙ නිරයෙ හුතාසො නදීසු තොයම්පි ච නප්පවත්ති.

## ස ත් න ස හි ත.

50. ගබ්භොක්කන්තිං යස්ස’ වං ච
කො නාම’ ඤ්ඤො තුල්‍යො තෙන,
තස්මා නිච්චං සක්කච්චං තං
වන්දෙ බොධිං පත්ථෙන්තො’ හං.

**ඉති සාධුජනානන්දජනනිදානෙ ජිනාලඞ්කාරෙ ගබ්භොක්කන්තිදීපනීගාථා නිට්ඨිතා.**

---

50. ච, ඉදින්; යස්ස, යමක්හුගේ; ගබ්භොක්කන්ති, ගර්භාවක්‍රාන්තිය; එවං, මේ උක්තප්‍රකාරයෙන්; (වීනම්) තෙන, ඔහුහා; තුල්‍යො, සදෘශවූ; අඤ්ඤො, අනික්; කොනාම, කවරෙක්නම්; (වන්නේද, නොවන්නේමැයි) තස්මා, එහෙයින්; බොධිං, සම්‍යක් සම්බොධිය; පත්ථෙන්තො, පතන්නාවූ; අහං, මම; නිච්චං, සතතයෙන්; තං, උන්වහන්සේ; සක්කච්චං, සකසා; වන්දෙ, වඳිමි.

සාධුජන, හුදීජනයන්ට; ආනන්දජනන, සන්තොෂගෙණදීමට; නිදානෙ, කාරණවූ; ජිනාලඞ්කාරෙ, ජිනාලඞ්කාරනම් ප්‍රකරණයෙහි; ගබ්භොක්කන්තිදීපනී, ගර්භාවක්‍රාන්තිය ප්‍රකාශවූ; ගාථා; ගාථාවෝ; ඉති, මෙතෙකින්; නිට්ඨිතා, නිමියාහ.

---

5. ලොකන්තරෙ දුක්ඛනිරන්තරෙ’ පි පභා උළාරා විපුලා අහොසි,
තථා තදා සන්ත තරඞ්ගමාලො මහාසමුද්දො මධුරොදකො’ පි.

6. න වායි වාතො ඵරුසො ඛරො වා සමුල්ලපුප්ඵා තරවො අහෙසුං,
විරොචි චන්දො අධිකං සතාරො න චාතිඋණ්හො සුරියො අහොසි.

7. ඛගා නභම්හා පි ච රුක්ඛතො ච හට්ඨා’ ච හෙට්ඨා පඨවිං භජිංසු,
මහා චතුද්දීපගතො ච මෙඝො පවස්සි තොයං මධුරං සමන්තා.

8. ඨත්වා’ ච දිබ්බෙ භවනෙ සකස්මිං පසන්නචිත්තා පන දෙවතායො,
නච්චිංසු ගායිංසු ච වාදයිංසු සෙළිංසු කෙළිං අකරිංසු චෙව.

9. සයං කිරද්වාරමහාකවාටා ඛණෙ ච තස්මිං විවරා අහෙසුං,
මහාජනො නෙව ඛුදපිපාසා පීළෙසි ලොකං කිර කඤ්චි කඤ්චි.

10. යෙ නිච්චවෙරා පන පාණිසඞ්ඝා තෙ මෙත්තචිත්තං පරමං ලභිංසු,
කාකා උලූකෙහි චරිංසු සද්ධිං සොණා වරාහෙහි අකංසු කෙළිං.

11. ඝොරා’ පි සප්පා නසුඛොපසප්පා කීළිංසු කාමං නකුලෙහි සද්ධිං,
නච්චිංසු මජ්ජාරසිරෙ සසූතා විස්සත්ථචිත්තා ඝරමූසිකා ච.

12. බුද්ධන්තරෙනා’ පි අලද්ධතොයෙ පිසාචලොකෙ විගතා පිපාසා,
ඛුජ්ජා අහෙසුං සමචාරුකායා මූගා ච වාචං මධුරං ලපිංසු.

## ජි නා ල ඞ්කා ර ය.

51. සා පුණ්ණගබ්භා දසමාසතො පරං
ගන්ත්වාන ඵුල්ලං වරලුම්බිනීවනං,
ඨිතා ගහෙත්වා වරසාල සාඛං
විජායි තං පුත්තවරං සුඛෙන.
52. තදා සහස්සී දසලොකධාතුසු
දෙවාච නාගා අසුරා ච යක්ඛා,
නානාදිසා මඞ්ගල චක්කවාළං
සුමඞ්ගලා මඞ්ගල මාගමිංසු.
53. අනෙකසාඛඤ්ච සහස්සමණ්ඩලං
ඡත්තං මරූ ධාරයු මන්තලික්ඛෙ,
සුවණ්ණදණ්ඩා ච විජෙන්ති චාමරා
ගජ්ජිංසු භෙරී ච නදිංසු සඞ්ඛා.

---

51. සා, ඒමායාබිසව්; පුණ්ණගබ්භා, පිරුණුගැබ්ඇත්තී; දස මාසතො පරං, දසමසකින් මත්තෙහි; හෙවත් දසඑකඩමසකින්; ඵුල්ලං, විකසිතවූ; වර, උතුම්වූ; ලුම්බිනීවනං, ලුම්බිනීනම් උද්‍යානයට; ගන්ත්වාන, ගොස්; වර, උතුම්වූ; සාලසාඛං, (මලින් සැදුනු) සල්අත්තක්; ගහෙත්වා, (සුරතින් අල්වා) ගෙණ; ඨිතා, සිටියා; පුත්තවරං, උත්තම පුත්‍රවූ; තං, ඒබොධිසත්ත්වයන්; සුඛෙන, සුවසේ; විජායී, වැදූ.

52. තදා, එකල්හී; දසසහස්සීලොකධාතුසු, දසදහසක්ලෝදෑහි; දෙවාච, දෙවියෝද; නාගා, නාගයෝද; අසුරාච, අසුරයෝද; යක්ඛා, යක්ෂයෝද; සුමඞ්ගලා, (අද මහබෝසත් උපදනාදිනය ඔහු සම්බන්ධවූ උත්පත්තිමඞ්ගල්‍යය කරම්හයි රුස්වූහෙයින්) ශොභන මඞ්ගල්‍යඇත්තෝ; මඞ්ගලං, මඞ්ගල්‍යවස්තූන්; (රැගෙණ) නානා දිසා, නොයෙක් දිගින්; මඞ්ගලචක්කවාළං, (මේ) මගුල්සක්වලට; ආගමිංසු, (වහවහා) පැමිණියාහුයි.

53. මරූ, (අදෘශ්‍යමානස්වරූපවූ) දෙවියෝ; අන්තලික්ඛෙ, අහසෙහි; (සිට) අනෙකසාඛං, නොයෙක් පක්ෂාන්තරඇති; සහස්ස මණ්ඩලං, දහස්ගණන්මඬුළුඇති; ඡත්තං, ශ්වෙතච්ඡත්‍රයන්; ධාරයුං, (මහබෝසතානන්ගේ හිසමත්තුභාගයෙහි) දැරූහ; සුවණ්ණ

---

13. පසන්නචිත්තා පන පාණිසංඝා තදඤ්ඤමඤ්ඤං පියමා ලපිංසු,
අස්සා ච හෙසිංසු පහට්ඨචිත්තා ගජ්ජිංසු මත්තා වරවාරණා ච.

14. සුරභිචන්දන චුණ්ණ සමාකුලා
කුසුමකුඞ්කුමධූප සුගන්ධිනී,
විවිධචාරුමහද්ධජ මාලිනී
දසසහස්සී අහොසි සමන්තතො.

## ස ත් ත ස හි ත.

54. මලෙන කෙනා'පි අනුපලිත්තො
සීහො'ව පාදනි පසාරයන්තො,
කපී'ව ධම්මාසනතො' තරන්තො
ජාතො යථා දිච්චවරො නගම්හා.

55. ඛීණාසවා බ්‍රහ්මගණො' පගන්ත්වා
සුවණ්ණජාලෙන පටිග්ගහෙසුං,
තතො ච දෙවා' ජිනචම්මකෙන,
තතො දුකූලෙන ච තං මනුස්සා.

56. තෙසම්පි හත්ථා වරභූමියං ඨිතො
දිසා විලොකෙසි සමා සමන්තතො,
වදිංසු දෙවා' පි ච බ්‍රහ්මකායිකා
තයා සමො කාඤ්චි නත්ථි උත්තමො.

---

දණ්ඩා, රන්මුවාම්පිඇති; චාමරාච, සෙමෙරද; විජෙනන්ති, (තුමූම) සැලෙති; භෙරීච, බෙරද; ගජ්ජිංසු, (තුමූම) හඬපැවැත්තාහු; සඞ්ඛාච, සක්ද; නදිංසු, (තුමූම) නාදකළහ.

54. කෙනමලෙනඅපි, (මව්කුසගැටගත්) කිසිමඅසුචියකින්; අනුපලිත්තො, නොවැකුනුදෙහඇත්තේ; ධම්මාසනතො, ධර්මාස නයකින්; ඔතරන්තො, බස්නාවූ; කපීඉව, ධර්මකථිකයක්හුමෙන්; සීහොඑව, සිටියේම; පාදනි, පාදයන්; පසාරයන්තො, දිගුකර මින්; නගම්හා, සුවර්ණපර්වතයෙන්; හෙවත් සුවර්ණපර්වතය වි දාරණයකොට නික්මෙන්නාවූ; ආදිච්චවරො, ළහිරුතෙම; යථා, යම්සේද; (එසේබබලමින්) ජාතො, (මව්කුසින්) බිහිවූසේක.

55. ඛීණාසවා, ක්ෂයකරණලදආශ්‍රවඇති; බ්‍රහ්මගණා, (ශුද්ධාවා සික) බ්‍රහ්මසමූහයා; උපගන්ත්වා, සමීපයට එළඹ; තං, ඒබෝස තානන්; සුවණ්ණජාලෙන, රන්දැලකින්; පටිග්ගහෙසුං, පිළිගත්හු; තතො, ඊටඅනතුරුව; දෙවා, සතරවරම්දෙවියෝ; අජිනචම්ම කෙනච, අඳුන්දිවිසමකින්ද; තතො, ඉක්බිත්තෙන්; මනුස්සා, උ තුම්මනුෂ්‍යයෝ; දුකූලෙනච, දුහුල්සළුවකින්ද; පටිග්ගහෙසුං, පිළිගත්හු.

56. තෙසම්පි හත්ථා, ඒම්නිසුන්ගේඅතින්ද; (බැස) වරභූමියං, උතුම්බිම; ඨිතො, (සමපත්ලෙන්) සිටියේ; සමාදිසා, හැමදිසා වන්; සමන්තතො, හාත්පස; විලොකෙසි, බැලූසේක; දෙවාඅපි, දෙවියෝද; බ්‍රහ්මකායිකා, බ්‍රහ්මයෝද; තයා, (මහාපුරුෂයානනි!) නුඹවහන්සේහා; සමො, සමවූවෙක්ද; උත්තමො, (නුඹවහන්සේටවැ ඩි)උතුමෙක්ද; කාඤ්චි, කිසිතැනෙකත්; නත්ථි, නැතැයි; වදිංසු, කීහ.

## ජි නා ල ඞ්කා ර ය.

57. ගන්ත්වාන උත්තරං සත්තපදවාරං හි වික්කමො,
සීහනාදං නදී තෙසං දෙවතානං හිතාවහං.
58. තතො පුත්තං ගහෙත්වාන ගතාමාතා සකං ඝරං,
සත්තමියං චුතා ගන්ත්වා දෙවපුත්තත්ත මාගමී.

59. තෙ බ්‍රාහ්මණා පඤ්චමියං සුභුත්තා
නාමං ගහෙතුං වරලක්ඛණානි,
දිස්වාන එකඞ්ගුලි මුක්ඛිපිංසු
බුද්ධො අයං හෙස්සති වීතරාගො.

60. ජිණ්ණඤ්ච දිස්වා බ්‍යාධිතං මතඤ්ච
මහායතං පබ්බජිතඤ්ච දිස්වා,
ඔහාය පබ්බජ්ජ මුපෙති කාමෙ
බුද්ධො අයං හෙස්සති වීතරාගො.

---

57. වික්කමො, වික්‍රමයෙන් යුක්තවූ බොධිසත්වතෙම; උත්තරං, උතුරුදිගටඅභිමුඛව; සත්තපදවාරංහි, සත්පියවරක්ම; ගන්ත්වාන, ගොස්; තෙසං දෙවතානං, ඒ දෙවියන්ට; හිතාවහං, හිතඑළවන්නාවූ; සීහනාදං, (අග්ගොහමස්මිලොකස්ස යනාදි) ශ්‍රෙෂ්ඨනාදය; නදී, (බ්‍රහ්මස්වරනගා) ප්‍රකාශකළසේක.

58. තතො, ඉක්බිත්තෙන්; මාතා, ජනකමාතෘතොමෝ; පුත්තං, පුත්‍රයා; ගහෙත්වාන, වඩාගෙණ; සකංඝරං, ස්වකීයරාජභවනයට; ගතා, ගියා; සත්තමියං, සත්වනදවස්හි; චුතා, (මිනිසත්බැව්න්) සැව්නී; ගන්ත්වා, ගොස්; දෙවපුත්තත්තං, දෙව්පිත් බවට; ආගමි, පැමිණී; හෙවත් මාතෘනම්දිව්‍යපුත්‍රව දෙව්ලොව උපනී.

59. පඤ්චමියං, පස්වනදවස්හි; සුභුත්තා, දියනුමුසුකිරිබත් වළඳනලද; තෙබ්‍රාහ්මණා, (අටතුරාසියක් බමුණන්ගෙන් වෙන් කොටගත්) ඒබමුණෝඅටදෙනා; නාමංගහෙතුං, (බෝසත්හටසුදුසු) නමක්තබන්ට; වරලක්ඛණානි, දෙතිස්මහාපුරුෂලක්ෂණයන්; දිස්වා, (සියැසින්) බලා; අයං, මේකුමාරතෙම; වීතරාගො, පහවූරාග ඇත්තෙක්ව; බුද්ධොහෙස්සති, බුදුවන්නේය.

60. ජිණ්ණඤ්ච, ජරාවටපැමිණියකුද; බ්‍යාධිතං, රොගයෙන් පීඩිතයකුද; මතඤ්ච, මළඑකකුද; දිස්වා, (උයන්කෙළියටවඩනා කල්හී) දැක; මහායතං, මහත්වූකායසංයමඇති; පබ්බජිතඤ්ච, පැවිද්දකුද; දිස්වා, දැක; කාමෙ, පඤ්චකාමයන්; ඔහාය, හැරපියා; පබ්බජ්ජං, ප්‍රව්‍රජ්‍යාවට; උපෙති, පැමිණෙන්නේය; අයං, මේ තෙම; වීතරාගො, විගතරාගීව; බුද්ධොහෙස්සති, බුදුවන්නේයයි; එකඞ්ගුලිං, එක්ඇඟිල්ලක්; උක්ඛිපිංසු, එසවූහ.

## සන්නසහිත.

61. තමසීතිඅනුබ්‍යඤ්ජන-සමනුබ්‍යඤ්ජිතවිචිත්තලක්ඛණ සිරිවිභවං,
පජ්ජලිතකෙතුමාලා-ජාලාසමුජ්ජලිතරූපසොභං වන්‍දෙ.

**ඉති සාධුජනානන්‍දනනිදානෙ ජිනාලඞ්කාරෙ විජාතමඞ්ගල දීපනීගාථා නිට්ඨිතා.**

---

62. කාලක්කමෙන චන්‍දො'ව වඩ්ඪන්තො වඩ්ඪිතෙ කුලෙ,
පුඤ්ඤොදයෙනු' දෙන්තො සො භානුමා විය අම්බරෙ.

63. සිද්ධත්ථො හි සිද්ධත්ථො, ලද්ධා දෙවිං යසොධරං,
චත්තාළීසසහස්සෙහි පුරිත්ථීහි පුරක්ඛතො.

---

61. අසීතිඅනුබ්‍යඤ්ජන, අසූඅනුව්‍යඤ්ජනයෙන්; සමනුබ්‍යඤ්ජිත, මොනවටබබලනලද; විචිත්ත, විසිතුරුවූ; ලක්ඛණසිරිවිභවං, ලක්ෂණශ්‍රීසමෘද්ධියක්ඇත්තාවූ; පජ්ජලිත, ප්‍රකර්ෂයෙන් බබලන; කෙතුමාලා ජාලා, කෙතුමාලාශ්‍රීයෙන්; සමුජ්ජලිත, මනාවඋජ්ජ්වලිතවූ; රූපසොභං, රූපශොභාවක්ඇති; තං, ඒසර්වඥයා; වන්‍දෙ, (සකසා) වදිමි.

සාධුජන, හුදීජනයන්ට; ආනන්‍දන, සන්තොෂගෙණදීමට; නිදානෙ, කාරණවූ; ජිනාලඞ්කාරෙ, ජිනාලඞ්කාරනම් ප්‍රකරණයෙහි; විජාතමඞ්ගල දීපනීගාථා, ප්‍රසවමඞ්ගල්‍යය ප්‍රකාශකවූගාථාවෝ, ඉති, මෙතෙකින්; නිට්ඨිතා, නිමියාහ.

---

62. කාලක්කමෙන, කල්යාමෙන්; වඩ්ඪන්තො, වැඩෙන්නාවූ; චන්‍දොඉව, (සරත්කාලයෙහි ෂොඩශකලාපරිපූර්ණ) චන්‍ද්‍රයාමෙන්; වඩ්ඪිතෙ, (යශෛශ්වර්‍ය්‍යයෙන්) වැඩුනාවූ; කුලෙ, ශාක්‍යරාජභවනයෙහි; වඩ්ඪන්තො, වැඩෙන්නේ; අම්බරෙ, අහස්හි; භානුමාවිය, (උද්ගතවන) ලහිරුමෙන්; පුඤ්ඤොදයෙන, ස්වකීය පුණ්‍යොදයෙන්; උදෙන්තො, උද්ගතවන්නාවූ; හෙවත් ශ්‍රීසමෘද්ධියට පැමිණෙන්නාවූ; සො, ඒමහබෝසත්තෙම.

63. සිද්ධත්ථොහි, සිද්ධියටපැමිණිඅර්ථඇතිහෙයින්වනාහි; සිද්ධත්ථො, සිද්ධාර්ථනම්වූයේ; යසොධරංදෙවිං, යශොධරානම් අගමෙහෙසිය; ලද්ධා, විවාහකොටගෙණ; චත්තාළීසසහස්සෙහි, සතළිස්දහසක්; පුරිත්ථීහි, අන්තඃපුරස්ත්‍රීන් විසින්; පුරක්ඛතො, පිරිවරණලද්දාවූ.

## ජි නා ල ඞ්කා ර ය.

64. රම්ම සුරම්ම සුභෙසු ඝරෙසු
තිණ්ණ මුතූන මනුච්ඡවිකෙසු,
දිබ්බසුඛං විය භුඤ්ජි සුඛං සො
අච්ඡරියබ්භුත රාජවිභූතිං.
65. යො තීසු පාසාදවරෙසු තෙසු
සක්කො'ව දෙවාධිපතී වසන්තො,
යසොධරං පීණපයොධරාධරං
හිත්වා ගතො තං සුගතං නමාමි.

**ඉති සාධුජනානන්දනනිදානෙ ජිනාලඞ්කාරෙ
අගාරිකසම්පත්ති දීපනීගාථා නිට්ඨිතා.**

---

64. සො, ඒමහබෝසත්තෙම; රම්ම, නවභූමකවූ රම්‍යය; සුරම්ම, පඤ්චභූමකවූ සුරම්‍යය; සුභෙසු, සප්තභූමකවූශුභයයන; තිණ්ණං උතූනං, (හිමවත් ග්‍රීෂ්මවර්ෂායන) තුන්ඍතූන්ට; අනුච්ඡවිකෙසු, සුදුසුවශයෙන්කළාවූ; ඝරෙසු, ප්‍රාසාදයන්හි; දෙවසුඛං විය, දෙව්ලොවසැපමෙන්; අච්ඡරියබ්භුත, ආශ්චර්‍ය්‍යාද්භූතවූ; රාජවිභූතිං, රාජසම්පත්තියෙන් යුක්තවූ; සුඛං, සැප; භුඤ්ජි, (සුකුමාර සූත්‍රාදියෙහි වදාළපරිද්දෙන්) වින්දේය.

65. යො, යමෙක්; තෙසු, ඒඋක්තප්‍රකාරවූ; තීසු පාසාදවරෙසු, ත්‍රිවිධවූ උත්තමප්‍රාසාදයන්හී; දෙවාධිපති, දෙවේන්ද්‍රවූ; සක්කොඉව, ශක්‍රයාමෙන්; වසන්තො, වසනුයේ; පීණ, පිරුණාවූ; පයොධරාධරං, පියයුරුයුවලක්හා තොල්සඟලක්ඇති; යසොධරං, (මහත්වූ කීර්ත්තියක් දරණහෙයින්) යසොධරානම්වූ අගමෙහෙසිනිය; හිත්වා, හැර; ගතො, මහාභිනිෂ්ක්‍රමණයකළේද; තංසුගතං, ඒසර්‍වඥයා; නමාමි, (වාරත්‍රයෙන්සකසා) වඳිමි.

සාධුජන, සුධීජනයන්ට; ආනන්දන, සන්තොෂගෙණදීමට; නිදානෙ, කාරණාවූ; ජිනාලඞ්කාරෙ, ජිනාලඞ්කාරනම් ප්‍රකරණයෙහි; අගාරිකසම්පත්තිදීපනීගාථා, අගාරිකසම්පත් ප්‍රකාශකවූගාථාවෝ; ඉති, මෙතෙකින්; නිට්ඨිතා, නිමියාහ.

---

(මෙසේ අගාරිකසම්පත් වර්ණනාකරන්නෝ යම්හෙයකින් රාජභවනයෙහිවූ ඒඋම්මාරයෙහි තබනලද පාදය උදුරණකල්හිම සකලක්ලෙශප්‍රහාණයහා පසුවමාර්ගඥානයෙන් අනුසයප්‍රහාණයවීද, එසේහෙයින් මෙතනදී අනඞ්ගභඞ්ගයකීයයුතුවෙයි, දත් ඒකියන්නෝ නොයෙක්ප්‍රකාරයෙන් භගවත්හුගේ ගුණකථනය පිණිසත් ශුද්ධමාගධිකයන්ට අලඞ්කාරශාස්ත්‍රයෙහි උදාහරණමාත්‍රව දනගැන්ම පිණිසත් අලඞ්කාරසහිතව ගුණවර්ණනාව කරන්නෙමුයි පළමු කොට ප්‍රතිලොමයමකයකින් නමස්කාරදක්වන්නෝ "**නමො තස්ස**" යනාදිය කියත්.)

## ස න් ත ස හි ත.

**නමො තස්ස යතො මහිමතො යස්ස තමො න.**

(පටිලොමයමකං)

66. දිස්වා නිමිත්තානි මදවච්ඡිදනි
ජිනං විරූපානි රතිවච්ඡිදනි,
පාපානි කම්මානි සුඛවච්ඡිදනි
ලද්ධාන ඤාණානි භවච්ඡිදනි.

(පාදන්තව්‍යපෙතයමකං)

67. පදිත්තගෙහා විය භෙරවං රවං
රවං සමුට්ඨාය ගතො මහෙසී,
මහෙසි මාලොකිය පුත්ත මත්තනො
තනොසි නො පෙම්මමහොඝ මත්තනො.

(පා ද ස න්ධා න ය ම කං)

---

යතො, මහිමතො, (පාරමිතාදි) යම්මහානුභාවයක්හෙතුකොටගෙණ; යස්ස, යමක්හුගේ; තමො, මොහාන්ධකාරය; න, අවිද්‍යමානවීද; තස්ස, ඔහට; නමො, නමස්කාරවේවා.

66. මදවච්ඡිදනි, (යෞවන-ආරොග්‍ය-ජීවිත-රාග-යන චතුර්විධ) මදයන්නසන්නාවූ; නිමිත්තානි, (ජරා-ව්‍යාධි-මෘත-ප්‍රව්‍රජිත යනචතුර්විධ) පූර්වනිමිති; දිස්වා, දැක; රතිවච්ඡිදනි, කාමරතිවිනාශකරන්නාවූ; ජිනං, (මහබිනික්මන්නික්මෙනදවස්හි නිද්‍රොපගත) නාටකස්ත්‍රීන්ගේ; විරූපානි, (දෙවතානුභාවයෙන් දක්වනලද ඒ ඒ) විකාරස්වරූපයන්ද; දිස්වා, දැක; සුඛවච්ඡිදනි, (දිව්‍ය-බ්‍රහ්ම-මනුෂ්‍යයන්සම්බන්ධ) සැපනසන්නාවූ; පාපානිකම්මානි, (ස්වසන්තානපරසන්තානයන්හී පරිපූර්ණවූ ලොභමොහාදි) පාපකර්මයන්ද; දිස්වා, දැක; භවච්ඡිදනි, උත්පත්තිභවයවිනාශකරන්නාවූ; ඤාණානි, (භවාදීනවදක්වන) නිර්විදඥනයන්; ලද්ධාන, ලැබ.

67. පදිත්තගෙහාවිය, ගිනිඇවිලගත්ගේකින්නික්ම දිවිරැකගත්තාපුරුෂයක්හුමෙන්; භෙරවංරවං, ("උපද්දුතංවතභො! උපස්සට්ඨංවතභො!" යනාදී) භයානකහඬ; රවං, පවත්වමින්; සමුට්ඨාය, (යහනින්) නැගිට; ගතො, ගියාවූ; මහෙසී, මහත්වැඩක්සොයනසුලුවූහෝ මහත්ප්‍රභූවූබොධිසත්වතෙම; අත්තනො, තමාගේ; මහෙසිං, අගමෙහෙසිනියද; පුත්තං, පුත්‍රුවනද; ආලොකිය, බලා; අත්තනො, තමාගේ; පෙම්මමහොඝං, ප්‍රෙමනැමැතිමහත්දියවෙගය; තනොසි, නොපැතිරවී.

## ජි නා ල ඞ්කා ර ය.

68. උම්මාර උම්මාරගතුද්ධරිත්වා
පදං පදං යාතනරාසභස්ස,
අලං අලඞ්කාරතරෙන ගන්තුං
මතී මතී මෙති මනඞ්ගභඞ්ග.
(ආ දි ය ම කං)

69. උම්මාර උම්මාරගතො මහෙසී
අනඞ්ගභඞ්ගං සමචින්තයිත්ථ,
කිංමෙම ජරාමච්චුමුඛෙ ඨිතස්ස
න මෙ වසෙ කාමවසෙ ඨිතස්ස.
(ආ දි පා ද ය ම කං)

70. කාමෙන කාමෙන න සාධ්‍යමොක්ඛං
මානෙන මානෙන මම’ත්ථි කිඤ්චි,
මාරො සසෙනො’පි අවාරණීයො
යන්තෙන උච්ඡුං විය මද්දතී මං.

---

68. උම්මාර, උත්පාටනයකරණලදමාරයාඇති; උම්මාර, එසිකායෙහි; හෙවත් එළිපතමත්තෙහි; ගතං, තබනලද; පදං, (අටතුරාසියක්මගුල්ලකුණෙන්හෙබියාවූ ස්වකීය) පාදතලය; උද්ධරිත්වා, උඩටනගාගෙණ; පදයාත, නිවන්සාදදීමපිණිස පැමිණියාවූ; නරාසභස්ස, නරොත්තමයාගේ; අලං, අත්‍යර්ථයෙන්හෝ අනුරූපවශයෙන්; අනඞ්ගභඞ්ග, කන්දර්පවිනාශසාගරයෙහි; නොහොත් කාමරාගනැස්මකළවිදර්ශනාමාර්ගඥනාදිගුණසාගරයෙහි; අලඞ්කාර,(ස්වභාවොක්තිඋපමාරූපකදීපකාදි) අලඞ්කාරවලින්කරණලද; තරෙන, පසුරකින්; ගන්තුං, එතරවීමට; මෙ, (බුද්ධරක්ෂිතාචාර්‍ය්‍යවූ) මාගේ; මති, සිතිවිල්ල; අති, ඉතාමත්; එති, පවත්නේය.

69. උම්මාර, උත්පාටනයකළමාරයාඇති; උම්මාර, එළිපතමත්තෙහි; ගතො, සිටියාවූ; මහෙසී, මහර්ෂිවූබොධිසත්වතෙම; අනඞ්ගභඞ්ගං, කන්දර්පවිනාශය; සමචින්තයිත්ථ, (අනඞ්ගයා කෙසේ වනසාලම්දැයි) මොනවට සිතූය; ජරාමච්චු, ජරාමරණනැමැති රාක්ෂසයාගේ; මුඛෙ, මුඛයෙහි; ඨිතස්ස, සිටියාවූ; මෙවසෙ, මාවසගයෙහි; න, නොසිටියාවූ, කාමවසෙ, කාමයාටවසගවූ ආඥාභාවයෙහි; ඨිතස්ස, සිටියාවූ; මෙ, මට; (මෙහිමතුගයින් "කාමෙන" යනු ගෙණ; කාමෙන, වස්තුකාමක්ලෙශකාමදෙකින්; කිං, කවර ප්‍රයොජනයෙක්ද? (ප්‍රයොජනයෙක්නැත්තේමැයි)

70. මොක්ඛං, නිර්වාණය; කාමෙන, වස්තුකාමයෙන්ද; කාමෙන, ක්ලෙශකාමයෙන්ද; නසාධ්‍යං, සිදුකළනොහැකි; (යස්මා, යම්හෙයකින්) සසෙනො, ("කාමාතෙපඨමාසෙනා" යනාදීන්දක්වූ) සෙනාසහිතවූ; මාරොඅපි, මරතෙමේ; අවාරණීයො, වැළකියනොහැක්කේ; යන්තෙන, ඉක්ෂුයන්ත්‍රයකින්; (මඩනාලද)

## ස න් න ස හි ත.

71. ආදිත්ත මුය්‍යාත පයාත මූන
මත්තාණ ලෙණා සරණෙ ජනෙ තෙ,
දිස්වාන' දිස්වාන සිවං මයා තෙ
කාමෙන කාමෙන කථං විනෙය්‍යා.
(අ න්ත පා ද ය ම කං)

72. විජ්ජාය' විජ්ජාය චුතං චුපෙතං
අසාරසාරූපගතං ජනං ජනං,
විජ්ජාය' විජ්ජාය යුතො චුතො හං
පහොමි තාරෙතු මසඞ්ගතො ගතො.
(පා ද ද්ව න්ත ය ම කං)

---

උච්ඡුංචිය, ඉක්ෂුඛණ්ඩයක්සේ; මං, මා; මඤ්ඤති?, මසිද?. (තස්මා, එ හෙයින්) අනෙන, මේ; මානෙන, (සක්විතිරජවන්නෙමියන) අභි මානයෙන්ද; නොහොත්මානෙන, මිථ්‍යාමානයෙන්ද; මම, මට; කිඤ්චි, මදවූදප්‍රයොජනයෙක්; මාඅත්ථි, නැත්තේය.

71. ආදිත්ත, (ජාත්‍යාදිඑකොළොස්ගින්නකින්) දනලද්දවූ; උය්‍යාත, ඌර්ධීකෘතවූ; හෙවත් මරුමුවට යාමටසැදුනාවූ; පයාත, (චතුරොඝයෙන්) පිරුණාවූ; නොහොත් හරිතවූ; ඌන, (තෘෂ්ණාවගේඅපූරිතත්වයෙන්) අඩුවූ; අත්තාණ, (පටහලයක්මෙන් මදවූ) ආරක්ෂාවකුදුනැත්තාවූ; අලෙණ, (සැඟවීමටද) ස්ථානයක්නැත්තාවූ; අසරණෙ, පිළිසරණක්නැත්තාවූ; එතෙජනෙ, මෙබඳුජනයන්; දිස්වාන, දැක; මයා, (කරුණාවෙන්යුක්තවූ) මාවිසින්; සිවං, නිර්වාණය: අදිස්වාන, නොදැක; තෙ, ඒජනයෝ; කාමෙන, (ඔවුන්ගේ හිතට) කැමැත්තාවූ; කාමෙන, කාමුකතාවෙන්; කථං, කෙසේ නම්; විනෙය්‍යා, හික්මවියහැක්කාහුද; (හික්මවියනොහැක්කාහුයි).

72. විජ්ජාය, විදර්ශනාදිඥානයෙන්; චුතං, තොරවූ; අවිජ්ජා යච, මොහයයිනම්ලද අවිද්‍යාවෙන්ද; උපෙතං, යුක්තවූ; අසාර, හරනැතිදෙය; සාර, සාරවශයෙන්සිතා; උපගතං, ප්‍රතිඥාකරණ ලද, නොහොත් ගන්නාලද; ජනං, (කුශලාකුශලකර්මයන්) උපදවන් නාවූ; ජනං, ලොකයා; තාරෙතුං, (භවාර්ණවයෙන්) එතරකරන්ට; විජ්ජාය, විදර්ශනාදිඥානවිශෙෂයෙන්; යුතො, සම්ප්‍රයුක්තවූ; අවිජ්ජා ය, (සත්‍යප්‍රතිබොධයට විලොමවූ) මොහයෙන්; චුතො, නිරවශෙ ෂයෙන් මිදුනාවූ; අසඞ්ගතො, ඥාතිමිත්‍රාදිසම්බන්ධයක් නැත්තාවූ; ගතො, චතුඃසත්‍යාවබොධයකළාවූ; නොහොත් අසඞ්ගතො, විෂය රාගයෙන්තොරවූ වෛරාග්‍යයට; ගතො, පැමිණියාවූ; අහං, මම; පහොමි, පොහොසත්වෙමි.

## ජි නා ල ඞ්කා ර ය.

73. මග්ගන්ති නො දිට්ඨිගතා' පවග්ගං
අග්ගාති තෙ' වා' හු ජනා සමග්ගා,
නග්ගං අහො මොහතමස්ස වග්ගං
වග්ගං හනිස්සාමි තමග්ගමග්ගා.
(පාදව්‍යපෙතයමකං)

74. පසය්හකාරෙන අසය්හදුක්ඛං
ජනා ජනෙන්ති' හ ජනාන මෙව,
පසය්හකාරෙන අසය්හදුක්ඛං
පාපං නජානන්ති තතොනිදානං.
(පාදව්‍යපෙතයමකං)

75. තෙ ඔඝ යොගාසවසංකිලෙසා
තමෙව නාසෙන්ති තතො සමුට්ඨිතා,
එකන්තිකං ජාති ජරාච මච්චු
නිරන්තරං තං ව්‍යසනඤ්ච' නෙකං
(පාදව්‍යපෙතයමකං)

---

73. (යෙ, යම්කෙනෙක්) දිට්ඨිගතා, මිසදිටුගත්තෝ; (වෙද්ද) තෙ, ඔව්හු; අපවග්ගං, අපවර්ගය; හෙවත් නිර්වාණය; නොමග්ගන්ති, නොදකිත්; නොහොත් නොසොයත්; සමග්ගා ජනා, හැමදෙනාද; තෙ එව, ඒමිසදිටුගත්ජනයෝම; අග්ගා ඉති, උතුම්හයි; ආහු, කීහ; මොහතමස්සවග්ගං, තමලක්ෂණවූමොහසම්බන්ධවර්ගය; හෙවත් අකුශලපක්ෂය; නග්ගං, (නිවටකුවෙන්) විප්‍රනෑතිවූයේ; නොහොත් හිස්වූයේ; අහො, විස්මයයි; තංවග්ගං, ඒඅකුශලපක්ෂය; අග්ගමග්ගා, අග්‍රමාර්ගයෙන්; හනිස්සාමි, නසන්නෙමි.

74. (අනතුරුව මොහයාගේ බලදක්වන්නෝ **පසය්හකාරෙන** යනගාථාව කියත්) ඉහ, මෙලෙව්හි; අසය්හදුක්ඛං, ඉවසියනොහැකිදුක්; පසය්හකාරෙන, ලාමහලාම; ජනානං, ප්‍රාණීන්ට; ජනා එව, (මිසදිටුගත්) ජනයෝම; ජනෙන්ති, උපදවති; (මෙසේ ජනයන්ට දුක්උපදවන්නාවූ ඒජනයෝ) තතො නිදානං, ඒදුක්ඉපදවීම්කාරණය; (මතුඅපට) පසය්හකාරෙන, බලාත්කාරයෙන්; අසය්හදුක්ඛං, නොඉවසියහැකිදුක් ගෙණදෙන; පාපං, පවකැයි; න ජානන්ති, නොදනිත්.

75. තතො, ඒඒසත්වසන්තානයෙන්; හෙවත් ඒඒසත්වයන්ගේ සිත්වලිං; සමුට්ඨිතා, උපන්නාවූ; තෙ, ඒ; ඔඝයොගාසවසංකිලෙසා, ඔඝ, ඔඝය; යොග, යොගය; ආසව, ආශ්‍රවයයන; සංකිලෙසා, කෙලශධර්මයෝ; තංඑව, එමසත්වසන්තානය; නාසෙන්ති, නසත්; (මෙසේ සත්වවශයෙනුදු සත්වයෝම සත්වයන්නසති, ධර්මවශයෙනුදු

## සන්නසහිත.

76. චිරං කිලෙසානලපජ්ජලන්තං
ඤත්වාන සත්තානුසයං සයම්භූ,
සාධෙමි බොධිං විනයාමි සත්තෙ
පච්ඡා'පි පස්සාමි සුතං සුතන්තං.
(පාදන්තාව්‍යපෙතයමකං)

77. තං දිබ්බචක්කං උරචක්කමාලං
රජ්ජං සසාරජ්ජ සමජ්ජ මජ්ජං,
තෙ බන්ධවා බන්ධන මාගතා' පරා
සුතො පසූතොයමනඞ්ගදූතො. *
(පාදාදිව්‍යපෙතයමකං)

---

අකුශලධර්‍මයෝ කුශලධර්‍මයන්නසති, මෙසේ ඇතිකළැහි කෙසේ සසංසිට සසරදුකින්මදේද) ජාති, ජාතියද; ජරා, ජරාවද; මච්චුව, මරණයද යනමොහු; එකන්තිකං, එකාන්තයෙන්වන්නාහ; තං අනෙකදුක්ඛව්‍යසනං, (රොගව්‍යසන–භොගව්‍යසනාදි) ඒ නොයෙක් විපත්ද; නිරන්තරං, (උපනුපන්තැන) නිරතුරුව; (පවත්නාහුමැයි).

76. චිරං, බොහෝකලක්; කිලෙසානල, කෙලශාග්නියෙන්; පජ්ජලන්තං, දිලෙන්නාවූ; සත්තානුසයං, සත්වයන්ගේ කාමාදිඅනුසයන්ද; නොහොත් සත්තානුසයං, (තමාගේ සිතෙහි පවත්නාකාමාදි) සප්තඅනුසයන්ද; සයම්භූ, ස්වයම්භූව; හෙවත් ස්වයම්ප්‍රතිභානයෙන් යුක්තව; ඤත්වා, දැන; බොධිං, සම්බොධිය; සාධෙමි, සිද්ධකරමි; සත්තෙ, විනෙයජනයන්; විනයාමි, (ශික්‍ෂාප්‍රඥප්තීන්හිලා) හික්මවමි; සුතන්තං, (නැවතභවයක්නොගන්නාහෙයින්) පුත්‍රයන්අතුරෙන් කෙළපැමිණියාවූ; නොහොත් සුතන්තං, (සක්විතිරජවී) පුත්‍රයන්අතුරෙන් කෙළපැමිණියාවූ; සුතං, රාහුලනම්පුත්රුවන; පච්ඡාපි, (බුදුවීමෙන්) පසුවද; පස්සාමි, බලන්නෙමි; (පළමුකොටතමන්ගේ කෙලෙස්පසමිතුරන් බලන්නෙමියිසේයි.)

77. තංදිබ්බචක්කං, (යම්දෙව්මුවාසක්රුවනෙක් පහළවන්නේයයි නිමිත්තපාඨකයෝ කීහුද) ඒදිව්‍යචක්‍රරත්නය; උරචක්කමාලං, (නොයෙක් සසරදුකින් හිසඔසවනුනොදෙනහෙයින්) උරසක්මාලාවක්වැනියි; තං රජ්ජං, (සක්රුවනසමගලැබියයුතුයම්සක්විතිරාජ්‍යයක්වේද) ඒසක්විතිරාජ්‍යය; සසාරජ්ජං, භයඞ්කාරසහිතයි: තං සමජ්ජං, (විසිදහසක්නළුවන්ගේ යම්නාටසමජ්‍යයෙක්වේද) ඒනාටසමජ්‍යය; මජ්ජං, (රාසොඬුන්ගේ) විකාරයක්වැනියි; තෙබන්ධවා, (අසූදහසක්පමණවූ යම්නෑකෙනෙක්වෙද්ද) ඒනෑයෝ; බන්ධනමාගතා, (මා තෘෂ්ණාබන්ධනයෙන්) බැඳීමටපැමිණි; අපරා, පසමිතුරන්වැන්නාහ; පසූතො, දූන්ප්‍රසවයකරණලද; අයං සුතො, මේපුත්‍රතෙමේද; අනඞ්ගදූතො, (මාගේ මහාභිනිෂ්ක්‍රමණය වළකනුසඳහා) අනඞ්ගයාවිසින්එවනලද දූතයකුවැනියි.

---

* "සුතො පසූතො, සිඅනඞ්ගදූතො" යීද සමහරපොතකපෙණේ.

## ජි නා ල ඞ්කා ර ය .

78. සමුජ්ජලන්තං වසතිං සතිං සිරිං
සිරිංසපාගාර මිදං මහාවිසං,
දද්දල්ලමානා යුවතී වතී මා
සකණ්ටකා යෙව සමඤ්ජමඤ්ජසෙ.
(පාදන්තමජ්ඣව්‍යපෙතයමකං)

79. යස්සා විරාජිතසිරී සිරියා'පි නත්ථි
තස්සා'වලොකිය න තිත්තිවසානමත්ථි,
ගච්ඡාමි හන්ද තව' නඞ්ග සිරප්පභෙදං*
මත්තෙභකුම්භපරි සීහවිලාසගාමි.
(පාදමජ්ඣව්‍යපෙතයමකං)

80. භො ! භො ! අනඞ්ග ! සුචිරම්පි පතුණ්ණබාණ
බාණානි සංහර මනුන්නවිතො නිරොධ,
රොධෙන චාපදගතංමනසො න සොච
සොචන්ත මජ්ජනවලොකිය යාමි සන්තිං.
(පාදසන්ධානයමකං)

---

78. සති සිරිං, විද්‍යමානවූශ්‍රීඇති; සමුජ්ජලන්තං, (සත්රුවනින්) බබලන්නාවූ; ඉදංවසතිං, මේරාජභවනය; මහාවිසං, මහත්හලාහලවිෂඇති; සිරිංසපාගාරං, තුඹසක්වැන්න; හෙවත් නසින්ගේ වාසස්ථානයක්වැන්න; දද්දල්ලමානා, (ශරීරප්‍රභායෙන්) දිලියෙන්නාවූ; ඉමායුවතී, මේ තරුණාඞ්ගනෝ; සමඤ්ජමඤ්ජසෙ, (කෙලෙස්නැමැතිකසලින්හා මිථ්‍යාදෘෂ්ටිනැමැති කටුවලින්තොරවූ හෙයින්) පිරිසිදුවූනිර්වාණමාර්ගයෙහි; (සරසඅවුරාසිටි) සකණ්ටකා එව, කටුසහිතවූම; වතී, වැටක්වැන්නාහ.

79. යස්සා, (මාහමුවෙහිවූ සිරියහනෙහි සැතපෙන) යම්යසොධරානම්වූ මෙහෙසියකගේ; විරාජිතසිරී, බබලන රූපශ්‍රීතොමෝ; සිරියාඅපි, (සියල්ලන්ට ශ්‍රීයාදානයකරන්නාවූ) ශ්‍රීදෙවියටත්; නත්ථි, නැත්තේද; තස්සා, (අපරිමිතපුණ්‍යප්‍රභාවෙන් උපන්නාවූ) ඇගේ; අවලොකිය, (රූපශ්‍රිය) බලා; තිත්තිඅවසානං, තෘප්තියගේ නිමාවෙක්; නඅත්ථි, නැත්තේද; හන්ද, එසේහෙයින්; අනඞ්ග! කාමය! තව, තාගේ; සිරප්පභෙදං, අවිද්‍යානැමැතිහිසබිඳීමට; මත්තෙභ, මදැතතුගේ; කුම්භපරි, කුම්භස්ථලයබිඳිමපිණිස එල්ලේයන; සීහවිලාසගාමී, සිංහයකුටබඳුගමන්ඇත්තේ; ගච්ඡාමි, දූන් යෙමි. (පෙරමෙන් තෝ මාපමුණුවාගැණීමට දූන්පොහොසත් නොවන්නෙහි යනුභාවයි).

80. සුචිරම්පි, ඉතාබොහෝකල්ම; පතුණ්ණබාණ, (ලෙව්සත්නට) විදිනලදසැරපසඇති; භො! භො! අනඞ්ග, එම්බා එම්බා කාමය! බාණානි, (තාගේ) සැර; සංහර, හකුළාර්කොපුවෙහි

---

* "සිරිප්ප භෙදං" හී සමහර.

## සත්තසතිත.

81\. රතිං රතිං කාමගුණෙ විවෙකෙ
අලං අලංතෙව විචින්තයන්තො,
මනං මනං ශාලය සම්පදාලයං
තහිං තහිං දිට්ඨ' බලා' ව පක්කමි.
(පාදාදිඅව්‍යපෙතයමකං)

**නෙක්ඛම්මජ්ඣාසයගාථා.**

---

82\. යාවක්ඛ්‍ව' යං රවි චරත්‍ය වලෙන රුද්ධෙ
යාවඤ්ච චක්කරතන ඤ්චුපයාති ලොකෙ,
තාව් ස්සරො නභචරො ජිතවාතුරන්තො
හිත්වා කථන්නු? පද මුද්ධරි සො නිරාසො.

---

ඛහාතබව; මාතුරාණෙ, නහමක්විදුව; ඉතො, මෙහිදීම; නිරොධ, නිරුඩවෙව; නොහොත් මනුනාභිතො, (තෝ) උඛගුවූ සිත්ඇතිව; නිරොධ, (මාහමුවෙහිනොසිට මෙහිදීම) නිරුඩවෙව; (එසේමැයි) රොධෙනව, එසේ නිරුඩවීමකරණකොටගෙණද: ආපදගතමනසො, විපතටපැමිණිසිත්ඇතිවූයේ; නසොච, (මම මොහුගේ චිරසභායෙකි මොහු දුක් මාමරාපලායත්තේයයි) සොකනොකරව; සොචන්තං අපි, සොකකරත්තාවූද; (තා) අනවලොකිය, නොබලා; සන්තිං, පරමශාන්තියට; යාමි, යමි.

81\. කාමගුණෙ, පස්කම්ගුණයෙහි; රතිං, ඇල්ම; අලං, නුසුදුසුහිහැර; විවෙකෙ, යථාර්ථයෙන්වස්තුස්වරූපාවධාරණයෙහි; රතිං, ඇල්ම; අලංඉති, උතුම්යයි; විචින්තයන්තොඑව, සිතමින්ම; අනඝශාලයං, මදනාලයවූ ඒස්ත්‍රීරත්නය; මනං, සිතින්; සම්පදල යං, වෙන්කරමින්; තහිං, එකලබෝසත් හොත්සිරියහන්ගබඩා වෙහි; අහිංදිට්ඨඅබලාඉව, (තමන්ගේහිසෙහි හෝ ඇකයෙහි හුනුවූ) නයඝුදුවූලදුරියකුමෙන්; පක්කාමි, (ඒසිරියහන්ගබඩාවෙන්නික්ම) මහබිනික්මන්කෙළේය.

**නෛෂ්ක්‍රම්‍යාධ්‍යාශය ප්‍රකාශක ගාථායි.**

---

82\. අවලෙන, සක්වළගලින්; රුද්ධෙ, වටකරණලද්දවූහෝ පිරිසිඳිනලද්දවූ; යාවඤ්ච, යම්තාක්තැනෙක්හි; අයං, මේදක්නා ලබන්නාවූ; රවි, සූර්‍ය්‍යතෙම; චරති, (දක්ෂිණාවෘත්තව) හැසිරේද; යාවඤ්ච, යම්තාක්තැන; චක්කරතනඤ්ච, දිව්‍යමයසක්රුවනද; උපයාති, (අහසින්) ගමනාගමනය කෙරේද; ලොකෙ, ලෙව්හි; තාව, ඒතාක්තැන; ඉස්සරො, අධිපතිව; හෙවත් සක්රුවනින් යුක්තවූ සක්විතිරජෙක්ව; නභචරො, (සක්රුවනපෙරටුකොට සතිස්යොත්තක පිරිස්පිරිවරණලදුව) අහසෙහි හැසිරෙණසුලුවූ.

83. දීපෙ මහා ච චතුරාධිකමෙසහස්සෙ
තත්‍රාපි සෙට්ඨභජිතං වරජම්බුදීපං,
භූනාභිකං කපිලවත්ථුපුරං සුරම්මං
හිත්වා කථන්නු? පද මුද්ධරි සො නිරාසො.

84. ඤාතීන' සීතිකුලතො හි සහස්සසංඛා
හත්ථස්සධඤ්ඤධනිනො විජිතාරිසඞ්ඝ,
ගොත්තාන ගොතමභුවං පිතරං ජනග්ගං
හිත්වා කථන්නු? පද මුද්ධරි සො නිරාසො.

---

ජිතචාතුරන්තො, (දූගැමින් සෙමින්) ජයගත් සතරමහත්විපඇති; සො, ඒබෝසත්තෙම; නිරාසො, නිරභිලාෂීවූයේ; හිත්වා, (මෙබඳු සම්පත් කෙලපිඩක්මෙන් නොතකා) හැරපියා; කථන්නු? කෙසේ නම්; පදං, (අටතුරාසියක් මගුල්ලකුණෙන් හෙබියාවූ) පාදතලය; උද්ධරි? උඩටනැගුද? හෙවත් පා ඔසවාගෙණ වැඩියේද?

83. (මෙසේ අතට පැමිණියාක්වැනිවූ සක්විතිසම්පත් හැර ප්‍රව්‍රජ්‍යාවට පැමිණිබව සාමාන්‍යයෙන් දක්වා දැන් එය විභාග කොට දක්වන්නෝ "**දීපෙමහාච**" යනාදිය කියත්) චතුරොමහා දීපෙ, සතරමහදිවයින්; අධිකෙ, අධිකකොටසිටියාවූ; මෙසහස්සෙ, දෙදහසක් කොදෙව්ද; තත්‍රඅපි, ඒ දිවයින් අතුරෙන්ද; සෙට්ඨභජිතං, (බුද්ධප්‍රත්‍යෙකබුද්ධාදි) උත්තමයන් විසින් සෙවනාලද; වරජම්බුදීපං, (සියලු දිවයින් අතුරෙන්) උතුම් දඹදිවද; භූනාභිකං, සියලුසක්වලබිමට නැබක්වැනිවූ; හෙවත් සියලුපොළෝතලයට නැබක්සේ මැදසිටියාවූ; සුරම්මං, ඉතාසිත්අලවන්නාවූ; කපිලවත්ථුපුරං, කිඹුල්වත්පුරයද; හිත්වා, හැරපියා; සො, ඒ බෝසත්තෙම; නිරාසො, නිරපෙක්ෂකවූයේ; කථන්නු, කෙසේනම්; පදං, (අටතුරාසියක් මඞ්ගල්‍යලක්ෂණයෙන් හෙබියාවූ) පාදතලයන්; උද්ධරී, ඉදිරීද? හෙවත් පාඔසවාගෙණ වැඩියේද?

84. හත්ථස්සධඤ්ඤධනිනො, ඇත් අස් ධන ධාන්‍ය ඇත්තාවූ; විජිතාරිසඞ්ඝ, දිනනලදසතුරුසමූහයාඇති; කුලතොහි, දූඹ්මිත්‍රාදිකුලගණනින්වනාහි; හෙවත් එක එක කුලයෙන් ගත්තාලද; ඤාතීනං, නෑයන්පිළිබඳවූ; අසීතිසහස්සසංඛා, අසූදහසක් පමණ ශාක්‍යරජුන්ද; ගොත්තාන, ගුරුගොත්‍රයෙන්; ගොතමභුවං, ගෞතමගොත්‍රයෙහි උපන්නාවූ; ජනග්ගං, (දඹදිව සියලුජනයන්ට අග්‍රහෙයින්) ජනාධිපතිවූ; පිතරං, පියරජද; හිත්වා, හැරපියා; සො, ඒ බෝසත්තෙම; නිරාසො, ඇලුම්නැත්තෙක්ව; කථන්නු, කෙසේනම්; පදං,(අටතුරාසියක් මගුල්ලකුණෙන්යුත්)පාදතලයන්; උද්ධරී, ඔසවාගෙණවැඩියේද?

## සන්තසහිත.

85\. රම්මං සුරම්මවසතිං රතනුජ්ජලන්තං
ගිම්හෙ' පි විම්හයකරං සුරමන්දිරාභං,
උස්සාපිතද්ධජපතාක සිතාතපත්තං
හිත්වා කථන්නු? පද මුද්ධරි සො නිරාසො.

86\. සපොක්ඛරා පොක්ඛරණී චතස්සො
සුපුප්ඵිතා මන්දිරතො සමන්තා,
කොකා නදන්තු පරි කොකනදෙ
හිත්වා කථං තං පද මුද්ධරී සො.

87\. සරෙ සරොජෙ රුදිතා ලිපාලියො
සමන්තතො පස්සති පඤ්ජරඤ්ජසා,
දිස්වා' රවින්දුනී මුඛාරවින්දං
නාථස්ස ලජ්ජායි' ව සංකුචන්ති.

---

85\. රම්මං, සිත්කලුවූ; රතනුජ්ජලන්තං, සත්රුවනින් බබලන්නාවූ; ගිම්හෙඅපි, ග්‍රීෂ්මසමයෙහිදු; විම්හයකරං, විස්මයජනකවූ; සුරමන්දිරාභං, දෙව්විමනක්බඳුවූ; උස්සාපිත, නංවනලද; ධජපතාක, ධ්වජයන්හා පතාකයන්ද; සිතාතපත්තං, ශ්වෙතච්ඡත්‍රයන්ද ඇති; සුරම්මවසතිං, (එකලබෝසත්වැඩහුන් පඤ්චභූමකවූ) සුරම්‍යනම්රාජභවනයද; හිත්වා, හැරපියා; සො, ඒබෝසත්තෙම; නිරාසො, අපෙක්ෂාරහිතවූයේ; කථන්නු, කෙසේනම්; පදං, (අටතුරාසියක් මගුල්ලකුණෙන් හෙබියාවූ) පාදතලය; උද්ධරී, ඔසවා ගෙණවැඩියේද.

86\. මන්දිරතො, රාජභවනයෙහි; සමන්තා, හාත්පසැ; සපොක්ඛරා, පොකුරුසහිතවූ; හෙවත් නෙළුම්පඳුරුසහිතවූ; සුපුප්ඵිතා, මනාවිකසිතවූ; චතස්සො පොක්ඛරණියො, පොකුණුසතරක්; (කළාහුද; ඒ පුෂ්කරණීන්හි) කොකනදෙ, රත්පියුම්වලැ; උපරි, මත්තෙහි: කොකා, කොව්ලෝ; නදන්ති, රැව්දෙද්ද; තං, එබඳු පොකුණුද; හිත්වා, හැරපියා; සො, ඒබෝසත්තෙම; කථං, කෙසේ; පදං, (අටතුරාසියක් මඞ්ගල්‍යලක්ෂණයෙන් හෙබියාවූ) පාදතලය; උද්ධරී, නගාගෙණවැඩියේද.

87\. සරෙ, (එහි) විල්වලැ; රුදිත, රැව්දෙන; අලිපාලියො, භෘඞ්ගශ්‍රෙණීන් ඇති, සරොජෙ, පියුම්; පඤ්ජරඤ්ජසා, සීවුදුරුකවුළුවලින්; සමන්තතො, හාත්පසින්; පස්සති, (මහබෝසත්) බලනකල්හි; අරවින්දුනී, (එහි) පද්මයෝ; නාථස්ස, බෝසත්හුගේ; මුඛාරවින්දං, මුඛපද්මය; දිස්වා, දැක; ලජ්ජාය, හ්‍රියෙන්; සංකුචන්ති ඉව, හැකිළෙතිසි. (සිතමි).

## ශබ්දාලඞ්කාරය.

88. මධුරා මධුරා මධුරා’භිරුදා
චරිතා පදුමෙ පදුමෙ’ලිගණා,
වසතිං මධුනා මධුනා අකරුං
ජහිතං කිමිදං කිමිදං පතිනා.
(පාදමජ්ඣාව්‍යපෙතයමකං)

89. තම්හා රසං මධුකරා භවනං හරිත්වා
නින්නාදිනො සුමධුරං හි මධුං කරොන්ති,
නාදෙන නාද මතිරිච්චු’ පවීණයන්තා
නච්චන්ති තා සුරපුරෙ වනිතා’ව තාව

90. සඤ්චොදිතා පීණපයොධරාධරා
විරාජිතා නඞ්ගජ මෙඛලා බලා,
සුරඞ්ගනානඞ්ගජඵස්සදා සදා
රමා රමාපෙන්ති වරඞ්ගදා’ ගදා.
(පාදන්තාව්‍යපෙතයමකං)

---

88. පදුමෙ, පිපියාවූ; පදුමෙ, (ශ්වෙතරක්ත) පද්මයන්හි; චරිතා, හැසිරෙන; අලිගණා, භෘඞ්ගශ්‍රෙණීහු; මධුරා, මිහිරිවූ ආකාරයකින්; අභිරුදා, නාදකරන්නෝ; මධු, වසන්තකාලයෙහි; රාමධුරා, ස්ත්‍රීරතියෙන් යුක්තවූවාහු; වසතිං, (බෝසත්හුගේ) ප්‍රාසාදය; මධුනා, මීරසයෙන් යුක්තවූවා; අකරුං, කළාහ; අධුනා, දැන්; පතිනා, හිමිහුවිසින්; ජහිතං, (මෙබඳුවූ වසන්තසම්පත්) හරණලද්දේය; ඉදං කිං? මේ කීමෙක්ද? ඉදං කිං? මේ කිමෙක්දැයි? (කුහුල්සිත්ඇත්තෝදවූහ).

89. මධුකරා, මීමැස්සෝ; නින්නාදිනො, නාදපවත්වන්නාහු; තම්හා, ඒ නෙළුඹුමල්වලින්; රසං, මල්පැනි; භවනං, රාජමන්දිරයට; හරිත්වා, හැරගෙණගොස්; සුමධුරං, ඉතාමිහිරිවූ; මධුං, මීපටලයන්; කරොන්තිහි, (උඩුමහලෙහි) කරත්මැයි; තා, ඒ භවනයෙහි වසනනාටකස්ත්‍රීහු; නාදෙන, (තමන්ගේ) ගීතස්වරයෙන්; නාදං, (ඒමීමැස්සන්ගේ) නාදය; අතිරිච්ච, මැඩපවත්වා; උපවීණයන්තා, (භෘඞ්ගනාදයට අනුරූපලෙස) වීණාවාදනයකරන්නියෝ; සුරපුරෙ, දෙව්ලොව; වනිතා ඉව, දිව්‍යප්සරාවන්මෙන්; තාව, (යම්තාක්බෝසත්හු කැමැත්තෝද); එතාක් නච්චන්ති, නෘත්‍යකරත්

90. පීණ, පිරුණාවූ; පයොධරාධරා, පියයුරුහාතොල්ඇති; සඤ්චොදිතා, කරණලදආමන්ත්‍රණඇති; හෙවත් (සැලෙන්නාවූ පියයුරුවලින් යුක්තව නෘත්‍යකරන්නවුන්ගේහා සැලෙන්නාවූ අධරයන්ගෙන් යුක්තව ගායනාකරන්නවුන්ගේද මෙහි එව් අපහා රමණයකරව් අපගේ නෘත්‍යගීතාදිරසවිඳිව්යයි) කළඇමතුම්ඇත්තාවූ; විරාජිත, බබලන්නාවූ; අනඞ්ගජ, ස්ත්‍රීචිහ්නයවසනලද; මෙඛලා, මෙවුල්දම්ඇති; අබලා, ශක්තිශූන්‍යවූහෝ අර්ජුනරසපානයකිරීම්ඇත්තාවූ; සදා, හැමකල්හි; සුරඞ්ගනා, දිව්‍යප්සරාවන්මෙන්; අනඞ්ගජඵස්සදා, මෛථුනස්පර්ශයදෙන්නාවූ; රමා, නාටකස්ත්‍රීහු; වරඞ්ගද, කාමරතිය උපදවන්නාවූ; අගදා, ඖෂධයන්මෙන්; හෙවත් රතිමණ්ඩනකාමෞෂධවිශෙෂයක්මෙන්; රමාපෙන්ති,(දුටුවන්)අභිරමණයකරවත්·

## ස ත් ත ස හි ත.

91. කරාතිරත්තා රතිරත්තරාමා
තාළෙන්ති තාළාවචරෙ සමන්තා,
නච්චුග්ගතා නෙකසහස්සහත්ථා
සක්කො' පි කිං සක්‍යසමො' ති මොදයුං.

92. විසාලනෙත්තා හසුලා සුමජ්ඣා
* තිබ්බත්ථනී විම්හයගීතසද්දා,
අලඞ්කතා මාල්‍යධරා සුවත්ථා
නච්චන්ති තාළාවචරෙහි ඡුට්ඨා.

93. යාසං හි ලොකෙ උපමා' පි නත්ථි
තාසං හි එසෙසසු කථා හි කා වා,
තං තාදිසං කාමරතිං නුභොන්තො
හිත්වා කථං තං පද මුද්ධරී සො.

---

91. අතිරත්ත, ඉතාරත්පැහැවූ; කරා, අත්ඇති; රතිරත්ත, කාමරතියෙහිආසක්තවූ; රාමා, කාන්තාවෝ; තාළාවචරෙ, කංසතාලාදිතූර්‍යවිශෙෂයන්; සමන්තා, හාත්පස; තාළෙන්ති, ගසත්; නච්චුග්ගතා, නැටීම්වශයෙන් උඩටඑසවූ; අනෙකසහස්සහත්ථා, නොයෙක්දහස්ගණන්අත්ඇත්තියෝ; කිං, කිම; සක්කොඅපි, සක්දෙව්රජවත්; සක්‍යසමොඉති, අපගේ ශාක්‍යපුත්‍රයානන්හා යශෛශ්වර්‍යාදියෙන් සදෘශදැයි; (සිතා) හෙවත් අසමානයයි; (සිතා) මොදයුං, සතුටුවූහ.

92. සුමජ්ඣා, සිහින්වූ ඉඟටිඇති; හෙවත් යහපත් මධ්‍යප්‍රදෙශඇති; විසාලනෙත්තා, දික්වූනුවන්ඇති; අලඞ්කතා, සර්වාලඞ්කාරයෙන් සැරසුනාවූ; මාල්‍යධරා, ගොතනලදමල්දම්පැළැන්දවූ; සුවත්ථා, නොයෙක්පැහැයෙන්යුත් වස්ත්‍රහැන්දවූ; තිබ්බත්ථනී, කඨින්වූ පයොධරඇති; විම්හයගීතසද්දා, විස්මයජනකවූගීතඝඬඇති; හසුලා, මන්දහාස්‍යයෙන්යුක්තවූ; හෙවත් මඳසිනාඇති; (රාමා, නාටකස්ත්‍රීහු;) තාළාවචරෙහි, කංසතාලාදියෙන්; ඡුට්ඨා, ඝොෂාකරණලද්දාහු; නච්චන්ති, (තදනුරූපවශයෙන්) නෘත්‍යකරත්.

93. හි, (යස්මා) යම්හෙයකින්; ලොකෙ, ලෙව්හි; යාසං, (මහබෝසත්හුගේ චිරසඤ්චිතකුසලබලයෙන් උපන්නාවූ) යම්ස්ත්‍රීකෙනෙකුන්ට; උපමාඅපි, (රූපසෞන්දර්‍යරතිසංග්‍රාදියහා සමකොටදැක්වියයුතු) උපමාවකුදු; නත්ථි, නැද්ද; (තස්මා, එහෙයින්;) තාසංහි, ඔවුන්ගේවනාහි; එසෙසසු, ශරීරාඞ්ගාදීන්හි; කාවා කථාහි,

---

* "ථඩත්ථනී" හීද පෙණේ.

94. පාදෙ පාදෙ වලයවිරවා මෙඛලා වීණනාදා
ගීතං ගීතං පතිරතිකරං ගායන්තී ගායතී සා,
හත්ථෙ හත්ථෙ වලයවලිතා සම්භමං සම්භමන්තී
දිස්වා දිස්වා ඉති රතිකරං යාති හා හා කිම්හා.

(පාදාදිඅව්‍යපෙතයමකං)

**පාදද්ධාරව්‍යමහාගාථා.**

---

කීයයුතුකථාවෙක්නම්නැත; තාදිසං, එබඳුවූ; තං කාමරතිං, ඒ කාමරතියද; අනුභොනෙතා, විඳිමින්; තං, ඒකාමසම්පත්ද; හිත්වා, හැරපියා; සො, ඒබෝසත්තෙම; කථං, කෙසේනම්; පදං, (අටතුරාසියක් මඟුල්ලකුණෙන් හෙබියාවූ) පාදතලය; උද්ධරී, ඔසවා ගෙණවැඩියේද?

94. පාදෙ, (නෘත්‍යකිරීම්වශයෙන් යටහෙළූ) පාදයන්හිද; අපාදෙ, නෘත්‍යකිරීමපිණිස උඩටනගාගත්) පාදයන්හිද; (බහනලද) වලයවිරවා, වලලුවලහානුපුරකිඞ්කිණිකයන්ගේ නාදයෙන්ද; මෙඛලා, (කටියෙහි බඳිනලද) මෙඛලාවන්ගේ නාදයෙන්ද; වීණනාදා, (අතින්වයනලද) වීණාවන්ගේනාදයෙන්ද; (සුකනවූ) අගීතං, ගායනානොකළවිරූ; ගීතං, (බෝසත්පිළිබඳ) කීර්තිගායනාව; පති, ස්වාමිවූ බොධිසත්වයන්ගේ; රතිකරං, ගෙහසිතසොම්නසවඩිනයකොට; ගායතීසා, ගායනාකරන්නියන්ට ප්‍රධානවූතැනැත්තිගායතී, පළමුකොට ගායනාකරන්නීය; (ඇගේ ගායනාකිරීම්ආකාරයබලා සෙසුසත්‍රීහුද පසුවගායනාකරන්නාහ යනු දක්වත්) හත්ථෙ, (වයනපිණිස උඩට නගාගත්) අත්හිද; අහත්ථෙ, (වයනපිණිස යටහෙළූ) අත්හිද; වලයවලිතා, වලයාකාරයෙන් සැලීමෙන්ද; නොහොත් වලයවලිතා, (අත්හිබහනලද) වලලුසැලීමෙන්ද; සම්භමං, (කෙසේනම් ස්වාමියාගේ සිත්ගණිම්දැයි) සාදරකොට මහත්වෙගයෙන්; සම්භමන්තී, භ්‍රමණයවනශරීරඇත්තීය, (මෙහි ප්‍රධානතැනැත්තියගේ වශයෙන් එකවචනයෙන් කීයේ නමුදු සෙසු විසිදහසක් පමණ පිරිවරසත්‍රීහු තමතමන්ගේ චෙෂ්ටාවිශෙෂයෙන් නෘත්‍යකරන්නියෝ තමහිමියාගේ සිත්ගෙණ තමතමන්ගේ සිත්නැමැති මඤ්ජුෂාවන්හි ප්‍රක්‍ෂෙප කරන්නාහු යනු මෙහින්ම දැක්වීය) ඉති, මෙසේ; රතිකරං, ඇලුම් කරන්නාවූ; (නෘත්‍යය) දිස්වා, බලා; අදිස්වා, (දුන්එබඳුරඟබඬල) නොබලා; යාති, (මහබෝසත්) යන්නේය; හාහා, අනේ අනේ; කිංර්හා, කවරක්‍රියාවෙක්ද? (මේ මහබෝසත්හුගේ ක්‍රියාව ඉතා විස්මයජනකය යනු භාවයි).

**පාදෙද්ධාරව්‍යමය ප්‍රකාශක ගාථායි.**

## සන්තසඟිත.

95. අනන්තකාලොපචිතෙන තෙන
පුඤ්ඤෙන නිබ්බත්තවිමානයානෙ,
තස්මිං දිනෙ ජාතසුතං පජාපතිං
හිත්වා ගතො සො සුගතො ගතො’ ව.

96. තං ජීවමානං පිතරඤ්ච මාතරං
තෙ ඤාතකෙ තාදිසියො ච ඉත්ථියො,
තෙ තාදිසෙ රම්මතරෙ නිකෙතෙ
හිත්වා ගතො සො සුගතො ගතො’ ව.

97. ඛොමඤ්ච පත්තුණ්ණදුකූලචීනං
සකාසිකං සාධු සුගන්ධවාසිතං,
නිවාසිතො සොභති වාසවො’ ව
හිත්වා ගතො සො සුගතො ගතො’ ව.

---

95. (මෙසේ බෝසත්හුගේ ශ්‍රීපාදෙඩරණය පිළිබඳවපැවති ආශ්චර්‍ය්‍යාද්භූතය දක්වා දූත් මහාභිනිෂ්ක්‍රමණයෙහිදී අපුනරාවර්ත්තිභාවයදක්වන්නෝ “අනන්තකාලොපචිතෙන” යනාදියකියත්) අනන්තකාල, අප්‍රමෙයකාලයෙහි; උපචිතෙන, රැස්කළාවූ; තෙන පුඤ්ඤෙන, ඒකුශලයෙන්; නිබ්බත්ත, උපන්නාවූ; විමානයානෙ, ප්‍රාසාදයන්හාසයනාසනයන්ද; තස්මිං දිනෙ, එදවස; ජාතසුතං, උපන්පුත්‍රරුවනද; පජාපතිං, ප්‍රජාපතිවූ යසොධරාදෙවියද; හිත්වා, හැරපියා; (යො, යමෙක්;) ගතො, මහබිනික්මන්කෙළේද; සො, හෙතෙම; සුගතො, (යහපත්ගමන්ඇතිහෙයින්) සුගත්මැයි; ගතො එව, ගියේමැයි; හෙවත් සර්‍වඥතාඥානයට පැමිණෙනතුරු නැවත හැරී නොආයේමැයි.

96. තං, ඒ; ජීවමානං, ජීවත්වූන්නාවූ; පිතරං, පියවූ සුදොවුන්මහරජද; මාතරඤ්ච, කුඩාමව්වූ මහාප්‍රජාපතිගෞතමියද; තෙ, ඒ; ඤාතකෙ, අසූදහසක්නෑයන්ද; තාදිසියො, එබඳුවූ; ඉත්ථියො ච, (විසිදහසක් පමණ) පරිවාරන්ස්ත්‍රීද; රම්මතරෙ, අතිශයින් සිත්කලුවූ; තෙ, ඒ; නිකෙතෙ, ප්‍රාසාදයන්ද; හිත්වා, හැරපියා; (යො, යමෙක්;) ගතො, මහබිනික්මන්කෙළේද; සො, හෙතෙම; සුගතො, (යහපත්ගමන්ඇතිහෙයින්) සුගත්මැයි; ගතොඑව, ගියේමැයි; හෙවත් බුද්ධත්‍වයට පැමිණෙනතුරු නැවත පෙරලානොවැඩියේමැයි.

97. සාධු, මොනවට; සුගන්ධවාසිතං, සුවඳකවනලද; සකාසිකං, කසීසළුසහිතවූ; ඛොමඤ්ච, කොමුපිළිද; පත්තුණ්ණ, එනම්දෙශයෙහිවූ පටද; දුකූල, දුහුල්ද; චීනං, චීනදෙශයෙහි උපන්පටද; (යන සිනිඳුවස්ත්‍රයන්) නිවාසිතො, හඳිනාලද බෝසත්තෙම; වාසවො ඉව, සක්දෙවිඳුමෙන්; සොභති, බබලයි; හිත්වා, (මෙකී මහාර්ඝසිනිඳුවස්ත්‍රයන්) හැරපියා; (යො, යමෙක්;) ගතො, මහබි

98. විධිප්පකාසා නිධයො සකාසා
සමුග්ගතා භූතධරා වසුන්ධරා,
සත්තා'වසන්තා වසුධා සුධාසා
හිත්වා ගතො සො සුගතො ගතො'ව.

99. සොවණ්ණථාලෙ සතරාජිකෙ සුභෙ
සාදුං සුගන්ධං සුචි සාලිභොජනං,
භුත්වා සවාසීහි විලාසිනීහි
හිත්වා ගතො සො සුගතො ගතො'ව.

100. මනුඤ්ඤගන්ධෙන අසුඤ්ඤගන්ධා
සුගන්ධගන්ධෙන විලිත්තගත්තා,
සුගන්ධවාතෙන සුවීජිතඞ්ගා
හිත්වා ගතො සො සුගතො ගතො'ව.

---

නික්මන්කෙළේද; සො, හෙතෙම; සුගතො, (යහපත්ගමන්ඇති හෙයින්) සුගත්මැයි; ගතො එව, ගියේමැයි; හෙවත් සම්බොධියට පැමිණෙනතුරු නැවත ආපසුහැරීනොවැඩියේමැයි.

98. විධිප්පකාසා, (බොධිසත්වයන්රැස්කළ) පුණ්‍යප්‍රභාවය ප්‍රකාශකරන්නාවූ; නිධයො, (ගව්දෙගව්තුන්ගව් යොදුන්පමණඇති) සතරමහානිධීහු; සකාසා, ආසන්නාවූ; භූතධරා, සත්වසංඝාරයන් උසුලන්නාවූ; වසුන්ධරා, පෘථිවියෙන්; සමුග්ගතා, පැණනැංගාහුද; වසුධා, පෘථිවියෙහි; ආවසන්තා, හාත්පසවසන්නාවූ; (යෙ) සත්තා, (යම්) සත්වකෙනෙක්හෝ; (යෙ) සුධාසා, (යම්) දෙවිකෙනෙක්හෝ; (වෙද්ද) (තෙ, ඒසතරමහනිධිකුම්භිසහිත දෙව්මිනිසුන්) හිත්වා, හැරපියා; [සො, යමෙක්;] ගතො, මහබිනික්මන්කෙළේද; සො, හෙතෙම; සුගතො, (යහපත්ගමන්ඇතිහෙයින්) සුගත්මැයි; ගතොඑව, ගියේමැයි; හෙවත් බුද්ධත්වයට පැමිණෙනතුරු පෙරලා නොවැඩියේමැයි.

99. සුභෙ, ශොභනවූ; සතරාජිකෙ, සියගණන්රේඛාඇති; සොවණ්ණථාලෙ, රන්මුවාතලියෙහි; සුගන්ධං, සුවඳවත්වූ; සාදුං, මිහිරිරසඇති; සුචි, පිරිසිදුවූ; සාලිභොජනං, ඇල්සහලේ බොජුන්; සවාසීහි, සමගවසන්නාවූ; විලාසිනීහි, කාන්තාවන් සමග; භුත්වා, වළඳා; (යො, යමෙක්;) හිත්වා, (මෙකීමධුරභොජන) හැරපියා; ගතො, මහබිනික්මන්කෙළේද; සො, හෙතෙම; සුගතො, (යහපත්ගමන්ඇතිහෙයින්) සුගත්මැයි. ගතොඑව, ගියේමැයි. හෙවත් බුද්ධත්වයට පැමිණෙනතුරු නැවතපෙරලා නොවැඩියේමැයි.

100. මනුඤ්ඤගන්ධෙන, සිත්කලුසුවඳින්; අසුඤ්ඤගන්ධා, සිස්නුවූසුවඳැති; සුගන්ධගන්ධෙන, සඳුන්තුවරලාදිසුවඳින්; විලිත්තගත්තා, විලවුන්කළසිරුරුඇති; සුගන්ධවාතෙන, සුවඳපවනින්; සුවීජිතඞ්ගා, මනාවවිදුනාලදදෙහඇති; (යො, යමෙක්) හිත්වා,

## සත්තසහිත.

101. සුලක්ඛණෙහෙ’ ව’ භිලක්ඛිතඬ්ගා
පසාධිතො දෙවපසාධනෙන,
විරාජමානො සකරාජිනීහි
හිත්‍වා ගතො සො සුගතො ගතො’ ව.

102. නානාසනානි සයනානි නිවෙසනානි
භාභානිභානි රතනාකර සන්නිභානි,
තත්‍රුස්සිතානි රතනද්ධජභූසිතානි
හිත්‍වා ගතානි හිමබින්දුසමානි තානි.

103. නානාවිධෙහි රතනෙහි සමුජ්ජලෙහි
නාරීහි නිච්ච මුපගායිත හම්මියෙහි,
රජ්ජෙහි චක්කරතනාදිවිභූසිතෙහි
යාතො තතො හි නමිතො හි සුරිස්සරෙහි.

**අපුනරාවත්තගමනදීපනීගාථා.**

---

(මෙකීදූ) හැරපියා; ගතො, මහබිනික්මන්කෙළේද; සො, හෙතෙම; සුගතො, (යහපත්ගමන්ඇතිහෙයින්) සුගත්මැයි; ගතොඑව, ගියේමැයි; හෙවත් චතුඃසත්‍යාවබොධයකරණතුරු නැවතහැරී නොආයේමැයි.

101. සුලක්ඛණෙහිඑව, ශොභනලක්ෂණවලින්ම; අභිලක්ඛිතඬ්ගා, මොනවට ලක්ෂණකරණලදදෙහඇති; දෙවපසාධනෙන, දිව්‍යාලඬ්කාරයෙන්; පසාධිතො, මණ්ඩිතවූ; (යො, යමෙක්;) සකරාජිනීහි, ස්වකීයරාජමෙහෙසිනීන්සමග; විරොචමානො, බබලමින් සිටියේ; හිත්‍වා, (මෙබඳුසම්පත්) හැරපියා; ගතො, මහබිනික්මන් කෙළේද; සො, හෙතෙම; සුගතො, (යහපත්ගමන් ඇතිහෙයින්) සුගත්මැයි; ගතොඑව, ගියේමැයි; හෙවත් චතුඃසත්‍යාවබොධයකරණතුරු නැවත පෙරලා නොවැඩියේමැයි.

102. භාභානිභානි, තාරකාකාන්තිබඳුවූ; නානාසනානි, නොයෙක්අසුන්ද; රතනාකරසන්නිභානි, රුවන්ආකරවැනිවූ; සයනානි, යහන්ද; තත්‍රුස්සිතානි, තන්හි තන්හි ඔසවනලද; රතනද්ධජ, රත්මුවාදදපෙලින්; භූසිතානි, සරසනලද්දාවූ; නිවෙසනානි, රාජමන්දිරයන්ද යන; තානි, ඒසියල්ල; හිමබින්දුසමානි, (හිරුනැගිකල විලීනවයන) පිනිබිඳුහා සමකොටසිතා; හිත්‍වා, අභිනිවෙසයනොකොට; ගතානි, ඉක්මවනලද්දාහුයි.

103. නානාවිධෙහි, මරකතවෛඩූර්‍ය්‍යාදි නන්වැදෑරුම්වූ; රතනෙහි, රුවන්රැසින්ද; නාරීහි, නළඟනන්විසින්; නිච්චං, නිතොර; උපගායිත, ගායනාපවත්වනලද; හම්මියෙහි, හම්‍ය්‍යතලපඞ්ක්තියෙන්ද; සමුජ්ජලෙහි, මොනවට උදුල්වූ; චක්කරතනාදි, චක්‍රරත්නාදියෙන්හා; (ආදිශබ්දයෙන් ගම්‍යවූ හස්තිරත්නාදියෙන්)

## ජිනාලඞ්කාරය.

104. යසොධරං පීණපයොධරාධරං
අනඞ්ගරඞ්ගද්ධජභූත මඞ්ගං,
දෙවච්ඡරං’ වුජ්ජලිතං පතිබ්බතං
හිත්වා ගතො සො සුගතො ගතොව.

105. සභාවනිච්ඡන්නමතිං පභාවතිං
භජන්තො කුසො සංහරි භත්තකාජං,
තායා’භිරූපා හි යසොධරං වරං
හිත්වා ගතො සො සුගතො ගතො’ව.

---

විභූසිතෙහි, හෙබියාවූ; රජ්ජෙහි, රාජ්‍යයෙන්; හි (යස්මා) යම්හෙයකින්; යාතො, නික්ම ගියේද; තතොහි, ඒකාරණයෙන්ම; සුරිසසරෙහි, දෙවෙන්ද්‍රයන්විසින්; නම්තො, (ගරුබුහුමන්සහිතව) නමස්කාරකරණලද්දේය.

### අපුනරාවර්තිත ගමනපරිදීපක ගාථායි.

104. (බාහිරවස්තුපිළිබඳ ආලයසිඳිහෙයින් බාහ්‍යවූ අනඞ්ගභඞ්ගයවීය, දැන් අභ්‍යන්තර අනඞ්ගභඞ්ගයවූ අසංසයගාථා දක්වන්නෝ “යසොධරං” යනාදිය කියත්) පීණ, පිරුණාවූ; පයොධරාධරං, පියයුරුයුවලක්හා තොල්සඟලක්ඇති; අනඞ්ග, කාමයාගේ; රඞ්ග, නෘත්‍යමණ්ඩලයෙහි ඔසවනලද; ධජභූත, මකරධ්වජයක්වැනිවූ; අඞ්ගං, දෙහයක්ඇති; දෙවච්ඡරංඉව, දිව්‍යාප්සරාවක්මෙන්; උජ්ජලිතං, උදුල්වූ; පතිබ්බතං, සාධ්වීවූ; යසොධරං, යසොධරානම් අගමෙහෙසිනිය; හිත්වා, හැරපියා; (යො, යමෙක්;) ගතො, මහබිනික්මන්කෙළේද; සො, හෙතෙම; සුගතො, (යහපත්ගමන්ඇතිහෙයින්) සුගත්මැයි; ගතොඑව, බුද්ධත්වයට පැමිණෙනතුරු නැවත හැරීනොවැඩියේමැයි.

105. (දැන් ලොකයෙහි අනඞ්ගයයි කියනලද කාමරාගයාගේ බලවත්බව දක්වන්නෝ අතීතයගෙණහැරදක්වත්) සභාව, නිසර්ගයෙන්; අනිච්ඡන්න, (තමාගේ දර්ශනශ්‍රවණමාත්‍රයකුදු) නොකැමතිවූ; මතිං, බුද්ධිඇති; පභාවතිං, (මදුරදූ දූවූ) ප්‍රභාවතිය; භජන්තො, සෙවනාවූ; නොහොත් පතන්නාවූ; කුසො, කුසරජතෙම; භත්තකාජං, මුළුතැන්කද; සංහරි, එළවීද; (මුළුදඹදිවට අගරජව මදුරජහු මැඩපියා ප්‍රභාවතිය දාසියක්මෙන් කොට ගෙන්වා පාදපරිචාරිකාකරවන්ට සමර්ථවූ කුසරජතෙම තමන් කායබල ඥානබල නොතකා ප්‍රභාවතීගේම සිත රකිමින් දැඩිඇල්මනිසා සත්මසක් මුලුල්ලේ මුළුතැන්කද ගෙණගියේයයිසේයි) තාය, ඒ ප්‍රභාවතීටත්වඩා; අභිරූපංහි, විශිෂ්ටරූපශ්‍රීඇත්තාමවූ; වරං, පතනලද්දවූහෝ උතුම්වූ; යසොධරං, බිම්බාදෙවිය; හිත්වා, හැරපියා; (යො, යමෙක්:) ගතො, මහබිනික්මන්කෙළේද? සො, හෙතෙම; සුගතො, (යහපත්ගමන් ඇතිහෙයින්) සුගත්මැයි; ගතො එව, සම්බොධියට පැමිණෙනතුරු නැවත හැරී නොආයේමැයි.

106. පුරෙ පුරෙ සඤ්චරි ඛග්ගහත්ථො
වරං පරත්ථීන මනිත්ථිගන්ධො,
සිරිඤ්ච රිඤ්චා' පි න රිඤ්චි නාරිං
හිත්වා' ව තං දානි ගතො තථාගතො.

107. හරිත්තචො රාගබලෙන දෙවියා
අවත්ථලිඞ්ගත න ලිඞ්ග' නුස්සරි,
අසෙවි කාමං තම්දානි කාමං
හිත්වා ගතො සො සුගතො ගතො' ව.

108. අමෙය්‍යකප්පෙසු විවෙකසෙවී
හිත්වා ගතො රජ්ජසිරිං වරිත්ථි,
අඤ්ඤං කලිං වණ්ණයි තං පුරාණං
වත්ථම්හි ඡිද්දං විය තුණ්ණකාරො.

---

106. පුරෙ, පූර්වයෙහි; පුරෙ, (බරණැස්රජහුගේ) අනතඃපුරයෙහි; අනිත්ථිගන්ධො, (ස්ත්‍රීන්ගේ දර්ශනශ්‍රවණස්පර්ශමාත්‍රයකුදු නොකැමතිවූහෙයින්) අනිත්ථිගන්ධනම්කුමරව; පරත්ථීනං, අන්සතු ස්ත්‍රීන්; වරං, පතමින්; ඛග්ගහත්ථො, කඩුගත්අත්ඇත්තේ; සඤ්චරි, හැසිරීල; සිරිඤ්ච, රාජ්‍යශ්‍රීයද; රිඤ්චාපි, හැරපියාත්; නාරිං, තමන්ගත් ඒස්ත්‍රීය; නරිඤ්චි, නොහලේද?/ ඉදානි, දැන්; තං, එසේ ආලයකටයුතුවූ ස්ත්‍රීරත්නය; හිත්වා, හැරපියා; (යො, යමෙක්;) ගතො, මහබිනික්මන්කෙළේද; (සො, හෙතෙම;) තථාගතො (එව), තථාගතමැයි,

107. හරිත්තචො, හරිත්තචනම්බමුණුව; දෙවියා, (බරණැස් රජහුගේ) අගමෙහෙසියගේ; අවත්ථලිඞ්ගත, හැදිවතපහවී ස්ත්‍රී විග්‍රහය දැකීමකරණකොටගෙණ (උපන්නාවූ) රාගබලෙන, අනු රාගබලයෙන්; ලිඞ්ගං, (තමාගේ) ප්‍රව්‍රජ්‍යාලිඞ්ගය; නඅනුස්සරි, සිහිනොකෙළේද; කාමං, විෂයරස; අසෙවි, වින්දේද; ඉදානි, මේ කාලයෙහි; තංකාමං, එබඳුකාමසම්පත්; හිත්වා, හැරපියා; (යො, යමෙක්) ගතො, මහබිනික්මන්කෙළේද; සො, හෙතෙම; සුගතො, (යහපත්ගමන්ඇතිහෙයින්) සුගත්මැයි; ගතොඑව, චතුඃසත්‍යාව බෝධයකරණතුරු නැවත හැරී නොආයේමැයි.

108. (මෙසේ නොයෙක් ආකාරයෙන් කාමයාගේ බලදක්වා දැන් නොයෙක් ජාතිවලදී පිරූපෙරුම් බලයෙන් අනඞ්ගභඞ්ගය දක්වන්නේ “අමෙය්‍යකප්පෙසු” යනාදිය කියන්) අමෙය්‍ය කප්පෙසු, ගණනින් ප්‍රමාණකළනොහැකි කල්පයන්හි; විවෙක සෙවී, විවෙකයසොයනසුලුවූයේ; හෙවත් නෛෂ්කම්‍යපුරන්නේ.

## ජිනාලඞ්කාරය.

109. තදා’ව මත්තවාත ඉදුත’ නඞ්ගා
යසොධරං පග්ගහිතො ධජං’ව,
මත්තො ජිතොම්හී’ති පමත්තබන්ධු
න පස්සි ඤාණාසනිපාතමන්තරං.

110. දිස්වාන දුක්ඛානලසම්භවං භවං
කත්වා තදුප්පාදක නඞ්ග භඞ්ගං,
යසොධරං පීණපයොධරාධරං
හිත්වා ගතො බුද්ධබලප්පදං පදං.

---

රජ්ජසිරිං, (මහාජනකජාතකාදියෙහි කීපරිද්දෙන්) රාජ්‍යශ්‍රීයද; වරිත්ථිං, (හරිත්තචජාතකාදියෙහි කීපරිද්දෙන්) උත්තම ස්ත්‍රීන්ද; හිත්වා, හැරපියා; ගතො, නෛෂ්ක්‍රම්‍යයට ගියේද; පුරාණං, පැරැණිවූ; අණුං, මදවූ; තං, ඒ; කලිං, (හරිත්තචජාතකාදියෙහිදී ස්ත්‍රීන්නිසාවූ) පාපය; නොහොත් අපරාධය; තුණ්ණකාරො, සන්නාලිතෙම; වත්ථෙහි, වස්ත්‍රයෙහි; ඡිද්දංවිය, සිදුරදක්වන්නාක් මෙන්; වණ්ණෙසි, (බුද්ධත්වයට පැමිණ) ප්‍රකාශකළසේක.

109. (මෙසේ බෝසත්හුගේ පුවත් දක්වා දැන් අනඞ්ගයාගේ පුවත් දක්වන්නෝ "තදා’ව මත්තවාත" යනාදිය කියත්) තදාඉව, එකල්හිමෙන්; හෙවත් ඒ කුසජාතකාදියෙහිදී ස්ත්‍රීන් නිසා කාමවසගයෙහි පැවැත්තාක්මෙන්; ඉදුනී, දුනුදු; මත්තවාත, (මොහු මාවසගයෙහි පැවැත්විය හැක්කේයයි) සිතා; පමත්තබන්ධු, මදයෙන් යුක්තවූවන්ටහෝ ප්‍රමාදවූවන්ටබන්ධුවූ; අනඞ්ගො, කාමදෙවතෙම; යසොධරං, යසොධරාදෙවිය; ධජංඉව, (තමන්ගේ ජයභූමියෙහි ඔසවනලද) මකරධ්වජයක්මෙන්; පග්ගහිතො, උස්කොටනගාගත්තේ; ජිතොම්හි ඉති, සිද්ධාර්ථයා මම දිනූවෙමියි; (සිතා) මත්තො, රාගයෙන් මත්වූයේ; ඤාණ, (සර්වාකාරයෙන් කාමරාගානුසය දවා හලුකිරීමට පවා සමර්ථවූ ආදීනවානුදර්ශනා ඥාන නැමැති; අසනිපාත, හෙනපහරගේහීමට; අන්තරං, කාරණය; හෙවත් සතරපූර්වනිමිතිදුක්කීම්නැමැති සිදුර; න පස්සි, නුදුටී.

110. දුක්ඛානල, ජාත්‍යාදිදුක්නැමැති ගින්නෙන්; සම්භවං, උපන්නාවූ; භවං, ආත්මභාවය; දිස්වාන, (ඥානචක්ෂුසින්) දැක; තදුප්පාදක, ඒ සියලුදුක් උපදවන්නාවූ; අනඞ්ග, අනඞ්ගයාගේ; භඞ්ගං, බිඳීම; කත්වා, කොටද; පීණ, පිරුණාවූ; පයොධරාධරං, පියයුරුහා තොල්ඇති; යසොධරං, යසොධරාදෙවිය; හිත්වා, හැර පියා; බුද්ධබලප්පදං, බුද්ධබලදායකවූ; පදං, නිර්වාණයට; ගතො, වැඩිසේක.

## ස න් න ස හි ත.

111. අනන්තසත්තාන මනන්තකාලෙ
මනං ගහෙත්වාන ජිතො අනඞ්ගො,
පරාජිතො නූන හි එකකස්ස
තදා ගතො සො න පුනා ගතො'ව.

112. දිස්වාන ඤාණාසනිපාතමන්තරං
තථාගතො සො න පුනා'ගතො'ව,
තථාගතො සො න පුනා'ගතො'ව
දිස්වා නඤාණාසනිපාතමන්තරං.
(පාදභ්‍යාස යමකං)

---

111. අනන්තකාලෙ, ප්‍රමාණාතික්‍රාන්තකාලයෙක්හි; අනන්තසත්තානං, නොයෙක් සත්වයන්ගේ; මනං, සිත්; ගහෙත්වාන, වසඟකොට ගෙණ; ජිතො, ජයගත්; අනඞ්ගො, අනඞ්ගතෙමේ; (මේකාලයෙහි) එකකස්ස, හුදකලාබෝසත්හට; නූන, එකාන්තයෙන්; පරාජිතොහි, පැරදීයේමැයි; නොහොත් එකකස්ස, හුදකලාබෝසත්හුවිසින්; නූන, එකාන්තයෙන්; පරාජිතොහි, පරදවනලද්දේමැයි; තදා, එකල්හි; හෙවත් (රාජභවනයෙහිදී න[illegible]ගනන්ගේ විප්‍රකාර දැක සංවෙගයට පැමිණ අද්‍ය පැවිදිවෙමියි යහනින් නැගී බෝසතුන් දැක යම්කාලෙක්හි පහවගියේද) එකල්හි; ගතො, (මේබෝසත් මටවසඟ නොවෙයි සිතා බෝසතුන් හැරපියා) ගියාවූ; සො, ඒරතිපතිතෙම; පුන, නැවත; න ආගතො එව, (බෝසතුන් කරා) නොආයේමැයි.

112. ඤාණ, නිර්විදනුදර්ශීඥාන නැමැති; අසනිපාත, හෙනපහරහීමට; අන්තරං, අවකාශයක්; දිස්වාන, දැක: තථාගතො, (පැවිදිවෙමියි යහනින් නැගී බෝසතානන් දැක නැවත නොපැමිණෙනපරිද්දෙන් යම්සේ ගියේද) එසේගියාවූ; සො, ඒකාමදෙව්තෙම; පුන, නැවත: න ආගතො එව, නොආයේමැයි; නඤාණ, සම්මොහනැමැති; අසනිපාත, හෙනපහරහීමට; අන්තරං, අතරක්; හෙවත් මුළාවීමට හේතුවූ කාමක්ලෙශයන්; දිස්වා, දැක; තථාගතො, (පූර්වයෙහි ක්ලෙස රාජ්‍යසම්පත් හැරපියා යම්සේ ගියේද) එසේ ගියාවූ; සො, ඒබෝසත්තෙම, පුන. නැවත; න ආගතො එව, නොආයේමැයි; හෙවත් බුද්ධත්වයට පැමිණෙනතුරු නැවත පෙරලා නොවැඩියේමැයි.

(මෙසේ අනඞ්ගභඞ්ගය කොට ගොස් පැවිදිවූ බැව් දක්වා සමහර පැවිද්දෝ ප්‍රව්‍රජ්‍යාකෘත්‍යය සිදුකරගතනොහැකිව ගිහිවෙති, මුන්වහන්සේගේ ගමන සාර්ථකවීයයි දක්වන්නෝ "**ද්විපාදභ්‍යාස යමකය**" කියත්.)

## ජි නා ල ඞ්කා ර ය.

113. තථා ගතච්ඡෙර මහොසි තස්ස
තථා හි මාරොපි තදා’ හ සන්තිං,
තථා හි මාරොපි තදා’ හ සන්තිං
තථා හි මාරොපි තදා හ සන්තිං.
(තිපාදබ්භාස යමකං)

---

113. තස්ස, ඒබෝසත්හුගේ; තථාගතං, (යම්සේ නසනලද අභාවගතෙම නැවත තමන්කරා පෙරලානොඒද) එසේකොට යාම; අච්ඡෙරං අහොසි, ආශ්චර්ය්‍යයෙක්වී; (මෙබඳු විස්මයජනක ආශ්චර්ය්‍යයෙක් ලොවකිසිතැනක නැත්තේය යනුභාවයි.) තථාහි, එසේම; ආරොපිත, (බෝමැඩවැඩහිඳ ස්වසන්තානයෙහි) ආරොපණයකළ; දාහසන්ති, (කෙලශදාහනිවන්නාවූ ශාන්තිපදයයි කියනලද) නිර්වාණය; අච්ඡෙරං අහොසි, විස්මයෙක්වී; නොහොත් ආරොපි, (යටකීපරිද්දෙන් සකලසම්පත්හැරගොස් ස්වසන්තාන පරසන්තානයන්හි යමක්) ආරොපණයකළසේක්ද; තං. ඒආරොපණයකරණලද්ද; සන්ති, ශාන්තියයි; ආහ, කීද; අච්ඡෙරං, ඒද ආශ්චර්ය්‍යයෙක්වී; තථාහි, එසේම; තදා, (යම්කල කාමහබෝසත් අනඞ්ගභඞ්ගයකොට මැදුම්යම්හි මහබිනික්මන් කෙළේද) එකල්හි; මාරොපි, මරදෙව්පුත්‍රපවා (කඩුගත්අත්ඇතිව අහස්කුසසිට) සන්තිං, ශාන්තිගුණය; ආහ, කීද; හෙවත් (මහපුරුෂය! ඉතෝ නොනික්මෙව අදින් සත්වෙනි දවස්හි තට සක්විතිරජය ලැබෙන්නේයයි) කීද; අච්ඡෙරං,(ඒද) ආශ්චර්ය්‍යයෙක්වී; තථාහි, එසේම; තදා, (යම්කලක කිරිපලුරුක්මුල වැඩහුන් බුදුන් කරා පැමිණි මාරදූවරු නොයෙක්රූමවා හිමියානෙනි! නුඹගේ පාපිරිමඩිමුදූයි සිනාමුසුබසින් යුක්තව කාමපාශයෙන් බඳින්ට තැත්කළෝද) එකල්හි; හසන්තිං, (රාගීන්විසින් ඇලුම්කටයුතු ලෙසින්) සිනාසෙන්නාවූ මාරදූන්; මාආරොපි, (ස්වකීයසන්තාන යෙහි) ආරොපණය නොකෙළේද? හෙවත් ඔවුන්කී එකදබස කුත් සිතටනොගත්තේද; අච්ඡෙරං, (ඒමාරදූන්ගේ බස්පිළිනො ගැණිමද) ආශ්චර්ය්‍යයෙක්වී: (මෙසේ පිරිසිදුසිත්ඇතිබෝසතානන් එබඳුසත්‍රීරත්නයක්වූ බිම්බාදෙවිය හැරපියා පාදොද්ධරණයකොට ගියගමන ඉතාආශ්චර්ය්‍යයෙක්මැයි යනුභාවයි).

(මෙසේ බෝසත්හුගේ මහාභිනිෂ්ක්‍රමණයෙහි ආශ්චර්ය්‍යාද්භූත භාවය දක්වා දූත් අනුසයසහිත අනඞ්ග භඞ්ගය දක්වන්නෝ නන්දියාවර්තා ත්‍රිපුෂ්කල සිංහවික්‍රීඩිත යන ත්‍රිවිධවිශෙෂනයෙන් ගෙබියාවූ ආස්වාද–ආදීනව–නිඃසරණ–ඵල–උපාය–ආඥාවශයෙන්

## ස න් න ස නි ත.

114. සකාමදුතා විනයා මන්නානගු
සකාමදුතා විනයා මනන්නාගු,
සකාමදුතා විනයා මනන්නාගු
සකාමදුතා විනයා මනන්නාගු.
(දුෂ්කරබන්ධනමහායමකං)

---

සවැදෑරුම්වූ භගවත්හුගේ විශිෂ්ටතර ධර්මදෙශනාක්‍රමයද අනුලෝමනයකොට දක්වනුසඳහා "සකාමදුතා" යනාදි දුෂ්කරබන්ධන මහායමකය කියත්, මෙහි පදාර්ථ යථාර්ථවශයෙන් දක්වීම අතිප්‍රපඤ්ච හෙයිනුත් මෙබඳු පදාර්ථ ව්‍යාඛ්‍යානාවසරයෙහි විස්තරාර්ථ දක්වීම විදග්ධානුචිතවනහෙයිනුත් පිණ්ඩාර්ථය පමණක් සැකෙවින් දක්වමු).

114. සො, (දීපඞ්කරබුදුන්හමුවෙහි ලත්විවරණ ඇති) ඒ බෝසත්තෙම; මනන්නාගු, නිඃසරණාධ්‍යාශයඇත්තේ; හෙවත් අනුපාදාපරිනිර්වාණය ඇතැයි දන්නේ හෝ සකලසත්වයන් සසරදුකින් මුදා නිවන්පමුණුවාලීමට අදහස්ඇත්තේ; විනයා, කායවාඞ්මනඃ යන ත්‍රිවිධ චාරිකකර්මයන් පිරිසිදුකිරීම් හෙතුවෙන්; (චාරත්‍රයෙහි උපදනා පාපයන්ගේ ප්‍රහානය පිණිසයයි සේයි) සකාමදුතා, තමාසතුවස්තුසහිතශරීරාවයවහා ජීවිතයද පුදන්නේ; අදුනා, (පාරමිධර්මයන්) ගත්සේක; හෙවත් පිරූසේක; (මෙසේ පළමුගාථාපදයෙන් බෝසත්හුගේ සත්වයන්සසරින් ගොඩලීමෙහි අදහසද තදනුරූපවූ ප්‍රාර්ථනාවද තදනුරූපවූ පාරමිතාපූරණයද දක්වා දූන් යමක් පිණිස උත්සාහ කොළේද ඒ සමෘද්ධවූබැව් දක්වන්නේ එමගාථාපාදය දෙවෙනිවද කියත්) සො, (දීපඞ්කරබුදුන් හමුවෙහි ලත් විවරණ ඇති) ඒබෝසත්තෙම; සකාවදුතා, තමාසතුවස්තුසහිතශරීරාවයවහා ජීවිතයද පුදන්නේ; විනයා, (නන්දියාවර්තාදිවිශෙෂ) ක්‍රමයන්ට අනුරූපවශයෙන් ප්‍රයාණය කොට; හෙවත් සත්තිස්බොධිපාක්ෂිකධර්මයන් රැස්කරමින් මාර්ගපටිපාටියෙන් ගොස්; මනන්නාගු, (තමන් ගත්) නිඃසරණාධ්‍යාශයාගේ කෙළ පැමිණියේය; (යම් නිඃසරණාධ්‍යාශයකින් පාරමිධර්මයන් පිරූද ඒ නිඃසරණාධ්‍යාශයෙන්ම සොපධිශෙෂ-නිරුපධිශෙෂ යන නිර්වාණධාතූන්ගේද ප්‍රතිලාභය කෙළේයයි සන්දර්ශිතයි). (මෙසේ දෙවෙනිපාදයෙන් ස්වකීයකල්පනාවට අනුරූපප්‍රතිලාභය කළබව දක්වා දූන් තන්නිශ්‍රයවූ චිත්තවිමුක්තියහා ප්‍රඥාවිමුක්තිය දක්වන්නේ එමගාථාපාදය තෙවෙනිවද කියත්) සො, (දීපඞ්කරබුදුන්හමුවෙහි ලත්විවරණ ඇති) ඒබෝසත්තෙම; සකාම, කාමතෘෂ්ණාසහිත සකලකෙලශයන්; අදුනා, භක්ෂණය කරන්නේ හෝ නසන්නේ; නොහොත් ස, ස්වකීයසන්තානයෙහි; කාම,

ජි නා ල ඞ්කා ර ය.

115. රවේ රවෙ රොරහිමා රවෙ රවෙ
රවෙ රවෙ රෙරිව හෙ රවෙ රවෙ,
රවෙ රවෙ සූදිත ගාරවෙ රවෙ
රවෙ රවෙ දෙසි ජිනොරවෙ රවෙ.
(අව්‍යපෙතආද්‍යන්තයමකං)

ක්ලේශයන්ට; අදුනා, ප්‍රවෙශවීමට නුදුන්නේ; විනයා, (නන්දියාවර්තනාදි) විවිධක්‍රමයෙන් පිළිපදිමින්; හෙවත් විද්‍යාසාක්ෂාත්කරණයෙන් වාසනානුසයන්සහිත අනඞ්ගභඞ්ගය කොට අභිත්ඵලයෙන් ආශ්‍රවයන් ප්‍රතිප්‍රශ්‍රබ්ධණය කොට විමුක්තිඥානදර්ශනයෙන් ඒආශ්‍රවයන් ප්‍රත්‍යවෙක්ෂාකොට; අනන්තාගු, පැමිණිසර්වඥතාඥාන ඇත්තේවී; (මෙහි සමාධියකරණකොටගෙණ ක්ලේශයන්ගෙන් මිදුනහෙයින් චිත්තවිමුක්තියටද ප්‍රඥාවකරණකොටගෙණ සංස්කාරාලම්බනයෙන් මිදුනුහෙයින් ප්‍රඥාවිමුක්තියටද පැමිණ සර්වඥවීයයි සේයි) (මෙසේ බොධිසත්වයන්ගේ ක්ලේශප්‍රහාණයද ප්‍රහීනවූ ක්ලේශකාලුෂ්‍යය ඇතිහෙයින් අතිපරිශුද්ධවූ සර්වඥතාඥානයද තත්ලාභයෙන් බුද්ධභාවයද දක්වා දූන් සත්වයන්ට හිතපිණිස පවත්වන දෙශනාවිලාසය දක්වන්නෙහු එමගාථාපාදය සහරවෙනිවද කියත්). සො, (දීපඞ්කරබුදුන්හමුවෙහි ලත්විවරණ ඇති) ඒ බෝසත්තෙම; අනන්තාගු, පැමිණි සර්වඥතාඥාන ඇත්තේ; විනයා, (නන්දියාවර්තනාදි) විශිෂ්ට ක්‍රමයෙන්; කාමදුනා, (විනෙයජනයන්ට) අභිමතවූ සම්පත් දුන්සේක.

115. (මෙසේ භගවත්හු අනුසයසහිතවූ ස්වකීයඅනඞ්ගභඞ්ගය අනෙකප්‍රකාරයෙන් කළබව දක්වා දූන් තමන්වහන්සේගේ වචනකාරීන්ගේද අනඞ්ගභඞ්ගයකළබැව් දක්වන්නෝ "රවෙ රවෙ" යනාදිය කියත්) අභිමාර, මරදෙව්පුත්හුගේ; වෙරවෙ, (බෝමැඩදී තමන්වහන්සේ සමග කළාවූ) යුද්ධයෙහිදී කියනලද. රවෙ, "මනුස්සකාලෙ ජාතො" යනාදිපරුෂවචනයෙහිලා; අවෙරො, වෛරනොකළාවූ හෝ ඉවසාවදාළාවූ; ජිනො, සර්වඥතෙම; වෙරෙ, වෛරීවූ රාහුඅසුරිඳුන් පැමිණෙනකල්හි; රවිර්රංඉව, (බියෙන් තැතිගත්) හිරුගේ කම්පාවීමමෙන්; හෙරවෙ රවෙ, (ආපායිකභයදර්ශනයෙන්) බියකරුරාවපවත්වන්නාවූ; රවෙ රවෙ, (තමන්වහන්සේ) වදාළවදාළනාක්ධර්මයෙහි; සූදිත, මනාවප්‍රකාශකළ; ගාරවෙ රවෙ, ගෞරවවචන පැවැත්වූ; හෙවත් (භගවත්තෙම අපට දහම්දෙසනසේක්වා සුගත්තෙම අපට දහම්දෙසනසේක්වා ඒ මේධර්මය හිතවැඩ පිණිසවන්නේයයි) යහපත් ගෞරවවචනපැවැත්වූවන්ට; හෙවත් විනෙයජනයන්ට; ඔරවෙරවෙ, මෘෂාවාදදිපාපධර්මයන් තොරකොටඇති; හෙවත් කුශලසන්දීපකවූ; රවෙ, ශ්‍රියධර්මය; අවෙදෙසි, (යටදූක්වූ නියායෙන්) දෙශනාකළසේක.

## ස න් ත ස හි ත .

116. ලෝකායාත තයා කාලෝ විසෙසං නත සංසෙවි,
විසෙසං නත සංසෙවි ලෝකා යාත තයා කාලෝ.
(පටිලෝමයමකං)

117. රාජරාජයසොපෙතවිසෙසං රචිතං මයා,
යාම තං චිරසංසෙවි තපෙසො ය ජරාජරා.
(පටිලෝමයමකං)

---

116. (මෙසේ භගවත්හුගේ අනුසයසහිත අනඞ්ගභඞ්ගය වර්ණනාකොට දැන් නිරුපධිශෙෂනිර්වාණධාතුව වර්ණනාකරන්නෝ "**ලෝකායාත**" යනාදි ප්‍රතිලෝමයමකය කියත්) [භගවා! භාග්‍යවතුන්වහන්ස!) තයා, තුඹවහන්සේ විසින්; ලෝකෙ, සර්ව ලෝකයෙහි; ආයාතො, උපදනාලද; කාලො, කාලයතෙම; (බෝසත්ව උපන්කාලයහා බුදුවවැඩවිසූකාලයයි සේයි). විසෙසං, ස්වපර හිතකරණයෙන්) විශෙෂයක්; නත, අත්‍යර්ථයෙන්; සංසෙවි, (යම් සේ) සෙවීද; (එසේම) තයා, තුඹවහන්සේවිසින්; ලෝකා, සර්ව ලෝකයෙන්; යාතො, නික්මයනලද; කාලො, කාලයද; (අනුපාදා පරිනිර්වාණධාතුවට පැමිණිකාලයයි සේයි) විසෙසං, (දෙසූ දහම් පන්දහසක්හවුරුදුමුලුල්ලෙහි දෙව්මිනිසුන්ට හිතසැපඑළවනහෙයින්) විශෙෂයක්; නත, අතිශයින්; සංසෙවි, සෙවිතේයි.

117. (මෙබඳු ස්වරූපවූ භගවත්හු සරණකොට යෙමියි දක්වන්නෝ දැන් "රාජ රාජ" යනාදි ප්‍රතිලෝමයමකය කියත්) රාජරාජ, (කෙළදහසක්සක්වළ තමන් අණසක්පවත්වා බුඩරාජ්‍යයට පැමිණි හෙයින්) රාජාධිරාජභාවයෙන් ලද්දවූ; යසොපෙත, "**ඉතිපිසො භගවා අරහං**" යනාදි ගුණකීර්තියෙන් යුක්තවූ; යං විසෙසං, (අන්‍යයන්ට සාධාරණනුවූ) යම් ගුණවිශෙසයක්; මයා, බුඩරක්ෂිතාචාර්‍යවූ මාවිසින්; රචිතං, (දීපකරූපකාදි අලඞ්කාරම යවූ අක්ෂරපදයන්ගෙන් සරසා) රචනාකරණලද්දේද; හෙවත් ජිනාලඞ්කාරනම් ග්‍රන්ථය කරන්නාවූ මාවිසින් යම්ශ්‍රෙෂ්ඨතර බුඩ ගුණසමූහයෙක් වර්ණනාකරණලද්දේද; එසො, මේ මම; තං, ඒ බුඩගුණද; චිරසංසෙවි තපො, බොහෝකල් සෙවිනාලද තපස්ඇති; තං, ඒභගවත්හුද; ආඅජරා, නිවන්පැමිණීමදක්වා; යාමි, පිළිසරණකොට යෙමි; (බුදුන්සරණගතවූඒමට අනතරායෙක් නොවේවා යනු භාවයි) (යමකසංරක්ෂණය පිණිස "යාමි" යන්නෙහි ඉකාර ස්ථානයට අකාරාදෙශයි) නොහොත් එසො, මේ මම; තංචිරසං සෙවිතපං, ඒභගවත්හුවිසින් චිරකාලසෙවිතවූ තපස; අජරං, නොදිරීමකොට; (ජාතියක් ජාතියක්පාසා අලුත් අලුත්කොටයයි සේයි) ආඅජරා, නිවන්යාමදක්වා; යාමි, පැමිණෙමි; හෙවත් රක්ෂාකරමි.

## ජිනාලඞ්කාරය.

118. ආකඞ්ඛාකඛ! අකඞ්ඛාඞ්ග! කඞ්ඛාගඞ්ගාසගාහක!
කාඞ්ඛාගාහක! කඞ්ඛාස! භාගා කඞ්ඛා කහං කහං.
(කණ්ඨට්ඨානිකා)

119. අපගබ්භො අපගබ්භො අමොහො මාපමොහකො,
අග්ගමග්ගමුඛං මොක්ඛං අඞ්ග මාහ මුහක්ඛමං.
(ඔට්ඨා නි කා)

120. පාපාපාපභවං පස්සං පාපාපාපභවුග්ගතො,
පාපාපාපභවා නඞ්ගා පාපාපාපභවා ගතො.
(ති ට්ඨා නි කා)

---

118. (මෙසේ භගවත්හු සරණකොටගෙණ දූත් නිග්‍රයන්ගේ ව්‍යාමිශ්‍රවශයෙන් ගුණවර්ණනාකරණ්නුවෝ ව්‍යඤ්ජනයන්ගේ වශයෙන් දුෂ්කරග්‍රන්ථනයක් කරන්නෝ "ආකඞ්ඛාකඛ" යනාදිය කියත්). ආකඞ්ඛා, ආකාඞ්ක්‍ෂාප්‍රතිබද්ධඅනාවරණඥානයයි කියනලද; අක්ඛ! ඉඳුරන්ඇති; අකඞ්ඛ, සැකනසනලකුණුවලින්යුත්වූ; අඞ්ග, ශ්‍රීශරීරඇති; (මොහු ඒකාන්තයෙන් බුදුහුයයි දුටුවන් සැකහරණ අසූඅනුව්‍යඤ්ජනයෙන් පරිපූර්ණදෙහඇත්තේයයි සේයි) කඞ්ඛා, (අනාගතයන්විෂයෙහි පවත්නා ස්කන්ධාත්පත්තියපිළිබඳවූ) සැක නැමැති; ගඞ්ගාස, ගඞ්ගාසැඩපහර; අගාහක! නොගන්නාවූ; හෙවත් අර්හත්මාර්ගඥානයෙන් නසන්නාවූ; කඞ්ඛාගාහක, (බුද්ධාදි අටතැනෙක්හි) සැකගත්ජනයාගේ; කඞ්ඛාස! සැකනසන්නාවූ; භාග්‍යවතුන්වහන්ස! කහං කහං, (සංස්කාරවිකාරලක්‍ෂණනිර්වාණප්‍රඥප්තියයන මොවුන්අතුරෙන්) කොතැන්හි කොතැන්හි; කඞ්ඛා, (යටදක්වූගුණයෙන්සමුපේතනුඹවහන්සේතුළ) සැකයෙක් වේද? නොවේමැයි; නොහොත් කහං කහං, මෙබඳුවූ නුඹවහන්සේකෙරෙහි හෝ සංස්කාරවිකාර ලක්‍ෂණනිර්වාණප්‍රඥප්තියයන මොවුන්කෙරෙහි හෝ කොතැන්හි කොතැන්හි; කඞ්ඛා, (මාතුළ) සැකයෙක් පවතීද (නුඹවහන්සේ අනාවරණඥානඇත්තෙක් හෙයින් කිසි තැනෙක්හි සැකයෙක් නොපවත්නේමැයි).

119. අපගබ්භා, පහවූභවඇති; අපගබ්භා, කායප්‍රගල්භාදියෙන් අපගතවූ; අමොහො, (අනාගතයන්මෙන් ස්කන්ධෝත්පත්‍යාදියෙහිලා) මුළානොවන්නාවූ; මාපමොහකො, (කුහනලපනාදියෙන් අන්‍යයන්ද) මුළානොකරන්නාවූ; භගවත්තෙම; අග්ගමග්ගමුඛං, අර්හත්මාර්ගද්වාරයෙන් පැමිණියයුතුවූ; මොක්ඛං, මෝක්‍ෂය; ආහ, වදාළේය; මුහක්ඛමං, මුළාවවැඩෙන්නාවූකථාවක්; මා ආහ, නොවදාළේක.

120. පාපාපාපභවං, ලාමකාලාමකවූකර්මභවයාගේ උත්පත්තිය; පස්සං, (විදර්ශනාඥානයෙන්) බලමින්; පාපාපාපභවා, ලාමකාලාමකවූ උත්පත්තියෙන්; උග්ගතො, නැංගේ; නොහොත් පාපාපාපභවා, ලාමකාලාමකවූ උත්පත්තිහෙතුවෙන්; උග්ගතො, පතළකීර්තිඇත්තේ; පාපාපාපභවා, ලාමකාලාමකවූ සම්භවය ඇති; අනඞ්ගා, කාමදේවයාගේවාසස්ථානවූ; පාපාපාපභවා, ලාමකවූ සංසාරෝත්පත්තියෙන්; ගතො, (පහව) ගියේය; හෙවත් නිරුපධිශේෂනිර්වාණධාතුවට පැමිණියේය.

## ස න් න ස ඞ් ත .

121. කුසලාකුසලං පස්සං කුසලාකුසලෙ වජී,
කුසලාකුසලා භඞ්ගා කුසලාකුසලා චුතො.
(ච තු ට්ඨා නි කා)

122. නො'නානිනො නනූනානි නානෙනානි නනානිනො,
නූනානෙනානි නූනනන නානනනනානනෙන නො.
(නකාරව්‍යඤ්ජනොත්තරිකා)

123. සාරෙ සුරාසුරෙ සාරී රසසාර සරිස්සරො,
රසසාරරසෙ සාරී සුරාසුර සරස්සිරෙ.
(සකාරරකාරව්‍යඤ්ජනොත්තරිකා)

---

121. කුසලාකුසලං, සුකෘතදුෂ්කෘත කර්මයන්; පස්සං, (ඥත-තීරණ-ප්‍රහාන යන ත්‍රිවිධපරිඥාවෙන් පිරිසිඳ) දක්නේ; කුසලාකුසලෙ, කුසල් අකුසල්; වජී, හළේය; කුසලාකුසලාභඞ්ගා, කුශලාකුශලකර්මයන්ගේ ආලයහැරපීමෙන්; කුසලාකුසලා, කුසල්අකුසල් පිළිබඳභවවෘත්තායෙන්; චුතො, මිදුනුසේක; හෙවත් නිරුපධිශෙෂනිර්වාණධාතුවට පැමිණිසේක.

122. නො, අපගේ; අනානිනො, ස්වාමිවූ භාග්‍යවත්හුවිසින්; ඌනානි, නුපුරණලදහෝ සම්පූර්ණ නොකරණලද; අනෙනානි, කුශලධර්මකෙනෙක්; නන, අනෘජියෙන්; න, නැත්තාහ; (අප ස්වාමිවූ භාග්‍යවත්හට සියලුමකුශලධර්මයෝ සම්පූර්ණවූහයි සේයි) නඅනානිනො, අපස්වාමිවූ භගවත්හුවිසින් නොවපරසමයවාදීන් ගේ දෙවිවූ මහාදෙවාදීන් විසින්; නූනානි, හරණලද; එනානි, පාපධර්මකෙනෙක්; නූනං, එකාන්තයෙන්; න, නැත්තාහ; (ඔවුන්ට සියලුමපාපධර්මයෝ සම්පූර්ණවූහයි සේයි) (එසේහෙයින්ම) නං ආනනං, (මහාදෙවාදීන්ගේ) ඒප්‍රකෘතිමුඛයමහෝ දෙශනාමුඛය; නො, අපගේ; අනානිනො, භාග්‍යවත්හුගේ; ආනනෙන, ප්‍රකෘතිමුඛයසහිත දෙශනාමුඛයහා; න, (කිසිලෙසකින් සමකරන්ට) නොපිළිවන්වෙයි.

123. රසසාර, නවලොකොත්තරරසනැමැති; හෙවත් නිර්වාණ නැමැති; සර, තඩාගයට; ඉස්සරො, අධිපතිවූ; සාරෙ, (ශ්‍රීසද්ධර්මයට භාජනභාවයෙන්) උතුම්වූ; සුරාසුරෙ, දෙවියන්හා අසුරයන්; සාරී, නිවන්පමුණුවනසුලුවූ හෝ දිව්‍යාසුරයන්ට සද්ධර්ම සිහිකරවන සුලුවූ; (භගවත්තෙම) රසසාර, (තමන් පැමිණි පරිපූර්ණරසයෙන් සාරවූ) නිර්වාණනැමැති තඩාගයාගේ; රසෙ, අමාරසය; සුරාසුර, දෙවියන්හා අසුරයන්ගේ; සර, සන්තානනැමැති තඩාගයාගේ; සිරෙ, මස්තකයෙහි; සාරී, හැසිරවූසේක; හෙවත් දිව්‍ය අසුර යන මොවුන්ගේ සිත් නිවන්නැමැතිවිලට නතුකරවූසේක.

## ජි නා ල ඞ්කා ර ය.

124. දෙවානං නන්දනො දෙවො දෙවදෙවෙ න නන්දිතො,
වෙදදීනෙන වෙදෙන වෙදි වෙදෙන වෙදිනො.
(දකාරවකාරනකාරව්‍යඤ්ජනාක්ඛරිකා)

125. දෙවාසනෙ නිසින්නො සො දෙවදෙවො ස සාසනෙ,
නිසින්නානං සදෙවානං දෙසෙසි දස්සනාසනං.
(දකාරවකාරසකාරනකාරව්‍යඤ්ජනොත්තරිකා)

126. දසනාවාගතො සඤ්ඤා අන්ධස්ස තමන්දො රවි,
අට්ඨමා පුණ්ණසඞ්කප්පො පාතු' නඤ්ඤං මනඤ්ඤිව,
(පහෙලිකා)

---

124. දෙවානංනන්දනො, දෙවියන් සතුටුකරන්නාවූ; දෙවො, සක්දෙව්රජ; වෙදදීනෙන, (තමන්ගේ) ප්‍රඥාදුර්වලත්වයකාරණකොට ගෙණ; නො, අපගේ; දෙවදෙවෙ, බුදුන්කෙරෙහි; න නන්දි, නො සතුටුවිය; (භගවත්හු විජම්දෙසනුපිණිස තිදසපුරවැඩ පඬුපුල්ස ලස්නෙහි හුන්කල්හි මාගේ අස්නඉතාමහත බුදුහු කුඩාවෙති එ හෙයින් නොහොබිතියි නුවනමදබැවින් සිතා සක්දෙව්දු නොස තුටුවිය යනු භාවයි) වෙදිනො, සර්වඥතාඥානයඇති භාග්‍යවත්හු ගේ; වෙදෙන, ප්‍රඥාමහිමයහෙතුකොටගෙණ; වෙදෙන, (සක්දෙව් දුගේ) නුවනින්; වෙදි, (බුඬමහිමය) දත්තේය; (භාග්‍යවතුන්ව හන්සේ චෙතොපර්‍ය්‍යාය ඥානයෙන් ඔහුගේ අදහස් දැන සියලු සලස්නවසා සිටි බැවින් බුදුහු මහානුභාවසම්පන්නයෝහයි සක් දෙව්දුම තමාගේ නුවනින් පසුව දත්තේය යනු භාවයි).

125. දෙවාසනෙ, සක්දෙව්දුගේ පඬුපුල්සලස්නෙහි; නිසින්නො, වැඩහුන්නාවූ; දෙවදෙවො, දෙවාතිදෙවවූ; සො, ඒභග වත්තෙම; සසාසනෙ, තමන්වහන්සේගේ සස්නෙහි; නිසින්නානං, (සද්ධර්මයටභාජනවශයෙන්) හුන්නාවූ; සදෙවානං, දෙවියන්සහිත බ්‍රහ්මයන්ට; දස්සනාසනං, ඥානදර්ශනසඞ්ඛ්‍යාතභොජනය; දෙසෙසි, දක්වාවදාළේය.

126. දසනාවාගතො, (දසනඤ්ච දසනාවඤ්ච යන වනමස මාසවිෂයෙහිසවරූපෙක්ෂයෙෂයි) දනෙනාජාත්‍යක්ෂරවශයෙන් පැමි ණියාවූ; සඤ්ඤා, සංඥාඇත්තේ; හෙවත් නමක්ඇත්තේ; (සේ කවරෙක්දයත්? බුද්ධො යනුයි) (මේ බුඩයන නම් ඇත්තේ) අන්ධස්ස, මොහයෙන් අඳුවූ සියලුලොකයාගේ; තමඅන්දො, අඳුරු දුරුකරන්නාවූ; රවි, ලහිරුමෙන්ද; අට්ඨමා, සංසාරපීඩා නසන් නේ හෝ සංසාරනැමැති රොගය නසන්නේ; පුණ්ණසඞ්කප්පො, පරිපූර්ණවූකල්පනා ඇත්තේ; හෙවත් වීතරාගීවූ භගවත්තෙම අනඤ්ඤං, (තමන්ගේම පිහිටනකා පැමිණි බුඩරක්ෂිතාචාර්‍ය්‍යවූ) මා; අනඤ්ඤං ඉව, තමන්වහන්සේ මෙන්; පාතු, (සකලොපද්‍රව යන්ගේ නිරාකරණයෙන්) රක්ෂාකරණසේක්වා.

## ස ත් ත ස ති ත.

127. එකන්ත මෙව සපරප්පරො විහෙසී
එකන්ත මෙව දසපාරමිතාබලෙන,
එකන්ත මෙව හතමාරබලෙන තෙන
එකන්ත මෙව සුවිසුද්ධ මලත්ථ බොධිං.
(පාදදිඅව්‍යපෙතයමකං)

128. ඔරොහිතො' රොහිතපාපධම්මො
ජනෙනන සඤ්ජනනහයෙන ගන්ත්වා,
අනොමතීරමහි අනොමසත්තො
අනොමපබ්බජ්ජ මුපාගතො සො.

129. නිරාමිසං පීතිසුඛං අනුපමං
අනුපියෙ අම්බවනෙ අලත්ථ,
සරූපසොභාය විරූපසොභං
* සරාජකං රාජගහං කරිත්ථ.

---

127. එකන්තමෙව, අත්‍යන්තයෙන්ම; සපරප්පරො, ස්වෑපී පරාපීඩෙන්හි නියැලිවූ; මහෙසි, මහත්වැඩක්සොයනසුලුවූ; (බොධිසත්වතෙම) එකන්තමෙව, අතිශයින්ම; තෙන දසපාරමිතාබලෙන, ඒදසපෙරුම්බලයෙන්; එකන්තමෙව, එකාන්තයෙන්ම; හතමාර බලෙන, පස්මරුන්ජයගත්බලයෙන්; හෙවත් මරසෙන්නැසීම කරණකොටගෙණ; සුවිසුද්ධං, අතිශයින් පිරිසිදුවූ; බොධිං, සම්‍යක් සම්බොධිය; එකන්තමෙව, අත්‍යන්තයෙන්ම; අලත්ථ, ලැබූසේක.

128. (මෙසේ අනඞ්ගභඞ්ගයකොට ගොස් කළකටයුතු දක්වන්නෝ "ඔරොහිතො" යනාදිය කියත්) ඔරොහිතො, (සප්තභූමකසුරම්‍යනම් ප්‍රාසාදයෙන්) අවතීර්ණවූ; ඔරොහිත, හරණලද; පාපධම්මා, අකුශලධර්මඇත්තාවූ; අනොමසත්තො, අලාමකළුසාහඇති; නොහොත් සම්බොධිසමධිගමයෙහි ආසක්තවූ; සො, ඒබෝසත්තෙම; ජනෙනන, ජනනනම් ඇමතියා විසින්; සංජනනහයෙන, සැරසූඅසුපිටින්; ගන්ත්වා, ගොසින්; අනොමතීරම්හි, අනොමානම්ගංතෙරදී; අනොමපබ්බජ්ජං, (අන්‍යයන්ට අසමාන ප්‍රව්‍රජ්‍යාවක් හෙයින්) අලාමකවූ ප්‍රව්‍රජ්‍යාවට; උපාගතො, පැමිණියේය.

129. අනුපියෙ, අනුපියනම්වූ; අම්බවනෙ, ආම්‍රවනයෙහිදී; නිරාමිසං, (සතියක්ම) නිරාහාරයෙන් යුක්තව; අනුපමං, නිරුපමවූ: පීතිසුඛං, (ප්‍රව්‍රජ්‍යාවෙන් ලත්) ප්‍රීතිසුවය; අලත්ථ, වින්දේය; සරූපසොභාය, ස්වකීයරූපශොභාවෙන්; සරාජකං, ශොභාමත්වූ; රාජගහං, කුසුමපුරය; විරූපසොභං, විගතවූරූපශොභා ඇත්තක්නු මෙන්; කරිත්ථ, කෙළේයි.

---

* "සරාජිකං" යනු සමහර.

130. තතො අලාරුද්දකතාපසානං
ඣානෙන' සන්තුට්ඨමනො විහාය,
මහාපධානායු රුවෙල භූමිං
ගතො සිඛාප්පත්තමකාසි දුක්කරං.

131. න කාමතො නෙ' ව' ති දුක්කරම්හා
සබ්බඤ්ඤුතං සිජ්ඣති මජ්ඣිමාය,
ඤත්වාන තං පුබ්බගුණොපලද්ධං
ධම්මං සමානෙතු මගා සුබොධිං.

132. යසොධරං පීණපයොධරාධරං
අනඞ්ගරඞ්ගද්ධජභූත මඞ්ගං,
විහාය සෙට්ඨත්ත මුපාගතං තං
න පූජයෙ කොහි නරො සචෙතනො.

**ඉති සාධුජනානන්දනනිදානෙ ජිනාලඞ්කාරෙ
මහාපධානදීපනීගාථා නිට්ඨිතා.**

---

130. තතො, ඉක්බිති; අලාරුද්දක, ආලාරය උද්දකය යන නම්ඇති; තාපසානං, තව්සන්දෙදෙනාගේ; ඣානෙන, (ලෞකික) ධ්‍යානයෙන්; අසන්තුට්ඨමනො, නොසතුටුසිත්ඇතිව; විහාය, (ඒධ්‍යාන) හැරපියා; මහාපධානාය, මහාප්‍රධානවීය්‍ය්‍යීකරණුපිණිස; උරුවෙලභූමිං, උරුවෙල්දනව්පෙදෙසට; ගතො, වැඩිසේක්; දුක්කරං, දුෂ්කරක්‍රියා; සිඛාප්පත්තංඅකාසි, මස්තකප්‍රාප්තකෙළේයි.

131. සබ්බඤ්ඤුතං, සර්වඥතාඥානය; කාමතො, කාමසුඛල්ලිකානුයොගයෙන්; නසිජ්ඣති, සිදුනොවෙයි; අතිදුක්කරම්හා, ආත්මක්ලමථානුයොගයෙනුදු; නසිජ්ඣති එව, සිදුනොවේමැයි; මජ්ඣිමාය, මධ්‍යමප්‍රතිපදාවෙන්: සිජ්ඣති, සිදුවේයයි; ඤත්වාන, දැන; පුබ්බගුණොපලද්ධං, පෙරතමන්දඹරුක්සෙවනෙහි හිඳලැබූ; තංධම්මං, ඒසමාධිය; සමානෙතුං, එළවන්ටහෝ වඩන්ට; සුබොධිං, යහපත් ඇසතුබෝරුක කරා; අගා, වැඩිසේක.

132. පීණ, පරිපූර්ණවූ; පයොධරාධරං, පියයුරුභාතොල් ඇති; අනඞ්ග, කාමයාගේ; රඞ්ග, නෘත්‍යමණ්ඩලයෙහි; ධජභූත, (එසවූ) මකරධ්වජයක්වැනිවූ; අඞ්ගං, දෙහයක්ඇති; යසොධරං, යශොධරානම්අගමෙහෙසිය; විහාය, හැරලා; සෙට්ඨත්තං, බුදුබවට; උපාගතං, පැමිණියාවූ; තං, ඒභගවත්හු; සචෙතනො, චෙතනාසහිතවූ; කොහි නරො, කවරනම්මනුෂ්‍යයෙක්; නපූජයෙ, නුපුදන්නේද? (පුදන්නේමැයි).

සාධුජන, හුදීජනයන්ට; ආනන්දන, සන්තොෂගෙණදීමට; නිදානෙ, කාරණාවූ; ජිනාලඞ්කාරෙ, ජිනාලඞ්කාරනම්ප්‍රකරණයෙහි; මහාපධානදීපනීගාථා, ප්‍රධානවීය්‍ය්‍යීප්‍රකාශිතගාථාවෝ; ඉති, මෙතෙකින්; නිට්ඨිතා, නිමියාහුයි.

---

## සන්නසහිත.

133. තිබුද්ධඛෙත්තම්හි තීසෙතච්ඡත්තං
ලද්ධාන ලොකාධිපතී භවෙය්‍යං,
ගන්ත්වාන බොධිමහ' පරාජිතාසනෙ
යුද්ධාය මාරෙන' වලො නිසීදි.

134. දත්වාන මානුසං රජ්ජං පිතා සුද්ධොදනො තදා,
නමස්සමානො සිරසා සෙතච්ඡත්තෙන පූජයී.

135. සහම්පතී මහාබ්‍රහ්මා දෙවබ්‍රහ්මෙහි එකතො,
අත්තනො විසයෙ රජ්ජං දත්වා ඡත්තෙන පූජයී.

136. සයං නාරායණබලො අභිඤ්ඤාබලපාරගූ,
ජෙතුං සබ්බස්ස ලොකස්ස බොධිමණ්ඩ මුපාගමි.

---

133. තිබුද්ධඛෙත්තම්හි, (ජාති-ආඥා-විෂය-යන) ත්‍රිවිධ බුද්ධක්‍ෂෙත්‍රයෙහි; තිසෙතච්ඡත්තං, (මානුෂික-දිව්‍ය-විමුක්ති-යන) ත්‍රිවිධධවලාතපත්‍රයන්; ලද්ධාන, ලැබ; ලොකාධිපති, ජගන්නායක යෙක්; භවෙය්‍යංඉති, වන්නෙමියයි; ගන්ත්වාන, ප්‍රයාණයකොට; බොධිමහි, බොධිද්‍රුමමූලයෙහි; අපරාජිතආසනෙ, (කිසිවකුවිසින් නොපරදවනලදහෙයින්) අපරාජිතයයි කියනලද වජ්‍රාසනයෙහි; මාරෙන, මරහුහා; යුද්ධාය, යුද්ධකරණුපිණිස; අවලො, අකම්ප්‍යමානව; නිසීදි, වැඩහුන්නේයි.

134. තදා,(බෝසත්හු කිඹුල්වත්පුර රාජ්‍යශ්‍රීපදප්‍රාප්තවූ) ඒකාල යෙහි; සුද්ධොදනො පිතා, සුදොවුන්නම්වූපියමහරජ; මානුසංරජ්ජං, මිනිස්ලොවරාජ්‍යය; දත්වාන, පාවාදී; සිරසා, උත්තමාඞ්ගයෙන්; නමස්සමානො, නමස්කාරකරමින්; සෙතච්ඡත්තෙන, ධවලාතපත්‍රයෙන්; පූජයී, පිදීය.

135. (තදා, බෝසත්හු මහබිනික්මන්හා බෝමැඩවැඩසිටිම කළ ඒකාලයෙහි;) සහම්පතීමහාබ්‍රහ්මා, සහම්පතීනම්මහබඹු; දෙව බ්‍රහ්මෙහි, දෙව්බඹුන්හා; එකතො, එකතුව; අත්තනොවිසයෙ, තමා විෂයෙහිවූ; රජ්ජං, රාජ්‍යය; හෙවත්දිව්‍යරාජ්‍යය; දත්වා, පුදා; ඡත්තෙන, දිව්‍යශ්වෙතච්ඡත්‍රයෙන්; පූජයී, පිදීය.

136. නාරායණබලො, නාරායණබලඇත්තාවූ; හෙවත් ඡද්දන්තහස්තීන් දසදෙනකුගේ හෝ පුරුෂගණනින් දසකෙළ දහසකගේ හෝ කායබලධාරීවූ; අභිඤ්ඤාබලපාරගූ, අභිඥබල යන්ගේ කෙළපැමිණියාවූ; සයං, තමන්වහන්සේ; සබ්බස්ස ලොකස්ස, සියලුසත්‍වයන්සම්බන්ධවූ; (කෙලශයන්) ජෙතුං, දිනන්ට; බොධිමණ්ඩං, බෝමැඩකරා; උපාගමි, වැඩියේක.

137. තදා වසවත්තිමාරො ඡකාමාවචරිස්සරො,
සසෙනවාහනො බොධිමණ්ඩං යුධායු'පාගමි.

138. එථ ගණ්හථ බන්ධථ ඡෙදථ චෙටකං ඉමං,
මනුස්සකලලෙ ජාතො කිමිහනාසි නමඤ්ඤති.

139. ජලන්තං නවවිධං වස්සං වස්සාපෙසි අනප්පකං,
ධූමන්ධකාරං කත්වාන පාතෙසි අසනිං බහුං.

140. චක්කායුධං ඛිපන්තො ච නාසක්ඛි කිඤ්චි කාතවෙ,
ගහෙතබ්බං හි ගහණං අපස්සන්තො ඉති බ්‍රවී.

141. සිද්ධත්ථ! කස්මා ආසීනො? ආසනෙ මම සන්තකෙ,
උට්ඨෙහි ආසනා නො චෙ ඵාලෙමි හදයං තව.

---

137. තදා, එකල්හි: ඡකාමාවචරිස්සරො, ෂදෙව්ලොවට අධිපතිවූ; වසවත්තිමාරො, (සියලුලොකයා තමාවසගවූවන්කරණහෙයින්) වසවත්නම් මරදෙව්පින්තෙම; සසෙනවාහනො, සෙනාවාහනසහිතව; යුධාය, යුදපිණිස; බොධිමණ්ඩං, බෝමැඩට; උපාගමි, එළඹී.

138. එථ, (කොලෙනි! මෙහි) එව්, ඉමං චෙටකං, මෙල දස්හු; ගණ්හථ, (අල්වා) ගණිව්; බන්ධථ, (පඤ්චවිධබන්ධනයෙන්) බඳිව්; ඡෙදථ, හැරපියව්; අහං, මම; මනුස්සකලලෙ, මනුෂ්‍ය ශුක්‍රශෝණිතසඞ්ඛ්‍යාතපඞ්කයෙහි; ජාතො, හටගත්; කිම්ඉති, පණුවෙක්මියි; නමඤ්ඤති, (තෙමේ) නොසිතයි.

139. ජලන්තං, දිලෙන්නාවූ; නවවිධංවස්සං, නවපරිදිවූ වැසි; වස්සාපෙසි, වැස්වී; අනප්පකං, බහුලවූ; ධූමන්ධකාරං, දුම්හා අඳුරු; කත්වාන, නිර්මිතකොට; බහුංඅසනිං, බොහෝහෙන; පාතෙසි, හෙළී.

140. චක්කායුධංච, සක්අවිය ද; ඛිපන්තො, බහාලන්නේ; කිඤ්චි, මදවූඋපද්‍රවයකුදු; කාතවෙ, කරන්නට; නාසක්ඛි, නොහැක්වී; ගණ්හිතබ්බංගහනං, ගතයුතුදෙයක්; අපස්සන්තො හි, නොදක්නේම; ඉති, මෙසේ; අබ්‍රවී, කී.

141. සිද්ධත්ථ! කොළසිදුහත්කුමර! මමසන්තකෙ, මාඅයත්වූ; ආසනෙ, අස්නෙහි; කස්මා, කවරහෙයකින්; ආසීනො, හුන්නෙහිද? ආසනා, (මාගේ) අස්නෙන්; උට්ඨෙහි, නැගිටු; නොචෙ, ඉදින් නොනැගිටීනම්; තවහදයං, තාගේලය; ඵාලෙමි, විදරණයකරමි.

## සන්තසහිත.

142. සපාදමූලෙ කීළන්තං පස්සන්තො තරුණං සුතං,
පිතා' වුදික්ඛි තං වුත්තං මෙත්තායන්තො දයාපරො.

143. තදා සො ආසභිවාචං සීහනාදං නදී මුනි,
න ජානාති සයං මය්හං දසභාවම්ප' යං බලො.

144. යෙන කෙන චි කම්මෙන ජාතො දෙවපුරෙ වරෙ,
සකං ගතිං අජානන්තො ලොකජෙට්ඨො' ති මඤ්ඤති.

145. අනන්තලොකධාතුම්හි සත්තානං හි කතං සුභං,
එකෙකපාරමිස්සා'පි කලං නාග්ඝති සොළසිං.

146. තිරච්ඡානො සසො හුත්වා දිස්වා යාචක මාගතං,
පචිත්වාන සකං මංසං පතිතො' ග්ගිම්හි දත්තවෙ.

---

142. දයාපරො, කෘපාතත්පරවූ භගවත්තෙම; මෙත්තායන්තො, මෛත්‍රීවඩමින්; වුත්තං, (මරහුවිසින්) කියනලද; තං, ඒහිං සනතෙපුල; සපාදමූලෙ, තමාපාමුල්හි; කීළන්තං, කෙළනාවූ; තරුණං, ලදබොලඳ; සුතං, දරුවකු; පස්සන්තො, බලන්නාවූ; පිතා ඉව, පියකුසේ; උදික්ඛි, (නුවනින්) ඉවසාබැලීය.

143. අයංබලො, මේසෙබලා; මය්හං, මාගේ; දසභාවං අපි, දස්වද; සයං, තෙමේ; නජානාති, නොදනී; (යසිසිතා)තදා, එකල්හි; සොමුනි, ඒශාක්‍යමුනිතෙම; ආසභිවාචං, අභීතනාදයවූ; සීහනාදං, උත්තමනාදය; නදී, (වක්‍ෂ්‍යමාණකාරයෙන්) ප්‍රකාශකෙළේය.

144. වරෙ, උතුම්වූ; දෙවපුරෙ, මාරදිව්‍යපුරයෙහි; යෙන කෙනචි කම්මෙන, ස්වල්පමාත්‍රකර්මයකින්; ජාතො, උපන්නේය: සකංගතිං, ස්වකීයගතිය; හෙවත් තමා මතුඅපායෙහි උපදනාබැව; අජානන්තො, නොදන්නේ; ලොකජෙට්ඨොඉති, ලොකජ්‍යෙෂ්ඨයෙක්වෙමියි; මඤ්ඤති, හඟියි.

145. අනන්තලොකධාතුම්හි, අනෙක්ලෝදහි; සත්තානං, සත්වයන්විසින්; කතං, රැස්කරණලද; පුඤ්ඤංහි, සුකෘතකර්මය වනාහි; මය්හං, මාගේ; එකපාරමිස්සඅපි, එකදපාරමිතාවක් සම්බන්ධව; සොළසිංකලං, සොළොස්වනකලාවකුදු; නඅග්ඝති, නොඅගියි.

146. තිරච්ඡානො, තිර්‍ය්‍යග්ගතවූ; සසොහුත්වා, සසකවඋපන් මමවනාහි; ආගතං, පැමිණියාවූ; යාචකං, යදියක්හු; දිස්වා, දැක; සකංමංසං, ස්වකීයශරීරමාංසය; පචිත්වාන, පිස; දත්තවෙ, දෙනු පිණිස; අග්ගිම්හි, වහ්නිජ්වාලාමධ්‍යයෙහි; පතිතො, පැන්නෙමි.

## ජිනාලඞ්කාරය.

147. එවං අනන්තකාලෙසු කතදුක්කරකාරිකං,
කොහි නාම කරෙය්‍ය'ඤ්ඤො අනුම්මත්තො සචෙතනො.

148. එවං අනන්තපුඤ්ඤෙහි සිද්ධං දෙහ මිමං පන,
යථාභූතං අජානන්තො මනුස්සො'ති හි මඤ්ඤති.

149. නාහං මනුස්සො අමනුස්සො න බ්‍රහ්මා නච දෙවතා,
ජරාමරණං ලොකස්ස දස්සෙතුං පනි'ධා'ගතො.

150. අනුපලිත්තො ලොකෙන ජාතො'නන්තජිනො අහං,
බුද්ධො බොධිතලෙ හුත්වා තාරෙමි ජනතං බහුං.

151. සමන්තා ධජිනිං දිස්වා යුත්තං මාරං සවාහනං,
යුද්ධාය පච්චුග්ගච්ඡාමි මා මං ඨානා අචාවයී.

---

147. අනන්තකාලෙසු, අප්‍රමාණකාලයන්හි; එවං, මේඋක්ත ප්‍රකාරයෙන්; කත, කළාවූ; දුක්කරකාරිකං, දුෂ්කරක්‍රියා; අනුම්මත්තො, උමතුබැව්හි නොසිටියාවූ; සචෙතනො, චෙතනාසම්ප්‍රයුක්ත වූ; අඤ්ඤොකො නාම, අන්‍යවරනම්සත්වයෙක්; කරෙය්‍ය, කරන්නේද? (නොකරන්නේමැයි).

148. ඉමංදෙහංපන, මේශරීරයවනාහි; එවං, මෙසේ; අනන්තපුඤ්ඤෙහි, අපමණපින්මහිමයෙන්; සිද්ධං, පරිනිෂ්පන්නවේ; යථාභූතං, තත්වූපරිදි; අජානන්තො, නොදන්නේ; මනුස්සො ඉති, මනුෂ්‍යයෙක්යයි; මඤ්ඤතිහි, (මාරතෙම) සිතාමැයි.

149. අහං, මම; මනුස්සොන, මනුෂ්‍යයෙක්නොවෙමි; අමනුස්සොන, අමනුෂ්‍යයෙක්ද නොවෙමි; නචබ්‍රහ්මා, බ්‍රහ්මයෙක්ද නොවෙමි; නච දෙවතා, දෙවියෙක්ද නොවෙමි; ලොකස්ස, සත්වයාහට; ජරාමරණං, ජරාවහාමරණය; දස්සෙතුං, දක්වාලන්ට; ඉධපන, මෙහිවනාහි; ආගතො, ආයේවෙමි.

150. අහං, මම; ලොකෙන, ලෝවැස්සන්හා; අනුපලිත්තො ජාතො, උපලිප්තනුවූයේ; අනන්තජිනො, (අනෙකසත්වයන්හෝ අනන්තසංස්කාරයන් දිනනහෙයින්) අනන්තජිනනම්වෙමි; බොධිතලෙ, ඇසතුබෝරුක්මුලදී; බුද්ධොහුත්වා, බුදුවී; බහුං ජනතං, බොහෝජනසමූහයා; තාරෙමි, (භවාර්ණවයෙන්) එතරකරමි.

151. සමන්තා, හාත්පස; ධජිනිං, ධවජයෙන් යුක්තවූ; සවාහනං, ගිරිමෙවුලානම් ඇත්වාහනසහිතවූ; යුත්තං, (මහත් සෙනාවෙන්) යුක්තවූ හෝ සන්නාහසන්නද්ධවූ; මාරං, මරහු; දිස්වා, බලා; යුද්ධාය, යුදපිණිස; පච්චුග්ගච්ඡාමි, (හුනස්නෙන් නොනැගිට) යුද්ධාභිමුඛයට යෙමි; මං, මා; ඨානා, මේපලඟින්; මාඅචාවයී, (කිසිවෙක්) පහනොකරයි.

## සන්නසහිත.

152\. යං තෙ තං නප්පසහති සෙනං ලොකො සදෙවකො,
තං තෙ පඤ්ඤාය ගච්ඡාමි ආමං පත්තංව අස්මනා.

153\. ඉච්ඡන්තො සාසපෙ ගබ්භෙ චඞ්කමාමි ඉතො චිතො,
ඉච්ඡන්තො ලොකධාතුංහි අත්තභාවෙන ඡාදයෙ.

154\. එතෙ සබ්බෙ ගහෙත්වාන චුණ්ණෙතුං අච්ඡරාය හි,
අත්ථි ථාමබලං මය්හං පාණඝාතො න වට්ටති.

155\. ඉමස්ස ගණ්ඩුප්පාදස්ස ආයුධෙන බලෙන කිං,
මය්හං හි තෙන පාණෙන සල්ලාපො' පි න යුජ්ජති.

156\. පල්ලඞ්කං මම භාවාය කිම ඤ්ඤෙනිධ සක්ඛිනා,
කම්පිතා මද්දියා දානා සක්ඛී හොති අයං මහී.

157\. ඉති වත්වා දක්ඛිණං බාහුං පඨවියා අවනාමයී,
තදා කම්පිත්ථ පඨවී මහාඝොසො අජායථ.

---

152\. සදෙවකො, දෙවියන්සහිතවූ; ලොකො, ලෝවැසිතෙමේ; තෙ, තාසතුවූ; එතං, මේ; යංසෙනං, යම්සේනාවක්; නප්පසහති, නොමඩීද; හෙවත් අභිභවනයකරලීමට අපොහොසත්ද; (අහං, මම;) අස්මනා, පාෂාණයකින්; ආමං පත්තං ඉව, අමුමැටි බඳුනක් බිඳින්නකුමෙන්; තෙ, තාගේ; තං, ඒසෙනාවකරා; පඤ්ඤාය, (මාගේ) ප්‍රඥාබලයෙන්; ගච්ඡාමි, (මේ අස්නෙහිම හිඳ) පැමිණෙමි.

153\. (අනතුරුව බුදුන්ගේඉද්ධිබලය දක්වන්නෝ 'ඉච්ඡන්තො' යනාදිය කියත්;) ඉච්ඡන්තො, කැමැතිවන්නේනම්; සාසපෙගබ්භෙ, සෂ්පබීජයක්තුළ; ඉතොචිතො, ඔබිනොබ; චඞ්කමාමි, සක්මන් කරමි; ඉච්ඡන්තො, කැමැතිවන්නේනම්; ලොකධාතුංහි, දශසහශ්‍රීලොකධාතුව; අත්තභාවෙන, (ව්‍යාමමාත්‍රවූ) ආත්මභාවයෙන්; ඡාදයෙ, වසාලමි.

154\. එතෙ සබ්බෙ, මේ සියලුමරසෙන්; ගහෙත්වාන, අල්වා ගෙණ: අච්ඡරායහි, අසුරුසනකින්ම; චුණ්ණෙතුං, සුණුකරන්ට; මය්හං, මට; ථාමබලං, දෘඪවූශරීරශක්තිය; අත්ථි, ඇත්තේය; (එසේ නමුදු) පාණඝාතො, අනුන්දිවිනැසීම; නවට්ටති, නොවටියි.

155 ඉමස්ස, මේ; ගණ්ඩුප්පාදස්ස, ගැඩවිලාපිණිස; ආයුධෙන, අවියකින් හෝ; බලෙන, කායබලයකින්හෝ; කිං, ප්‍රයොජන කිම්ද? තෙනපාණෙන, ඒගැඩවිල්පණුවා සමග; සල්ලාපොඅපි, බස්දෙඩීමවත්; මය්හං, මට; නයුජ්ජතිහි, අයුතුමැයි.

156\. පල්ලඞ්කං, මේ අපරාජිතපර්‍ය්‍යඞ්කය; මමභාවාය, මා සතුබවට; මද්දියාදානා, මද්‍රිදෙවියදීමෙන්; කම්පිතා, සැලුනාවූ; අයං, මේ; මහී, අප්‍රාණිකපෘථිවිය; සක්ඛීහොති, සාක්ෂිවන්නීය; (එහෙයින්) ඉධ, මෙහිලා; අඤ්ඤෙන සක්ඛිනා, සෙසු ස ප්‍රාණීන්ගේ සාක්ෂියකින්; කිං, කවරප්‍රයොජනද? (ප්‍රයොජනනැත්තේමැයි.)

157\. ඉති, මෙසේ; වත්වා, වදුරා; දක්ඛිණං' බාහුං, දක්ෂිණ ශ්‍රීහස්තය; පඨවියා, පොළොවට; අවනාමයී, නැමූයේක; තදා, එවේලෙහි; පඨවී, මිහිකත්තොමෝ; පකම්පිත්ථ, (කුඹල්සකක් මෙන්) සැලීය; මහාඝොසො, මහත්වූරාවද, අජායථ, පහළවී.

158. පඨවිඝොසෙන ආකාසො ගජ්ජී තත්තාසනී ඵලී,
තස්මිං මජ්ඣගතො මාරො සපරිසො භයතජ්ජිතො.
159. මහාවාතසමුද්ධුතභස්මං’ ව වීකිරියථ,
මහාඝොසො අජායිත්ථ සිද්ධත්ථස්ස ජයො ඉති.
160. තං තාදිසං දෙවවරං යසස්සිං
මනුස්සභූතො හි කථං ජිනෙය්‍ය,
තස්මා හි සො’ නන්තජිනො’ ති වුත්තො
අනන්තඤෙය්‍යෙසු පවත්තපඤ්ඤො.
161. තස්මා හි සො පඤ්ඤපතිට්ඨිතෙන
නමස්සනීයො අසිපාරගෙන,
පයොජන ඤ්චස්ස හි අත්ථි කිඤ්චි
සීසම්පි ඡෙත්වාන’ භිපූජනීයො.

**ඉති සාධුජනානන්දජනනිදානෙ ජිනාලඞ්කාරෙ**
**මාරවිජයදීපනීගාථා නිට්ඨිතා**

---

158. පඨවිඝොසෙන, පෘථිවීනාදයෙන්; ආකාසො, අහස්කුස; ගජ්ජී, (රත්වූ කබලෙක බහාලූ වීරුසක්සේ) ගජ්ජනාකෙළේය; තත්තාසනී, (ගිනිඇවිලගත් අඟුරුරුසක්සේ) දිලියෙනවිදුලිද; ඵලී, ශෑසීය; තස්මිං, එහි; මජ්ඣගතො, අහස්පොළෝදෙකඅතරසිටි; මාරො, වශවර්තීමාරයා; සපරිසො, පිරිස්සහිතව; භයතජ්ජිතො, (තමහට රක්‍ෂාස්ථානයක් පිළිසරණක් නොලදින්) බියෙන් තැති ගත්තේ:—

159. මහාවාත, ප්‍රචණ්ඩවාතයකින්; සමුද්ධූත, ඔසවාගත්; භස්මං ඉව, හලුමෙන්; විකිරියථ, විසිරෙනුලැබීය; සිද්ධත්ථස්ස, සිදුහත්හට; ජයොඉති, ජයඅත්වීයයි; මහාඝොසො, මහත්ඝල්වර හඬෙක්; අජායිත්ථ, වූයේය.

160. තාදිසං, උක්තප්‍රකාරවූ; යසස්සිං, යසපිරිවරඇත්තාවූ; දෙවවරං, දෙවියන්ට ශ්‍රෙෂ්ඨවූ; තං, ඒමරදෙව්පුත්; මනුස්සභූතො, මනුෂ්‍යව උපන්නෙක්; කථංහි, කෙසේනම්; ජිනෙය්‍ය, පරදවන්නේද? (නොපරදවන්නෙමැයි) තස්මාහි, එහෙයින්වනාහි; සො, ඒමහාපුරුෂතෙම; අනන්තඤෙය්‍යෙසු, අප්‍රමාණඥෙයවස්තුවිෂයෙහිලා; පවත්තපඤ්ඤො, පැවතිප්‍රඥාඇති; අනන්තජිනොඉති, අනන්තජිනයයි; වුත්තො, කියනලද්දේයි.

161. තස්මා, එහෙයින්; අසිපාරගෙන, කඩුසරමෙහිකෙළපැමිණියහුවිසින්; සො, හේසර්වඥතෙම; පඤ්ඤපතිට්ඨිතෙන, පසඟපිහිටුවීමෙන්; නමස්සනීයොහි, වැන්දයුත්තේමය; අස්සහි, ඒසර්වඥයන්ටවනාහි; කිඤ්චිපයොජනඤ්ච, මදප්‍රයොජනයක්වත්; අත්ථි, ඇත්නම්; සීසංඅපි, හිසපවා; ඡෙත්වාන, සිඳ; අභිපූජනීයො, (එයින්ද) යහපත්ව පිදියයුත්තේයි.

සාධුජන, හුදිජනයන්ට; ආනන්දජන, සන්තොෂගෙණදීමට; නිදානෙ, කාරණාවූ; ජිනාලඞ්කාරෙ, ජිනාලඞ්කාරනම්ප්‍රකරණයෙහි; මාරවිජයදීපනීගාථා, මාරවිජයප්‍රකාශිතගාථාවෝ; ඉති, මෙතෙකින්; නිට්ඨිතා, නිමියාහ.

---

## සන්නසහිත.

162. පුරතො ගච්ඡති චන්දෙ රජතචක්කං’ ව අම්බරෙ,
සහස්සරංසී සුරියො පච්ඡිමෙන’ පගච්ඡති.

163. මජ්ඣෙ බොධිදුමච්ඡන්නෙ පල්ලඞ්කෙ අපරාජිතෙ,
පල්ලඞ්කෙන නිසීදිත්වා ධම්මං සම්මසතෙ මුනි.

164. සක්කො තස්මිං ඛණෙ සඞ්ඛං ධමෙන්තො’ ව’ භිධාවති,
බ්‍රහ්මා තියොජනං ඡත්තං ධාරෙති මුනිමුද්ධනි.

165. මණිතාලවණ්ටං තුසිතො සුයාමො වාලවීජනිං,
නානාමඞ්ගලභණ්ඩානි ගහිතා සෙසදෙවතා.

166. එවං දසසහස්සිම්හි සක්කබ්‍රහ්මාදි දෙවතා,
සඞ්ඛාදීනි ධමෙන්තා’ ව චක්කවාළම්හි පූරයුං.

---

162. චන්දෙ, නිසයුරුතෙම; රජතචක්කංඉව, රිදීමුවාසකක් මෙන්; අම්බරෙ, අහස්හි; පුරතො, පෙරදිගින්; ගච්ඡති, උදාවේ; සහස්සරංසී, දහස්ගණන්රැස්ඇති; සුරියො, සූර්‍ය්‍යතෙම; පච්ඡිමෙන, පැළදිගින්; අපගච්ඡති, බසියි.

163. මජ්ඣෙ, මේඅතර; මුනි, සර්වඥයන්වහන්සේ; බොධිදුමච්ඡන්නෙ, බොධිද්‍රැමයෙන්වැසුනාවූ; අපරාජිතෙ, කෙලෙස්සතුරන්විසින්නොපරදවනලද; පල්ලඞ්කෙ, පර්‍ය්‍යඞ්කයෙහි; පල්ලඞ්කෙන, පලක්බැඳීමෙන්; නිසීදිත්වා, වැඩහිඳ; ධම්මං, නවලොවුතුරා දහම්; සම්මසතෙ, සම්මර්ශනයකරයි.

164. තස්මිං ඛණෙ, එකෙණෙහි; සක්කො, ශක්‍රතෙම; සඞ්ඛං, විජයුත්තරනම් සක; ධමෙන්තො එව, පිඹිමින්ම; අභිධාවති, ඉදිරියටදිවෙයි; බ්‍රහ්මා, සහම්පතීනම් මහාබ්‍රහ්මතෙම; තියොජනං, තුන්යොදුන්උස්වූ; ඡත්තං, ධවලච්ඡත්‍රය; මුනිමුද්ධනි, බුදුන්හිසට, ධාරෙති, දරයි.

165. තුසිතො, සන්තුසිතනම් දෙව්පිත්; මණිතාලවණ්ටං, මිණිමුවාතල්වැටක්ද; සුයාමො, සුයාමනම් දෙව්පිත්; වාලවීජනිං, වල්විදුනාවක්ද; සෙසදෙවතා, සෙසුදෙවියෝ; නානාමඞ්ගලභණ්ඩානි, (පූජාකිවූ) නොයෙක්මඞ්ගල්‍යභාණ්ඩයන්ද; ගහිතා, (බුදුපුද පිණිස) ගත්තාහුයි.

166. එවං, මෙසේ: දසසහස්සිම්හි, දසදහසක්සක්වලෙහි: සක්කබ්‍රහ්මාදිදෙවතා, ශක්‍රබ්‍රහ්මාදිදෙවියෝ; සඞ්ඛාදීනි, සක්ආදීන්; ධමෙන්තාඑව, පිඹින්ම; චක්කවාළම්හි, මේමඟුල්සක්වලෙහි; පූරයුං, රැස්වූහ.

167. මඞ්ගලානි ගහෙත්වාන තිට්ඨන්ති කාචි දෙවතා,
ධජමාලා ගහෙත්වාන තථා පුණ්ණඝටාදයො.

168. තත්ථ නච්චන්ති ගායන්ති සෙළෙන්ති වාදයන්ති ච,
දෙවා සතසහස්සිමසි තුට්ඨහට්ඨා පමොදිතා.

169. ධම්මාමතරසස්සාදං ලභිස්සාම'ස්ස සන්තිකෙ,
නයනාමතරසස්සාදං පාටිහීරඤ්ච පස්සිතුං.

170. ජරාමරණකන්තාරා සොකොපායාස සල්ලතො,
මොචෙති කාමපාසම්හා දෙසෙන්තො අමතං පදං.

171. ඉති තුට්ඨෙහි දෙවෙහි පූජියන්තො නරාසභො,
කිඤ්චි පූජං අචින්තෙන්තො චින්තෙන්තො ධම්මමුත්තමං.

172. සබ්බඤ්ඤුසාධිතො සන්තො සිද්ධත්ථො අපරාජිතො,
චක්කවාලසිලාසානිපාකාරෙ' තිමනොරමෙ.

---

167. කාචිදෙවතා, ඇතැම්දෙවියෝ; මඞ්ගලානි, මඞ්ගල්‍යවස්තූන්ද; කාචිදෙවතා, කිසිදෙවිකෙනෙක්; ධජමාලා, ධ්වජමාලාවන්ද; ගහෙත්වාන, රැගෙණ; තිට්ඨන්ති, සිටිත්; තථා, එසේම; කාචිදෙවතා, සමහරදෙවියෝ; පුණ්ණඝටාදයො, පුන්කලසාදිය; ගහෙත්වාන, ගෙණ; තිට්ඨන්ති, සිටිත්.

168-169-170. දසසහස්සිම්හි, දසදහසක්සක්වල; දෙවා, දෙවියෝ; අස්සසන්තිකෙ, මේ නරශ්‍රෙෂ්ඨයාගේ හමුවෙහි; ධම්මාමතරසස්සාදං, සදහම්අමාරසවිඳීම්ද; නයනාමතරසස්සාදං, නුවන්පිළිබඳඅමාරසවිඳීමවූ; පාටිහීරඤ්ච, පෙළහරද; පස්සිතුං, දක්නට; ලභිස්සාම, ලබන්නෙමු; (භවං, නිදුකානෙනි!) අමතං පදං, නිර්වාණපදය; දෙසෙන්තො, ප්‍රකාශකරමින්; ජරාමරණ, ජරාමරණනැමැති; කන්තාරා, දුර්මාර්ගයෙන්ද; සොකොපායාස, ශොකඋපායාසනැමැති; සල්ලතො, හුලින්ද; කාම, පස්කම්නැමැති; පාසම්හා, මලපුඩුවෙන්ද; මොචෙති, (අප) මුදවයි; තත්ථ, ඒබෝමැඩදී; තුට්ඨහට්ඨා, තුටුපහටුව; පමොදිතා, ප්‍රමුදිතව; නච්චන්ති, නටති; ගායන්ති, ගීකියති; සෙළෙන්ති, (මුවෙන්) උස්හෙලුම්හඬකෙරෙති; වාදයන්තිච, වාද්‍යයදකෙරෙත්.

171. ඉති, මෙසේ; තුට්ඨෙහි, සතුටුවූ; දෙවෙහි, දෙවියන්විසින්; පූජියන්තො, පුදනුලබන්නාවූ; නරාසභො, නරොත්තමතෙම; කිඤ්චිපූජං, මදපූජාවකුදු; අචින්තෙන්තො, නොසිතමින්; උත්තමංධම්මං, ශ්‍රෙෂ්ඨධර්මය; චින්තෙන්තො, නුවනින් සලකන්නේ.

172. සබ්බඤ්ඤු, (සම්බොධිසමධිගමයට හෙතුවූ) සියලුඅර්ථ; සාධිතොසන්තො, නොඅඩුව සිදුකරණලද්දේම; සිද්ධත්ථො, -(එහෙයින්ම) සිද්ධාර්ථයයිව්‍යවහාරඇත්තේ; අපරාජිතො, කෙලෙස්සතුරන්දිනුයේ; චක්කවාලසිලා, චක්‍රවාටපර්වතනැමැති; සානිපාකාරෙ, ජවනිකාවකින් වටකිරීම්ඇති; අතිමනොරමෙ, ඉතාසිත්කලුවූ.

## සත්තසගිත.

173. තාරාමණිවිතාකාස විතානෙ චන්ද දීපකෙ,
නානාරතනවිජ්ජොතෙ මාලාගන්ධාදි පූජිතෙ.

174. දෙවෙහි ඡණභෙරීහි ඝුට්ට මඞ්ගලගීතියා,
චක්කවාලසුපාසාදෙ බොධිමණ්ඩ මහාතලෙ.

175. බොධිරුක්ඛමණිවජ්ජතෙන පල්ලඞ්කෙ අපරාජිතෙ,
නිසින්නො පඨමෙ යාමෙ පුරිමංජාතිං අනුස්සරි.

176. නාමරූපාන මුප්පත්ති සුදිට්ඨා හොති තෙනි'ධ,
සක්කායදිට්ඨි තෙන'ස්ස පහීණා හොති සබ්බසො.

177. තතො හි දුතියෙ යාමෙ යථාකම්මූපගෙ සරි,
සුදිට්ඨං හොති තෙන'ස්ස කම්මකෙලසෙහි සම්භවං.

---

173. තාරා, තරුවැලනැමැති; මණිවිත, මැණික්ඔබ්බනලද; ආකාස, අහස්නැමැති; විතානෙ, වියනක්ඇති; චන්ද, චන්ද්‍රමණ්ඩල නැමැති; දීපකෙ, ප්‍රදීපයක්ඇති; නානාරතන, නන්රුවනින්; පජ්ජොතෙ, උදුල්වූ; මාලාගන්ධාදි, මල්සුවඳආදියෙන්; පූජිතෙ, පුදනලද්දවූ.

174. දෙවෙහි, දෙවියන්විසින්; ඡණභෙරීහි, සැණබෙරවලින්ද; මඞ්ගලගීතියා, මඞ්ගල්‍යගායනාවලින්ද; ඝුට්ඨෙ, ඝොෂාකරණලද; චක්කවාලසුපාසාදෙ, චක්‍රවාටනැමැති මනාප්‍රාසාදඇති; බොධිමණ්ඩමහාතලෙ, බොධිමණ්ඩනැමැතිමහාතලඇති.

175. බොධිරුක්ඛ, බොධිද්‍රැමනැමැති; මණිවජ්ජතෙන, මිණිසැත්ඇති; අපරාජිත, (කෙලෙස්සතුරන්විසින්) නොපරදවනලද; පල්ලඞ්කෙ, පය්‍යඞ්කයෙහි; නිසින්නො, වැඩහුන්සේක්: පඨමෙ යාමෙ, පෙරයම්හි; පුරිමං ජාතිං, පූර්වනිවාසානුස්මෘතිය; අනුස්සරි, සිහිකළසේක.

176. ඉධ, මෙහිදී; තෙන, උන්වහන්සේ විසින්; නාමරූපානං, නාමරූපදෙදෙනාගේ; උප්පත්ති, ඉපැත්ම; සුදිට්ඨාහොති, මනාවදක්නාලද්දීවේ; තෙන, ඒහෙතුවෙන්; අස්ස, උන්වහන්සේගේ; සක්කායදිට්ඨි, (විංශතිප්‍රභෙදවූ) සත්කායදෘෂ්ටිතොමෝ; සබ්බසො, සර්වාකාරයෙන්; පහීණාහොති, පහවූයේවෙයි.

177. තතොහි, ඉක්බිත්තෙන්වනාහි; දුතියෙයාමෙ, මැදුම්යම්හි; යථාකම්මූපගෙ, කර්මානුරූපපරිද්දෙන් උපදනාසත්වයන්; සරි, සිහිකොළේය; තෙන, ඒහෙතුවින්; අස්ස, උන්වහන්සේවිසින්; කම්මකෙලසෙහි, කර්මක්ලේශදෙකින්; සම්භවං, ඉපැත්ම; සුදිට්ඨං හොති, මනාවදක්නාලද්දේවෙයි.

## ජි නා ල ඞ්කා ර ය .

178. කඞ්ඛාවිතරණී නාම ඤාණං තං සමුපාගතං,
තෙන’ සෙසා පහීයිංසු කඞ්ඛා සොළසධා ඨිතා.

179. තතො සො තතියෙ යාමෙ වාදසඞ්ග අසෙසතො,
සො පටිච්චසමුප්පාදෙ ඤාණ මොතාරයී මුනි.

180. අවිජ්ජාද්‍යනුලොමෙන ජරාදිපටිලොමතො,
සම්මසන්තො යථාභූත ඤාණදස්සන මාගමී.

181. කප්පකොටිසතෙනා’පි අප්පමෙය්‍යාසු ජාතිසු.
ලොභං අසෙසදුතෙන විනාසෙන්තො පුනප්පුනං.

---

178. සමුපාගතං, (උක්තප්‍රකාරයෙන්) ප්‍රතිලාභයකරණලද හෝ එළඹසිටි; තංඤාණං, ඒඥානය; කඞ්ඛාවිතරණිනාම, කාඞ්ක්‍ෂාවිතරණීනම් (වේ) තෙන, ඒහෙතුවෙන්; සොළසධාඨිතා, ("අහොසිං නුඛො අහං අතීතමද්ධානං" යනාදීන්) සොළොස්ආකාරයකින්සිටියාවූ: අසෙසාකඞ්ඛා, සියලුසැක; පහීයිංසු, පහවනුලැබීය.

179. තතො, ඊටඅනතුරුව, සොමුනි, එශාක්‍යමුනිතෙම; තතියෙ යාමෙ, පශ්චිමයාමයෙහි; වාදසඞ්ග, අවිද්‍යාදිඅවයවදෙළොසක්ඇති; පටිච්චසමුප්පාදෙ ප්‍රතීත්‍යසමුත්පාදචක්‍රයෙහි; අසෙසතො, නිරවශෙෂවශයෙන්; ඤාණං, ඥානය; ඔතාරයී, (අනුලොම ප්‍රතිලොමවශයෙන්) බැස්වීය.

180. අවිජ්ජාදි, අවිද්‍යා–සංස්කාර යනාදිවශයෙන්; අනුලොමෙන, අනුලොමවශයෙන්ද; ජරාදි, ජරා–මරණ යනාදිවශයෙන්; පටිලොමතො, ප්‍රතිලොමවශයෙන්ද; සම්මසන්තො, සම්මර්ශනයකරන්නේ; යථාභූතඤාණදස්සනං, යථාර්ථයෙන්දනයුතු ඥානදර්ශනයයි කියනලද ආර්‍යමාර්ගය; ආගමී, අවබොධකළසේක.

181. (තුමූන් පෙර සිහිනෙන්වත් නුදුටු සාක්‍ෂාත්නොකළාවූ සූක්‍ෂ්මතරවූ පරමගම්භීරවූ ඥානදර්ශනය ගුරූපදෙශරහිතව මුන්වහන්සේටම කුඹරහයකින් සිදුවීද යන චොදනාව සිත තබා එය විස්තරකරන්නෝ "කප්පකොටිසතෙන" යනාදිය කියත්.) කප්පකොටිසතෙනඅපි, කප්කෙළසියයකින්දු; අප්පමෙය්‍යාසු, ප්‍රමාණකළනොහැකිවූ; ජාතිසු, ජාතීන්හි; හෙවත් කාලපලක්‍ෂයක් අධිකකොටඇති සාරාසඞ්ඛ්‍යෙයක්හි; අසෙසදුතෙන, (දිවිපුවානොතකා) සියලුදේදීමෙන්; හෙවත් දානපාරමිතාවෙන්; ලොභං, (ඒ ඒ වස්තු අරමුණුකොට උපදනා) ලොභය; පුනප්පුනං, නැවත නැවතත්; විනාසෙන්තො, විශෙෂයෙන් නසමින්.

## ස ත් ත ස ගි ත .

182. සීලෙන ඛන්ති මෙත්තාය කොධං දොසං නිවාරයං,
පඤ්ඤාය මොහං ඡෙත්වාන මිච්ඡාදිට්ඨිං තථෙවච.
183. ගරූපසෙවනා ධම්මවිචිකිච්ඡං විනොදයං,
මානුද්ධච්චං විනොදෙන්තො කුලෙ ජෙට්ඨාපචායිනා.
184. නෙක්ඛම්මෙන විනාසෙන්තො කාමරාගං පුනප්පුනං,
සච්චෙන ච විසංවාදං කොසජ්ජං විරියෙන ච.
185. එවං දානාදිනා තං තං කිලෙසඛග්ගං විනොදයී,
සුවඩ්ඪිතා මහාපඤ්ඤා කථං සන්තිං න රූහති.
186. සුදුක්කරං කරිත්වාන දානාදිං පච්චයං පුරෙ.
න කිඤ්චි භවසම්පත්තිං පත්ථෙසි බොධි මුත්තමං.

---

182. තථෙවච, එසේම; සීලෙන, සීලපාරමිතාවෙන්; කොධං, (කිපීම් ලක්ෂණකොටඇති) ක්‍රොධයද; ඛන්තිමෙත්තාය, ක්ෂාන්ති-මෛත්‍රී යන පාරමිතාදෙකින්; දොසඤ්ච, (දූෂ්‍යවීම් ලක්ෂණකොට ඇති) ද්වේෂයද; නිවාරයං, වළකමින්; පඤ්ඤාය; ප්‍රඥාපාරමිතාවෙන්; මොහං, (මුළාවීම් ලක්ෂණකොටඇති) මොහයද; මිච්ඡාදිට්ඨිඤ්ච, (විපරීත දර්ශනය ලක්ෂණකොටඇති) මිථ්‍යාදෘෂ්ටියද; ඡෙත්වාන, සිඳ.

183. ගරූපසෙවනා, (බුදු පසේබුදු ආදි මහාප්‍රාඥයන්) ගුරුජනාශ්‍රයෙන්; ධම්මවිචිකිච්ඡං, ධර්මයෙහිලා පවත්නාසැකය; විනොදයං, දුරලමින්; කුලෙ, කුලයෙහි; ජෙට්ඨාපචායිනා, (වැඩිමහල්ලන්ටහා මව්පියාදි කුලවතුන්ට වැඳීම් පිදීම් ආදිවූ) ජ්‍යෙෂ්ඨාපචායනයෙන්; මානුද්ධච්චං, මාන යහා උද්ධතභාවය; විනොදෙන්තො, පහකරමින්.

184. නෙක්ඛම්මෙන, නෛෂ්කර්ම්‍යපාරමිතාවෙන්; කාමරාගං, වස්තුකාමානුරාගය; පුනප්පුනං, නැවත නැවත; විනාසෙන්තො, වනසමින්; සච්චෙන, සත්‍යපාරමිතාවෙන්; විසංවාදඤ්ච, මිථ්‍යාවචනයත්ද; විරියෙන, වීර්‍ය්‍යපාරමිතාවෙන්; කොසජ්ජං, කුසීතභාවයද; (විනාසෙන්තො, වනසමින් යනු යොදනු.)

185. එවං, මෙසේ; දානාදිනා; දානසීලාදිපාරමිතාබලයෙන්: තං තං කිලෙසඛග්ගං, ඒ ඒ කෙලෙසසිත්; විනොදයී, පහකෙළේය; සුවඩ්ඪිතා, (උක්තප්‍රකාරයෙන්) වඩනාලද; මහාපඤ්ඤා, මහත් ප්‍රඥතොමෝ; සන්තිං, නිර්වාණයට; කථං, කෙසේ; නරූහති, නොනැඟේද? හෙවත් ප්‍රඥව නිවණට නතුනොවේද?

186. පුරෙ, පූර්වයෙහි; සුදුක්කරං, අතිදුෂ්කරවූ; දානාදිං, දානසීලාදිකුශලධර්මයන්; කරිත්වාන, කොට; කිඤ්චිභවසම්පත්තිං, මුදවුදභවසම්පතක්; නපච්චයං, නොපතමින්; උත්තමං, උතුම්වූ; බොධිං, සම්‍යක්සම්බොධිය; පත්ථෙසි, පැතුසේක,

## ජිනාලඞ්කාරය.

187. පණිධානමහි පච්ඡාය කතං පුඤ්ඤඤ්ච පච්ඡිමං,
එකන්ත' දානි සම්පත්තං දෙති බොධිමසංසයං.

188. යතො සො සබ්බසඞ්ඛාරෙ අනිච්චදුක්ඛානත්තතො,
සම්මසං අනුලොමෙන නිබ්බානං සමුපාගමි.

189. සවාසනෙ කිලෙසෙ සො ඛෙපෙන්තො' ණුතරම්පි ච.
අරහත්තප්පත්තියා සුද්ධො බුද්ධො බොධිතලෙ අහු.

190. පත්තො විමුත්තිං, වරසෙතඡත්තං
සො පීතිවෙගෙන උදානමුදීරයී,
ජෙත්වාන මාරෙ විජිතාරි සඞ්ඝො
තිබුද්ධඛෙත්තෙක දිවාකරො අහු.

---

187. පණිධානමහිපච්ඡාය, ප්‍රණිධියේපටන්; කතං, කළාවූ; පුඤ්ඤඤ්ච, පින්ද; පච්ඡිමංච, පැතුම්ද; ඉදානි, මේ පශ්චිමභවයෙහි දී; එකන්ත, එක්තැනකට; සම්පත්තං, පැමිණියේ; අසංසයං, නිසැකව; බොධිං, සම්බොධිය; දෙති, දානයකරයි.

188. සො, ඒශාක්‍යමුනිතෙම; තතො, එහෙයින්; හෙවත් දානාදියෙන් ඒ ඒ කෙලශාඞ්ගයන් පහකළහෙයින්; සබ්බසඞ්ඛාරෙ, සියලුසංස්කාරයන්; අනිච්ච, (උදයව්‍යයස්වරූපහෙයින්) අනිත්‍යවශයෙන්ද; දුක්ඛ, (දුක්ඛදායකභාවයෙන්) දුක්වශයෙන්ද; අනත්තතො, (අවශවර්තිත්වයෙන්) අනාත්මවශයෙන්ද; අනුලොමෙන, අනුලොමවශයෙන්; සම්මසං, සම්මර්ශනයකරමින්; නිබ්බානං, නිර්වාණය; සමුපාගමි, අවබොධකළසේක.

189. සො, ඒශාක්‍යසිංහතෙම; සවාසනෙ, වාසනාසහිතවූ; කිලෙසෙ, සෙසුකෙලශයන්; අණුතරම්පිච, ස්වල්පමාත්‍රයකුදු (නොතබා) ඛෙපෙන්තො, (අග්‍රමාර්ගඥානයෙන්) දවමින්; අරහත්තප්පත්තියා, අර්හත්ඵලයට පැමිණීමෙන්; සුද්ධො, පිරිසිදුසිත්ඇත්තේ; බොධිතලෙ, බෝමැඩදී; බුද්ධො අහු, බුදුවූසේක.

190. සො, ඒසම්‍යක්සම්බුද්ධතෙම; විමුත්තිං, අර්හත්ඵලවිමුක්ති යයි කියනලද; වරසෙතඡත්තං, උත්තමශ්වෙතච්ඡත්‍රය; පත්තො, ලදුයේ; පීතිවෙගෙන, ප්‍රීතිවෙගයෙන්; උදානං, "අනෙකජාතිසංසාරං" යනාදි ප්‍රීතිවාක්‍යය; උදීරයී, ප්‍රකාශකෙළේය; මාරෙ, පස්මරුන්; ජෙත්වාන, පරදවා; විජිතාරිසඞ්ඝො, දිනූසතුරුසෙන් ඇත්තේ; තිබුද්ධඛෙත්ත, ත්‍රිවිධබුද්ධක්ෂෙත්‍රයට; එකදිවාකරො, අද්විතීයසූර්යයෙක්; අහු, වී.

## ස ත් න ස ඞ් ත .

191. රාජාධිරාජා පන මෙව මාසි
තිඡත්තධාරී වරධම්මරාජා,
මහාසහස්සිම්හි ච ලොකධාතුයා
සරෙන විඤ්ඤාපයිතුං සමත්ථො,

192. “බුද්ධාලොකාලොකෙ ලොකෙ
ජාතො සත්තො කොනුම්මත්තො,
බුද්ධං බුද්ධං ඔඝා තිණ්ණං
සද්ධො පඤ්ඤො කො නො වන්දෙ.”

193. භජිතං වජ්ජිතං පවනං භවනං
ජහිතං ගහිතං සමලං අමලං,
සුගතං අගතං සුගතිං අගතිං
නමිතං අමිතං නමති සුමති.

**ඉති සාධුජනානන්දනනිදානෙ ජිනාලඞ්කාරෙ**
**අභිසම්බොධිදීපනී ගාථා නිට්ඨිතා.**

---

191. එවං, මෙසේ; රාජාධිරාජා, (මනුෂ්‍ය-දෙව-බ්‍රහ්ම යන තුන්ලොව රජුන්ට) ශ්‍රේෂ්ඨරාජන්වූ; තිඡත්තධාරී, (මනුෂ්‍ය-දෙව-විමුක්ති යන) ත්‍රිවිධඡත්‍රධාරීවූ; වරධම්මරාජා ආසි, උත්තමධර්මරාජයෙක්වී; සො, ඒසර්වඥතෙම; මහාසහස්සිම්හි ලොකධාතුයා, මහාසහශ්‍රීලොකධාතුවෙහි; (වැසිසත්වයන්ට) සරෙන, බ්‍රහ්මස්වරනගා දෙශනාකිරීමෙන්; විඤ්ඤාපෙතුං, ධර්මාවබොධයකරවන්ට; සමත්ථො ච ආසි, පොහොසත්ද වී.

192. බුද්ධාලොක, චරණාදිපචවිධබුද්ධතෙජසින්; ආලොකෙ, දීප්තිමත්වූ; ලොකෙ, ලෙව්හි; ජාතො, උපන්නාවූ; අනුම්මත්තො, උමතුනුවූ; කොසත්තො, කවරසත්වයෙක්ද; සද්ධො, ශ්‍රද්ධාසම්ප්‍රයුක්ත වූ; පඤ්ඤො, ප්‍රඥාසම්පන්නවූ; කොසත්තො, කාවරසත්වයෙක්ද; ඔඝා, (කාම-භව-දෘෂ්ටි-අවිද්‍යා යන) චතුරොඝයෙන්; තිණ්ණං, එතරවූ; බුද්ධං, සවිනේදත්තාවූ; බුද්ධං, සර්වඥවරයා; නොවන්දෙ, නොවඳින්නේද? (වඳින්නේමැයි.)

193. පවනං, විවෙකස්ථානය; භජිතං, සෙව්යාවූ; භවනං, ගෘහයන්; වජ්ජිතං, හැරියාවූ; සමලං, රාගාදිපාපමලය; ජහිතං, පහකළාවූ; අමලං, නිර්මලවූ සම්බොධිය; ගහිතං, අවබොධකළාවූ; සුගතිං, නිර්වාණයට; සුගතං, යහපත්වගියාවූ; අගතිං, ඡන්දාදිඅගතියකට; අගතං, නොගියාවූ; නමිතං, (දිව්‍යබ්‍රහ්මාදීන් විසින්) නමස්කාරකරණලද; අමිතං, අප්‍රමාණගුණොපෙතවූ හෝ අසදෘශ වූ සර්වඥයා; සුමති, ප්‍රාඥතෙම; නමති, නමස්කාරකරයි.

සාධුජන, සුදිජනයන්ට; ආනන්දන, සන්තොෂගෙණදීමට; නිදානෙ, කාරණාවූ; ජිනාලඞ්කාරෙ, ජිනාලඞ්කාරනම් ප්‍රකරණයෙහි, අභිසම්බොධිදීපනීගාථා, අභිසම්බොධියප්‍රකාශිත ගාථාවෝ; ඉති, මෙතෙකින්; නිට්ඨිතා, නිමියාහ.

## ජිනාලඞ්කාරය.

**194.** සම්මාසම්බොධිඤාණං හතසකලමලං සුද්ධතො වා තිසුද්ධං
අද්ධා ලද්ධං සුලද්ධං වතම්ති සතතං චින්තයන්තො සුබොධිං,
සත්තාහං සත්තමෙවං විවිධඵලසුඛං වීතිනාමෙසි කාලං
බ්‍රහ්මනාරාධිතො සො ඉසිපතනවනෙ වත්තායී ධම්මචක්කං.

**195.** බ්‍රහ්මස්සරං තං කරවීකභාණිං
යපිච්ඡිතං සාධයිතුං සමත්ථං,
සබ්බංපියං භූතහිතං වදන්තං
න පූජයෙ කො'ධ සචෙතනො හි.

**ඉති සාධුජනානන්දනනිදනෙ ජිනාලඞ්කාරෙ දෙසනාඤාණදීපනී ගාථා නිට්ඨිතා.**

---

194. හත, නසනලද; සකලමලං, සියලුපාපමලඇති; සුද්ධතොච, පිරිසිදුවගයෙනුදු; අතිසුද්ධං, ඉතාපිරිසිදුවූ; සම්මාසම්බොධිඤාණං, සර්වඥතාඥනය; අද්ධා, එකාන්තයෙන්; ලද්ධං, ලද්දේය; වත, එකාන්තයෙන්; සුලද්ධං, (සම්‍යක්සම්බොධිඥනය) මනාවලද්දේයයි; සතතං, නිතොර; චින්තයන්තො, සිතමින්; සත්තාසත්තාහං, සත්සතියක්මුලුල්ලෙහි; එවං, මෙසේ; විවිධඵලසුඛං, නොයෙක්වැදෑරුම්පලසමවත්සුවයෙන්; කාලං, කල්; වීතිනාමෙසි, ඉක්මවූසේක; (පසුව) සො, ඒසර්වඥතෙම; බ්‍රහ්මනා, සහම්පතිනම් මහාබ්‍රහ්මයා විසින්; ආරාධිතො, අයදනාලද්දේ; ඉසිපතනවනෙ, ඍෂිපතනාරාමයෙහිදී; ධම්මචක්කංවත්තායී, දම්සක්පැවැත්වූසේක.

195. බ්‍රහ්මස්සරං, බ්‍රහ්මයාගේ හඬමෙන් මිහිරිහඬඇති; කරවීකභාණිං, කොවුලන්ටබඳුනාදඇති; යපිච්ඡිතං, යමෙප්සිතයක්; සාධයිතුං, සිදුකරන්නට; සමත්ථං, පොහොසත්වූ; භූතහිතං, සත්වයන්ටහිතවූ; පියං, ප්‍රියවූ; සබ්බං, (ඓහලෞකිකපාරලෞකික) සියලුඅර්ථයන්; වදන්තං, ප්‍රකාශකරන්නාවූ; තං, ඒසර්වඥයා; ඉධ, මෙලෙව්හි; සචෙතනො, චෙතනාසම්ප්‍රයුක්තවූ; කොහි, කවරෙක්වනාහි; නපූජයෙ, නුපුදන්නේද? (පුදන්නේමැයි.)

සාධුජන, හුදිජනයන්ට; ආනන්දන, සන්තොෂගෙණදීමට; නිදනෙ, කාරණාවූ; ජිනාලඞ්කාරෙ, ජිනාලඞ්කාරනම් ප්‍රකරණයෙහි; දෙසනාඤාණදීපනීගාථා, දෙශනාඥනයප්‍රකාශකවූ ගාථාවෝ; ඉති, මෙතෙකින්; නිට්ඨිතා, නිමියාහුයි.

---

## ස න් න ස හි ත.

196. ඉද්ධී ච ආදෙසනානුසාසනී
තිපාටිහීරෙ භගවා වසී අහු,
කත්වාන අච්ඡෙරසුපාටිහීරං
දෙසෙසි ධම්මං අනුකම්පිමං පජං.

197. ඉද්ධී ච ආදෙසනානුසාසනී
තිපාටිහීරෙ භගවා වසී අහු,
තං තාදිසං ඉද්ධිවිකුබ්බණං වරං
අකාසි යො තං සුගතං නමාමි.

**ඉති සාධුජනානන්දනනිදානෙ ජිනාලඞ්කාරෙ
තිපාටිහාරියදීපනී ගාථා නිට්ඨිතා.**

---

196. ඉද්ධි, ("එකොපි හුත්වා බහුධා හොති" යනාදීන් දක්වනලද) ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍යයද; ආදෙසනා, ("එවම්පි තෙ මනො ඉත්ථම්පි තෙ මනො" යනාදි මෙර මාගේ චිත්තාචාරදැනීම් ලක්‍ෂණවූ) ආදෙශනාප්‍රාතිහාර්‍ය්‍යයද; අනුසාසනීච, ("එවං විතක්කෙථ මා එවං විතක්කෙථ" යනාදි සර්‍වඥවරයන්ගේ ධර්‍මදෙශනා කිරීම්සඞ්ඛ්‍යාත) අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍යයද යන; තිපාටිහීරෙ, ප්‍රාතිහාර්‍ය්‍යත්‍රයෙහි; භගවා, භාග්‍යවත්තෙම; වසී, පඤ්චප්‍රකාරවසියෙන් උපලක්‍ෂිතවූයේ; අහු, වීය; අච්ඡෙර, ආශ්චර්‍ය්‍යමත්වූ; සුපාටිහීරං, මනාප්‍රාතිහාර්‍ය්‍යයන්; කත්වාන, කොට; ඉමංපජං, මේප්‍රජාවට; අනුකම්ප, කරුණාකොට; ධම්මං, ශ්‍රීසද්ධර්‍මය; දෙසෙසි, දෙසූසේක.

197. ඉද්ධි, (උක්තප්‍රකාර) ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍යයද; ආදෙසනා, ආදෙශනාප්‍රාතිහාර්‍ය්‍යයද; අනුසාසනීච, අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍යයද යන; තිපාටිහීරෙ, ත්‍රිවිධප්‍රාතිහාර්‍ය්‍යයෙහි; යො, භගවා, යම්සර්‍වඥයෙක්; වසී; පඤ්චප්‍රකාරවසියෙන් උපලක්‍ෂිතවූයේ; අහු, වීද; තාදිසං, එබඳුවූ; වරං, උතුම්වූ; තංඉද්ධිවිකුබ්බණං, ඒඍද්ධිවිකුර්‍වණය. අකාසි, කළසේක්ද. තංසුගතං, ඒසර්‍වඥයා. නමාමි, (සකසා) වඳිමි.

සාධුජන, හුදිජනයන්ට. ආනන්දන, සන්තොෂගෙණදීමට. නිදානෙ, කාරණවූ. ජිනාලඞ්කාරෙ, ජිනාලඞ්කාරනම් ප්‍රකරණයෙහි. තිපාටිහාරියදීපනීගාථා, ත්‍රිවිධප්‍රාතිහාර්‍ය්‍යයන් ප්‍රකාශක ගාථාවෝ. ඉති, මෙතෙකින්. නිට්ඨිතා, නිමියාහුයි.

---

## ජි නා ල ඞ්කා ර ය .

198. එවං හි බුද්ධත්ත මුපාගතො සො
දෙසෙසි ධම්මං සනරාමරානං,
නානානයෙහා'භිසමෙසි සත්තෙ
තස්මා හි ඛ්‍යාතො තිභවෙසු නාථො.

199. අද්ධා ලද්ධා ධම්මා ලොකං
දිට්ඨා පත්තා ඤාතා සච්චං,
තිණ්ණා රාගා දොසා මොහා
ථොමෙසුං තෙ දෙවබ්‍රහ්මා.

200. මුනිරාජවරො නරරාජවරො
දිවි දෙවවරො සුචිබ්‍රහ්මවරො,
සකපාපහරො පරපාපහරො
සකවුද්ධිකරො පරවුද්ධිකරො.

---

198. එවංහි, මෙසේම; හෙවත් මාවිසින් මෙහි දක්වනලද ආකාරයෙන්ම. බුද්ධත්තං, බුදුබවට; උපාගතො, පැමිණියාවූ; සො, ඒසම්‍යක්සම්බුද්ධතෙම; සනරාමරානං, දෙව්මිනිස්සහිත සත්ත්වයන්ට; ධම්මං, ශ්‍රීසද්ධර්මය; දෙසෙසි, දෙසූසේක්ද; සත්තෙ, සත්ත්වයන්ට; නානානයෙහි, නොයෙක් ක්‍රමයෙන්, හෙවත් එකනාදිසතරක්‍රමයෙන්; අභිසමෙසි, ධර්මාවබොධය කළසේක්ද; තස්මාහි, එහෙයින්ම; නාථො, ලොකස්වාමිතෙම; තිභවෙසු, භවත්‍රයෙහි; ඛ්‍යාතො, (ගුණමහිමයෙන්) පතළේයි.

199. තෙදෙවබ්‍රහ්මා, ඒදෙව්මිනිස්සහිතසත්ත්වයෝ; අද්ධා, එකාන්තයෙන්; ධම්මාලොකං, සිව්සස්දෙසුම්නැමැතිආලොකය; ලද්ධා, ලැබ; සච්චං, චතුඃසත්‍යය; දිට්ඨා, (ඇසින්රූදක්නාසේ)දුටුවාහු; පත්තා, (හස්තතලයට පමුණුවනලද්දක්සේ සිතා) පැමිණියාහු; ඤාතා, (ඥානයෙන්) අවබොධකළාහු; රාගා, රාගයෙන්ද; දොසා, ද්වෙෂයෙන්ද; මොහා, මොහයෙන්ද; තිණ්ණා, එතරවූවාහු; ථොමෙසුං, (මුනිරාජවරො යනාදීන් ගියගියතැන) බුදුගුණවර්ණනාකළහ.

200. මුනිරාජවරො, (අපගේ ශාස්තෲන්වහන්සේ) මුනීන්ද්‍රොත්තමත්වනසේක; නරරාජවරො, නරෙන්ද්‍රොත්තමත්වනසේක; දිවි, දෙව්ලොව; දෙවවරො, දෙවොත්තමක්වනසේක; සුචි, පවිත්‍රවූ; බ්‍රහ්මවරො, බ්‍රහ්මොත්තමත්වනසේක; සකපාපහරො, ස්වකීය පාපයනුත්නසනසේක; පරපාපහරො, අන්‍යයන්ගේ පවුත් නසනසේක; සකවුද්ධිකරො, ආත්මාභිවෘද්ධියත්කරණසේක; පරවුද්ධිකරො, පරාභිවෘද්ධියත්කරණසේක.

## ස න් න ස හි ත.

201. සතරාමරබ්‍රහ්මගණාභිරුතා
අරහාදිගුණා විමලා විපුලා,
නවධා වසුධා ගගනෙ ගහනා
සකලෙ තිදිවෙ තිභවෙ විසතා.

202. යෙ පිස්ස තෙ භගවතො හි අචින්තියාදි
සුද්ධාති' සුද්ධතරබුද්ධ ගුණා හි සබ්බෙ,
සඞ්ඛෙපතො නවවිධෙසු පදෙසු ඛ්‍යාතා
වක්ඛාමි' දානි අරහාදිගුණෙ අහම්පි.

---

201. (දිව්‍යබ්‍රහ්මාදීන් විසින් භගවත්හුගේ ගුණකීර්තනය සතු
තිවාරයෙන් කළපරිදි සැකවින්දක්වා දැන් නවඅරහාදිගුණකථ
නය පෘථක් පෘථක්ව කළබැව්දක්වන්නෝ "**සතරාමරබ්‍රහ්ම
ගණාභි**" යනාදිය කියත්) සතරාමරබ්‍රහ්මගණා, මනුෂ්‍යයන්
සහිතදිව්‍යබ්‍රහ්මසමූහයාවිසින්; අභිරුතා, කථනයකළාවූ; විමලා, නි
ර්මලවූ; විපුලා, මහත්වූ; අරහාදිගුණා, අර්හදාදිගුණයෝ; වසුධා, පො
ළෝතෙලෙහිද; හෙවත් මිනිස්ලෙව්හිද; ගගනෙ, අහස්හිද; හෙ
වත් දෙව්ලෝබඹලෝදෙක්හිද; ගහනා, ගුම්බවූ වාහු; (නොයෙක්
දෙනාගේ මුඛවලින් නිතරකියනලද්දැහු යනුයි) සකලෙ, දසදහ
සක්සක්වළද; තිදිවෙ, දෙව්ලොවද; තිභවෙ, භවත්‍රයෙහිද; නව
ධා, නවාකාරයකින්: විසතා, (මුහුදුපිට බහාලූ තෙලක්සේ)
පතළාහුයි.

202. හි, (යස්මා) යම්හෙයකින්; අස්සභගවතො, ඒභාග්‍ය
වත්හුගේ; අචින්තියාදි, අචින්ත්‍යයවූ; (ආදිපදයෙන් ගම්‍යවූ අමෙය්‍ය
වූද; අතුල්‍යවූද අවාච්‍යවූද) යෙතෙ සබ්බෙ, යම් ඒසියලු; සුද්ධ,
පිරිසිදුවූවන්අතුරෙන්; අතිසුද්ධතර, ඉතාම්පිරිසිදුවූ; බුද්ධගුණා හි,
බුද්ධගුණකෙනෙක්වනාහි; සඞ්ඛෙපතො, සැකෙවින්; හෙවත් දිව්‍ය
මනුෂ්‍යයන්කෙරෙහි නොයෙක් ලෙසින් පතළකීර්තිගුණයන් ග
කුලා ජාතිවශයෙන්; නවවිධෙසු පදෙසු, ('**අරහං සම්මාසම්බුද්ධො**'
යනාදි) නවවිධපදයන්හි; ඛ්‍යාතා, (බුදුහුවිසින්ම) බහනලද්දැහුද;
අහං අපි, මමද; ඉදානි, මේ ග්‍රන්ථකරණප්‍රස්තාවෙහි, අරහාදිගුණෙ,
(ඒ) අර්හදාදිගුණයන්; වක්ඛාමි, කියමි.

## ජිනාලඞ්කාරය.

203. සො චි'ධ ජාතො අරහං නිරාසො
සම්මාභිසම්බුද්ධ සමන්තචක්ඛු,
සම්පන්නවිජ්ජාචරණො'ඝතිණ්ණො,
සම්මාගතො සො සුගතො ගතොධි.

204. අවෙදි සො ලොක මිමං පරඤ්ච
අනුත්තරො සාරථි දම්මසත්තෙ,
සදෙවකානං වරසත්ථු කිච්චං
අකාසි බුද්ධො භගවා විසුද්ධො.

---

203. සොච, (දුක්වූපරිද්දෙන් සතුතිකරණුලැබූ) ඒමහාපුරුෂ තෙමේද; ඉධ, මේමිනිස්ලෙව්හි; ජාතො, උපන්සේක්; නිරාසො, වීතරාගීවූ; අරහං, "අර්හත්" (වීය) සො, ඒමහාපුරුෂතෙම: සම්මා, යහපත්සේ; හෙවත් අවිරුද්ධප්‍රතිපදාවෙන්ගොස්; අභිසම්බුද්ධ, චතුඃසත්‍යාවබොධයකළාවූ; සමන්තචක්ඛු, සමන්තැස්ඇත්තේ; (වීය) (මෙයින් බුදුහු "සම්‍යක්සම්බුද්ධ" යයි දක්වනලදහ) සො, ඒමහා පුරුෂතෙම; සම්පන්න, සමෘද්ධවූ; විජ්ජාචරණ, අෂ්ටවිද්‍යාපසළොස් චරණධර්මයන් කරණකොටගෙණ;ඕඝතිණ්ණො, එතරකළාවූ චතුරොඝඇත්තේ;(වීය) (මෙයින් භගවත්හු "විද්‍යාචරණසම්පන්න" ය යිකියනලදහ) සො, ඒමහාපුරුෂතෙම; සම්මා, යහපත්සේ; ගතො, (දීපඞ්කරාදිබුදුවරයන්මෙන් පිළිවෙත් නොවරදවා) ගියාවූ; ගතොධි, (ගුණවශයෙන්හා විෂයවශයෙන්ද) ඉක්මගියමර්‍ය්‍යාදාඇති; හෙවත් අප්‍රමාණ ගුණඇති; සුගතො, "සුගත්" (වීය).

204. සො, ඒමහාපුරුෂතෙම; ඉමංලොකං, මේලොකයද; පරංලොකඤ්ච, සෙසුලොකයන්ද; නොහොත් ඉමංලොකං, ස්වකීයස්කන්ධසන්තානයද; පරංලොකඤ්ච, මෙරමාගේ ස්කන්ධසන්තානයන්ද; අවෙදි, දත්සේක: හෙවත් සියලුසත්වයන්ගේ ආශයානුශය චරිතාධිමුක්තිඉන්ද්‍රියපරොපර්‍ය්‍යත්වයදත්සේක; (මෙයින් භගවත්හු "ලොකවිදූ" යයි දක්වනලදහ) සො, ඒමහාපුරුෂතෙම; දම්මසත්තෙ, දමනයකටයුතුවූ උද්ඝටිතඥාදිසත්වයන්විෂයෙහි; අනුත්තරො, අසදෘශවූ; සාරථි, සාථිවාහකයෙක්; (වීය) (මෙයින් බුදුහු "පුරුෂදම්‍යසාරථි" යයි දක්වනලදහ) සො, ඒමහාපුරුෂතෙම; සදෙවකානං, දෙවියන්සහිතලෝකයාසම්බන්ධවූ; වරසත්ථුකිච්චං, උත්තමශාස්තෘකෘත්‍යය; අකාසි, කළසේක; (මෙයින් භගවත්හු "සත්ථා දෙව මනුස්සානං" යයි දක්වනලදහ) සො, ඒමහාපුරුෂ තෙම; බුද්ධො, අවිද්‍යානැමැතිනිද්‍රාවටපැමිණිප්‍රජාව අභිනවාභිඥානවිද්‍යාවගේ නිපදවීමෙන් ප්‍රබොධය කළහෙයින්

## ස න් න ස හි ත .

205\. ඉති විතතමනන්තං කිත්තිසම්භාර සාරං
සකලදසසහස්සී ලොකධාතුම්හි නිච්චං,
උපචිතසුභහෙතුං පස්සතා’ නන්තකාලං
තදිහ සුගතබොධිං සාධුකං චින්තනීයං.

206\. තක්කබ්‍යාකරණඤ්ච ධම්මවිනයං සුත්වා’සි යො පඤ්ඤවා
නෙතා’ යං සුචිසාරභූතරචනා විඤ්ඤූයතෙ කෙවලං,
හෙතුඤ්චා පි ඵලෙන තෙනව ඵලං සම්පස්සමානො තතො
බොධිං සද්දහතෙ’ ච තස්ස මහතා වායාමතො සම්භවං.

---

“බුද්ධ” (වීය) සො, ඒමහාපුරුෂතෙම; භගවා, අපරිමිතකාලයෙක්
හි රැස්කළ භාග්‍යඇතිහෙයින් “භාග්‍යවත්” (වීය) විසුද්ධො, (මෙ
කීනාමපදයකින් විශුද්ධිය කියනලද හෙයින් ඒමහාපුරුෂතෙම) විශෙ
ෂයෙන් පිරිසිදුවීය.

205\. ඉති, මෙසේ; සකලදසසහස්සීලොකධාතුම්හි, සියලුදස
දහසක්ලෝදෑහි; නිච්චං, සතතයෙන්; විතතං, පතළාවූ; අනන්තං,
අපර්‍යන්තවූ; කිත්තිසම්භාරසාරං, උත්තමකීර්තිසම්භාරයද; අනන්ත
කාලං, බොහෝකලක්; උපචිත, (දානශීලාදිපාරමිතාබලයෙන්)
රැස්කළාවූ; සුභහෙතුං, සුකෘතකර්මයන්ගේ හෙතුද; හෙවත් රැස්
කළාවූ කුශලකර්මයන්ගේ මූලද; ඉහ, මේ ග්‍රන්ථයෙහිලා; පස්සතා,
බලන්නාහුවිසින්: තං, ඒ; සුගතබොධි, සර්වඥතාඥානය; සාධුකං
මනාකොට; චින්තනීයං, සිතියයුතුයි.

206\. යො, යමෙක්; තක්ක. (ප්‍රමාණ ප්‍රමෙයාදි ෂොඩශපදා
ර්ථයන් ප්‍රකාශිත) තර්කශාස්ත්‍රයද; ව්‍යාකරණඤ්ච, (අර්ථවත්පරිද්දෙ
න් ශබ්දප්‍රතිපාදනය උගන්වන) ව්‍යාකරණයද; ධම්මවිනයං, සූ
ත්‍රාභිධර්මයන්හා විනයප්‍රඥප්තිද; සුත්වා, (අර්ථප්‍රතිබොධයවනසේ) අ
සා; පඤ්ඤවාආසි, ප්‍රඥාසම්ප්‍රයුක්තයෙක්වීද; නෙතා, ඔහුවිසින්; අ
යං, මේ; සුචි, (තර්කව්‍යාකරණන්‍යායාලඞ්කාරාදි ක්‍රමසමන්විතව
අර්ථප්‍රතීතියමනාසේවනහෙයින්) පිරිසිදුවූ; සාරභූත, (ඵල්ගුපදාර්
පරිහාරයෙන් දැක්වූහෙයින්) සාරවූ; නොහොත් ලෞකිකලො
කොත්තරගුණාතිශයසාධනෛකසාධනභාවයෙන්) ශ්‍රෙෂ්ඨවූ; රච
නා, රචනාතොමෝ; කෙවලං, හුදෙක්; විඤ්ඤූයතෙ, දනු ලැබේ;
තතො, අනතුරුව; ඵලෙන, බුද්ධභාවසඞ්ඛ්‍යාතඵලයකරණකොට
ගෙණ; හෙතුඤ්ච අපි, දානශීලාදිහෙතුද; තෙනව, ඒදානශීලාදි
හෙතුකරණකොටගෙණද; ඵලඤ්ච, බුද්ධභාවසඞ්ඛ්‍යාතඵලයද; සම්ප
ස්සමානො, නුවනින් සලකා බලන්නේත්; මහතා, දැඩිවූ; වායාමතො,
උත්සාහයෙන්; සම්භවං, සිදුවූ; තස්ස, ඒභගවත්හුගේ; බොධිං,
සම්බොධිය; සද්දහතිඑව, අදහාමැයි.

## ජි නා ල ඞ්කා ර ය.

207. යො සද්දහන්තො පන තස්ස බොධිං
වුත්තානුසාරෙන යථානුවෙදී,
කථෙති චින්තෙතිව සො මුහුත්තං
ඔහාය පාපානි උපෙති සන්තිං.

208. "සද්ධෙය්‍යා තෙ චින්තෙය්‍යා තෙ
වන්දෙය්‍යා තෙ පූජෙය්‍යා තෙ,
බුද්ධාලොකා ලොකෙ ලොකෙ
ජාතෙන තං පත්ථෙන්තෙන."

**ඉති සාධුජනානන්දනනිදානෙ ජිනාලඞ්කාරෙ නවගුණදීපනී ගාථා නිට්ඨිතා.**

---

209. තස්මා හි ජාතොවරකම්හි තස්ස
ආයත්තකෙ මඞ්ගලචක්කවාළෙ,
භුතෙහි වත්ථූහි මනොරමෙහි
පූජෙමි තං පූජිතපූජිතං පුරා.

---

207. යො, යමෙක්; තස්ස, ඒභාග්‍යවත්හුගේ; බොධිං, සම්බොධිය වුත්තානුසාරෙන, යටදක්වූනියායෙන්; සද්දහන්තො, අදහන්නේ; යථානුවෙදී, තථාකාරයෙන්දන්නාසුලුවූයේ; මුහුත්තං, මොහොතක්කල්; කථෙති, කියාද; චින්තෙතිව, සිතාද; සො, හෙතෙම; පාපානි, පව්; ඔහාය, හැරපියා; සන්තිං, නිවනට; උපෙති, පැමිණෙයි.

208. බුද්ධාලොක, චරණාදිපඤ්චවිධබුද්ධතෙජසින්; ආලොකෙ, ප්‍රභාමත්වූ; ලොකෙ, ලෙව්හි; ජාතෙන, උපන්නාවූ; එතං, මේ සම්බොධිය; පත්ථෙන්තෙන, පතන්නාහුවිසින්; තෙ, ඒ බුද්ධගුණයෝ; සද්ධෙය්‍යා, ඇදහියයුත්තාහ; තෙ, ඒ බුද්ධගුණයෝ; චින්තෙය්‍යා, සිතියයුත්තාහ; තෙ, ඒ බුද්ධගුණයෝ; වන්දෙය්‍යා, වැන්දයුත්තාහ; තෙ, ඒ බුද්ධගුණයෝ; පූජෙය්‍යා, පිදියයුත්තාහ.

සාධුජන, හුදිජනයන්ට; ආනන්දන, සන්තොෂගෙණදීමට; නිදාන, කාරණාවූ; ජිනාලඞ්කාරෙ ජිනාලඞ්කාරනම් ප්‍රකරණයෙහි; නවගුණදීපනීගාථා, අභිදදීනවවිධබුද්ධගුණ ප්‍රකාශක ගාථාවෝ; ඉති, මෙතෙකින්; නිට්ඨිතා, නිමියාහුයි.

---

209. (මෙසේ හගවත්හුගේ ගුණවර්ණනාකොට දැන් උන්වහන්සේට කළයුතුපූජාවිධි දක්වන්නෝ "තස්මාහි" යනාදිය කියත්); හි, (යස්මා) යම්හෙයකින්; (බෝසත්හට සියලු සක්වළ ජාතොවරකයක්මෙන් වීද) තස්මා, එහෙයින්; තස්ස, උන්වහන්

## සන්තසහිත.

210. සො’ හං අජ්ජපනෙ තස්මිං චක්කවාලෙ සුඵුල්ලිතෙ,
ථලජෙ ජලජෙවා’ පි සුගන්ධෙ ච අගන්ධකෙ.

211. මනුස්සෙසු අනෙකෙසු තළාකුය්‍යානවාපිසු,
පවතෙ හිමවන්තස්මිං තස්මිං සත්තමහාසරෙ.

212. පරිත්තදීපෙ ච සහස්සෙ මහාදීපෙ සුපුප්ඵිතෙ,
සත්තපරිභණ්ඩසෙලෙසු සිනෙරුපබ්බතුත්තමෙ.

213. කුමුදුප්පලකාදීනි නාගානං භවනෙසු හි,
පාටලාදීනි පුප්ඵානි අසුරානං හි ආලයෙ.

214. දෙවෙසු දිබ්බපුප්ඵානි කොවිළාරාදිකානිතු,
එවමාදි අනෙකානි පුප්ඵිතෙ ධරණීතලෙ.

---

සේට; ආයතනකෙ, අයත්වූ; ජානොවරකමහි, ජන්මගෘහයක්වූ; මඞ්ගලචක්කවාලෙ, මගුල්සක්වලෙහි; භූතෙහි, හටගත්තාවූ; මනොරමෙහි, සිත්අලවන්නාවූ; වත්ථූහි, පූජාභිවස්තුවලින්; පුරා, පූර්වයෙහි, පූජිතපූජිතං, පූජාභියන්විසින් පුදනුලැබූ; තං, ඒබුදුහු; පූජෙමි, පුදමි.

210. සො අහං, (සියලුපූජාභිවස්තුවලින් බුදුහු පුදනු කැමැති වූ) ඒමම; අජ්ජපන, මෙකල්හි වනාහි; එතස්මිං චක්කවාලෙ, මේ මගුල්සක්වලෙහි; සුඵුල්ලිතෙ, මනාවපිපියාවූ; ථලජෙ, ගොඩහට ගත්තාවූද; ජලජෙච, දියෙහිහටගත්තාවූද; සුගන්ධෙච, සුවඳවත් වූද; අගන්ධකෙ, සුවඳනැත්තාවූද.

211. මනුස්සෙසු, මිනිස්ලොව; අනෙකසු, නොයෙක්තැන් හි; තළාක, විල්හිද; උය්‍යාන, උයන්හිද; වාපිසු, වැව්හිද; හිමවන්තස්මිං පවතෙ, හිමාලයවනයෙහිද; තස්මිං, ඒහිමාලයවන යෙහි; සත්තමහාසරෙ, මහවිල්සතෙහිද.

212. ච සහස්සපරිත්තදීපෙ, දෙදහසක්කොදෙව්හිද; මහාදීපෙ, සතරමහද්වීපයෙහිද; සත්තපරිභණ්ඩසෙලෙසු, සත්කුළුපව්හිද; සිනෙරුපබ්බතුත්තමෙ, මහාමෙරුපර්වතයෙහිද; සුපුප්ඵිතෙ, මනාව විකසිතවූ (පුෂ්පයන්ද).

213. නාගානංභවනෙසු, නාලොවැ; කුමුදුප්පල්කාදීනි, කඩුපුල්ආදිවූ; පුප්ඵානි, පුෂ්පයන්දඃ අසුරානංහිආලයෙ, අසුරභවන යෙහි; පාටලාදීනි, පලොල්ආදිමල්ද.

214. දෙවෙසු, දෙව්ලෙව්හි; කොවිළාරාදීනි, පරසතුආදිවූ; දිබ්බපුප්ඵානි, දිව්‍යකුසුමයන්ද; එවමාදි, මේආදිවූ; අනෙකානි, නොයෙක්තැන; පුප්ඵිතෙ, පිපියාවූ (පුෂ්පයන්ද.)

## ජිනාලඞ්කාරය.

215\. චම්පකා සලලා නීපා නාගපුන්නාගකෙතකා,
වස්සිකා මල්ලිකා සාලා කොවිළාරාච පාටලී.
216\. ඉන්දීවරා අසොකාච කණිකාරවකුලානි ච
පදුමා පුණ්ඩරීකා ච සොගන්ධිකුමුදුප්පලා.
217\. එතෙ' චඤ්ඤෙච රුක්ඛාච වල්ලියො චා'පි පුප්ඵිතා,
සුගන්ධා සුඛසම්ඵස්සා නානාවණ්ණනිභා සුභා.
218\. * විචිත්‍රනීලානෙකානි පීතලොහිතකානි ච,
කාලාසෙතාච මඤ්ජට්ඨා නෙකවණ්ණා සුපුප්ඵිතා.
219\. සොභතෙ පබ්බතෙහෙ' ත්ථ සරෙහි වනරාජිහි,
සන්දමානාහි ගඞ්ගාහි හිමවා රතනාකරො.
220\. පතනකිඤ්ජක්ඛරෙණූහි ඔකිණ්ණං [හොති තංවනං,
භමරා පුප්ඵගන්ධෙහි සමන්තා අභිනාදිතා.

---

215\. ධරණීතලෙ, පොළෝතෙලෙහි; චම්පකා, සපුය; සලලා, හොරය; නීපා, බක්මීය; නාග, නාය; පුන්නාග, දෙඹය; කෙතකා, වැටකේය; වස්සිකා, දෑසමන්ය; මල්ලිකා, බොලිද්දය; සාලා, සල්ය; කොවිළාරාච, කොබෝලීලය; පාටලී, පළොල්ය.

216\. ඉන්දීවරා, ඇසළය; අසොකාච, හොපලුය; කණිකාර, කිණිහිරිය; වකුලානිච, මුහුනමල්ය; පදුමා, පියුම්ය; පුණ්ඩරීකාච, හෙළපියුම්ය; සොගන්ධි, හෙල්මැලිය; කුමුද, ඕලුය; උප්පලා, උපුල්ය.

217\. එතෙච, මේවෘක්ෂයෝද; අඤ්ඤෙච, අනිකුදු; සුපුප්ඵිතා, මනාවවිකසිතවූ; සුගන්ධා, සුවඳවත්වූ; සුඛසම්ඵස්සා, සුවපහස්ඇති; නානාවණ්ණනිභා, නොයෙක්පැහැසටහන්ඇති; සුභා, ශොභනවූ; රුක්ඛාච, වෘක්ෂයෝද; වල්ලියොච, ලතාවෝද.

218\. විචිත්‍ර, විසිතුරුවණ්ණවූ; නීල, නිල්පැහැවූද; අනෙකානි, නොයෙක්; පීත, රන්වන්වූද; ලොහිතකානිච, රත්පැහැවූද; කාලා, කළුපැහැවූද; සෙතාච, සුදුපැහැවූද; මඤ්ජට්ඨා, මදටවන්වූද; අනෙකවණ්ණා, නොයෙක්වණ්ණවූද; සුපිප්ඵිතා, මනාවපිපියාවූ; වෘක්ෂකෙනෙක් හෝ ලතාකෙනෙක් (ඇත්තාහුද.)

219\. එත්ථ, මේපොළෝතෙලෙහි; රතනාකරො, රුවන්ආකරවූ; හිමවා, හිමාලයතෙම; පබ්බතෙහි, පර්වතවලින්ද; සරෙහි, විල්වලින්ද; වනරාජිහි, වනරොදින්ද; සන්දමානාහි, වැහෙන්නාවූ; ගඞ්ගාහි, ගඞ්ගාවලින්ද; සොභතෙ, හොබී.

220\. තංවනං, ඒහිමාලයවනය; පතනකිඤ්ජක්ඛරෙණූහි, කුසුමපත්‍රයෙන්හා මල්රෙණුවලින්ද; ඔකිණ්ණංහොති, ගැවසුනේවෙයි; භමරා, බමරු; පුප්ඵගන්ධෙහි, මල්සුවඳකරණකොටගෙණ; සමන්තා, හාත්පසැ; අභිනාදිතා, මොනවටනාදකරන්නාහ.

---

* 'විචිත්‍ර' යනු 'ජදාදීහිතත්‍රණ්' යන සූත්‍රයෙහි ත්‍රණ්පත්‍රයෙන්සිද්ධයි,

## සත්තසහිත.

221. අථෙ'ත්ථ සකුණා සන්ති දිජා මඤ්ජුස්සරා සුභා,
කූජන්ත මුපකූජන්ති උතුසම්පුප්ඵිතෙ දුමෙ.

222. නිජ්ඣරානං හි පාතෙන පබ්බතා අභිනාදිතා,
පඤ්චඞ්ගිකානි තුරියානි දිබ්බානි විය සූයරෙ.

223. තත්ථ නච්චන්ති ගායන්ති සෙලෙන්ති වාදයන්ති ච,
අච්ඡරා විය දෙවෙසු කින්නරා සමලඞ්කතා.

224. සුවණ්ණපබ්බතා තස්මිං ජලන්තග්ගිසිඛූපමා,
තස්මිං හි කිං නිසාකිච්චං පදීපෙන කරීයතෙ.

225. මුත්තාජාලා'ව දිස්සන්ති නිජ්ඣරානං හි පාතකා,
පජ්ජලන්තා'ව තිට්ඨන්ති මණී වෙළුරියාදයො.

---

221. අථ, ඉක්බිත්තෙන්; එත්ථ, මේවනයෙහි; මඤ්ජුස්සරා, මනොහරනාදඇති; සකුණා, පක්ෂීහුද; සුභා, ශොභනවූ; හෙවත් ප්‍රියදර්ශනීයවූ; දිජා, සියොත්හුද; සන්ති, වෙත්; (තෙ, ඔව්හු;) උතුසම්පුප්ඵිතෙ, සෘතුසමයෙහි මොනවටපිපියාවූ; දුමෙ, වෘක්ෂයන්හි; (හිඳ) කූජන්තමුපකූජන්ති, රැවපිළිරැව්දෙත්.

222. නිජ්ඣරානංහි, ගඞ්ගානිර්ඣරයන්ගේවනාහි; පාතෙන, වැගීමෙන්; පබ්බතා, පර්වතයෝ; අභිනාදිතා, මහානාදඇත්තාහු; දිබ්බානි, දිව්‍යමයවූ; පඤ්චඞ්ගිකානිතුරියානිවිය, පඤ්චාඞ්ගිකතූර්‍ය්‍යනාදයන්මෙන්; සූයරෙ, ඇසෙනු ලැබෙත්.

223. තත්ථ, එහි; දෙවෙසු, දෙව්ලොවැ; අච්ඡරාවිය, දිවසරුන්මෙන්; සමලඞ්කතා, සැරසුනාවූ; කින්නරා, කිඳුරගණෝ; නච්චන්ති, නටත්; ගායන්ති, ගීකියත්; සෙලෙන්ති, (මුවෙන්) උස්හෙලුම්හඬකෙරෙත්; වාදයන්තිච, වාදනයදකෙරෙත්.

224. තස්මිං, එහි; සුවණ්ණපබ්බතා, සවර්ණවර්ණපර්වතයෝ; අග්ගිසිඛූපමා, ගිනිසිළුමෙන්; ජලන්ති, දිලෙත්; තස්මිංහි, එහිවනාහි; පදීපෙන, පහන්වලින්; නිසාකිච්චං, රාත්‍රිකාලය සම්බන්ධවූ කෘත්‍යය; කිං? කුමට; කරීයති, කරණුලැබේද? (නොකරණු ලැබේමැයි.)

225. නිජ්ඣරානං පාතකාහි, ගඟුලැලිවැගීම්වනාහි; මුත්තාජාලාඉව, මුතුදැල්මෙන්; දිස්සන්ති, පැණෙත්; වෙළුරියාදයො, වෛඪූර්‍ය්‍යාදීවූ; මණී, මාණික්‍යයෝ; පජ්ජලන්තාඑව, ප්‍රකාශීයෙන් බබලන්නාහුම; තිට්ඨන්ති, පවතිත්.

## ජීනාලඞකාරය.

226. කාලානුසාරී තගරං කප්පූරං හරිචන්දනං,
සකුණානං හි සද්දෙන මයූරානං හි කෙකයා.

227. භමරානං හි නිනාදා කුඤ්චනාදෙන හත්ථිනං,
විජම්භිතෙන වාලානං කින්නරානං හි ගීතියා.

228. පබ්බතානං හි ඔභාසා මණීනං ජොතියා' පිච,
විචිත්‍රාබ්භවිතානෙහි දුමානං පුප්ඵවුට්ඨියා,
එවං සබ්බඞ්ගසම්පන්නං කිං සියා නන්දනං වනං.

229. එවං සුසමුජ්ජලවනම්හි යං යං
තහිං තහිං පුප්ඵිතපුප්ඵිතං සුභං,
මාලං සුසුද්ධඤ්ච මනුඤ්ඤගන්ධං
පූජෙමි තං පූජිතපූජිතං පුරා.

---

226. කාලානුසාරී, කළුවැල්ය; තගරං, තුවරලාය; කප්පූරං, කපුරුය; හරිචන්දනං, රත්සඳුනය; (යනමෙයින්ද) සකුණානංහි, සියොතුන්ගේවනාහි; සද්දෙන, රාවයෙන්ද; මයූරානංහි, මොණරුන්ගේවනාහි; කෙකයා, කෙකාධ්වනියෙන්ද.

227. භමරානංහි, බමරුන්ගේවනාහි; නිනාදා, නාදයෙන්ද: හත්ථිනං, ඇතුන්ගේ; කුඤ්චනාදෙන, කුඤ්චනාදයෙන්ද, වාලානං, චණ්ඩමෘගයන්ගේ; විජම්භිතෙන, වැජඹීමෙන්ද; කින්නරානංහි, කිඳුරන්ගේවනාහි; ගීතියා, ගායනාවෙන්ද.

228. පබ්බතානංහි, පර්වතයන්ගේවනාහි; ඔභාසා, ආලොකයෙන්ද; මණීනං, මාණික්‍යයන්ගේ; ජොතියාඅපි, කාන්තියෙන්ද; විචිත්‍ර, විසිතුරුවූ; අබ්භවිතානෙහි, මෙඝවිතානයෙන්ද; දුමානං, වෘක්ෂයන්ගේ; පුප්ඵවුට්ඨියා, කුසුමසමූහයෙන්; හෙවත් මල්සමුදාවලින්ද; නංවනං, ඒවනය; ඔක්කිණ්ණං, ගැවසීගත්තේ; හොති, වේද; කිං? කිම? නන්දනංවනං, (සක්දෙව්දුගේ) නදුන්වනය; එවං, මේආකාරයෙන්; සබ්බඞ්ගසම්පන්නං, සර්වාඞ්ගයෙන් යුක්තවූයේ; සියා, වන්නේද; (නොවන්නේමැයි.)

229. එවං, මෙසේ; තහිංතහිං, තන්හි තන්හි; හෙවත් දෙව්ලෝ නාලෝ හිමවත්ආදි ස්ථානයන්හිවූ; සුසමුජ්ජලවනම්හි, මනාව විකසිතවූවෙනෙහි; පුප්ඵිතපුප්ඵිතං, පිපුනු පිපුනු; සුභං, ශොභනවූ: සුසුද්ධං, අතිපරිසුද්ධවූ; මනුඤ්ඤගන්ධංච, සිත්කලුසුවඳැතිවූද; යංයංමාලං, යම්යම්මලක්වේද; (තෙන තෙන, ඒ ඒ මලින්;) පුරා, පෙර; පූජිත පූජිතං, පූජාහියන්විසින්පුදනලද; තං, ඒබුදුහු; පූජෙමි, පුදමි.

## ස ක් ත ස ඞ් ඛ ත.

230. නාගලොකෙ මනුස්සෙ ච දෙවෙ බ්‍රහ්මෙ ච යං සියා,
සාමුද්දියං භූමිගතං ආකාසට්ඨඤ්ච යං ධනං.
231. රජතං ජාතරූපඤ්ච මුත්තා වෙළුරියා මණී,
මසාරගල්ලං ඵලිකං ලොහිතඞ්කං පවාලකං.
232. යො සො අනන්තකප්පෙසු පූරෙත්වා දසපාරමී,
බුද්ධො බොධෙසි සත්තානං තස්ස පූජෙමි තං ධනං.
233. ඛොමකොසෙය්‍යකප්පාසසාණභඞ්ගානි කම්බලා,
දුකූලානි ච දිබ්බානි දුස්සානි විවිධානි තෙ.
234. අනන්තවත්ථදානෙන හිරොත්තප්පාදිසංවරං,
යස්ස සිද්ධං සියා තස්ස දුස්සානි පූජයාම'හං.
235. පවනෙ ජාතරුක්ඛානං නානාඵලරසුත්තමා,
අම්බා කපිත්ථා පනසා චොචමොචාදිනප්පකා.

---

230. නාගලොකෙ, නාලෙව්හිද; මනුස්සෙසුච, මිනිස්ලෙව් හිද; දෙවෙ, දෙව්ලෙව්හිද; බ්‍රහ්මෙච, බඹලෙව්හිද; සාමුද්දියං, සමුද්‍රයෙහිපවත්නාවූද; භූමිගතං, භූමිසත්වූද;* ආකාසට්ඨඤ්ච, ආකාශසත්වූද.

231. රජතං, රිදීය; ජාතරූපං, රන්ය; මුත්තා, මුතුය; වෙළුරියා, වෛදූර්‍ය්‍යය; මණී, මැණික්ය; මසාරගල්ලං, මැසිරිගල්ය; ඵලිකං, පලිඟුය; ලොහිතඞ්කං, පියුම්රාමිණිය; පවාලකං, පබළුය; (යන) යංයං ධනං, යම්යම්වස්තුවෙක්; සියා, වන්නේද.

232. යො සො බුද්ධො, යම්තථාගතයෙක්; අනන්තකප්පෙසු, අපරිමිතකල්පයන්හි; දසපාරමී, දසපෙරුම්; පූරෙත්වා, පුරා, සත්තානං, සත්වයන්ට; බොධෙසි, චතුඃසත්‍යාවබොධයකරවූසේක්ද; තස්ස, ඒතථාගතයන්ට; තං ධනං, ඒසියලුධනය; පූජෙමි, පුදමි.

233. ඛොම, කොමුපිළිය; කොසෙය්‍ය, තිහිරිපිළිය; කප්පාස, කපුපිළිය; සාණ, හණපිළිය; භඞ්ගානි, මුසුපිළිය; හෙවත්ඛොමාදිපස් හුයින්කළපිළිය; කම්බලා, පලස්ය; දුකූලානි, දුහුල්පිළිය; විවිධානි, නන්වැදෑරුම්වූ; දිබ්බානිදුස්සානි, දිවසළුය; (යන යම් යම් වස්ත්‍රකෙනෙක් වේද.)

234. අනන්තවත්ථදානෙන, නොයෙක්වස්ත්‍රදානයෙන්; යස්ස, යමක්හුගේ; හිරොත්තප්පාදිසංවරං, හිරිඔතප්ආදීන්ගේ සංවරණය; සිද්ධං, සිදුවූයේ; සියා, වන්නේද; අහං, මම; තස්ස, උන්වහන්සේට; දුස්සානි, (පූර්වෝක්ත) වස්ත්‍රයන්; පූජයාමි, පුදමි.

235. පවනෙ, මහවෙනෙහි; ජාතරුක්ඛානං, හටගත්වෘක්ෂයන්ගේ; නානාඵලරසුත්තමා, අනෙකවිධඵලරසයෙන් උතුම්වූ; අම්බා, අඹය; කපිත්ථා, ගිවුලුය; පනසා, කොස්ය; චොච, ඇට කෙසෙල්ය; මොචාදි, මස්කෙසෙල්යනාදීවූ; අනප්පකා, අනෙකඵල කෙනෙක් (වේද.)

## ජිනාලඞ්කාරය.

236. තස්මිං ගන්ධං රසං ඔජං බුද්ධසෙට්ඨස්ස පූජිය,
වන්දාමි සිරසා නිච්චං විප්පසන්නෙන චෙතසා.
237. පූජෙමි පඨමං තස්ස පණිධානං අචින්තියං,
චක්කවාළම්හි සබ්බෙහි විජ්ජමානෙහි වත්ථුහි,
238. දසන්නං පාරමීනන්තු පූරිතට්ඨාන මුත්තමං,
තතො සාලවනෙ රම්මෙ ජාතට්ඨානං චරිමකං.
239. ඡබ්බස්සානි පධානෙන කතං දුක්කරකාරිකං,
අපරාජිතපල්ලඞ්කං බුද්ධං බුද්ධගුණෙ තථා.
240. චුද්දසබුද්ධඤාණඤ්ච අට්ඨාරසඅවෙණිකං.
පූජෙමි දසබලඤාණං චතුවෙසාරජ්ජමුත්තමං.
241. ආසයානුසයෙ ඤාණං ඉන්ද්‍රියානං පරොපරං,
යමකං පාටිහීරඤ්ච ඤාණං සබ්බඤ්ඤුතමපිච.

---

236. තස්මිං, ඒ ඵලයන්හි; ගන්ධං, සුවඳද; රසං, රසයද; ඔජං, ඔජස්ද; බුද්ධසෙට්ඨස්ස, ශ්‍රෙෂ්ඨවූබුදුන්ට; විප්පසන්නෙන චෙතසා, පහන්වූසිතින්; පූජිය, පුදා; නිච්චං, නිතොර; සිරසා, මස්තකයෙන්; වන්දාමි, වඳිමි.

237. පඨමං, පළමුකොට; තස්ස, ඒතථාගතයන්ගේ; අචින්තියං, අචින්තයවූ; පණිධානං, ප්‍රණිධියට; චක්කවාළම්හි, සක්වලෙහි; විජ්ජමානෙහි, පවත්නාවූ; සබ්බෙහි වත්ථූහි, සියලුපූජාභිවස්තුවලින්; පූජෙමි, පුදමි.

238. තතො, ඉක්බිත්තෙන්; උත්තමං, ශ්‍රෙෂ්ඨවූ; දසන්නං පාරමීනං, දසපාරමිතාවන්; පූරිතට්ඨානන්තු, පිරූස්ථානයන්ටද; තතො, අනතුරුව; රම්මෙ, සිත්කලුවූ; සාලවනෙ, සල්වෙනෙහි; චරිමකං, පශ්චිමභවිකවූ; ජාතට්ඨානං, ජන්මභූමියටද.

239. තථා, එසේම; ඡබ්බස්සානි, සාවුරුද්දක්; පධානෙන, ප්‍රධානවීර්‍ය්‍යයෙන්; දුක්කරකාරිකං, දුෂ්කරක්‍රියා; කතං, කළාවූස්ථානයටද; අපරාජිතපල්ලඞ්කං, අපරාජිතපර්‍ය්‍යඞ්කයටද; බුද්ධං, බුදුන්වද; බුද්ධගුණෙ, බුදුගුණයන්ටද.

240. චුද්දසබුද්ධඤාණඤ්ච, තුදුස්බුදුනැණටද; අට්ඨාරසඅවෙණිකං, අටළොස්අවෙණිකධර්‍මයන්ටද; දසබලඤාණං, දශබලඥානයටද; උත්තමං, උතුම්වූ; චතුවෙසාරජ්ජං, චතුවෛශාරද්‍යඥානයටද; පූජෙමි, පුදමි.

241. ආසයානුසයෙ ඤාණං, ආශයානුශයඥානයද; ඉන්ද්‍රියානං පරොපරං, ඉන්ද්‍රියපරෝපර්‍ය්‍යඥානයද; යමකංපාටිහීරඤ්ච, යමකප්‍රාතිහාර්‍ය්‍යඥානයද; අපි, යලිත්; සබ්බඤ්ඤුතංඤාණංච, සර්‍වඥතාඥානයද.

## සත්තසහිත.

242. මහාකරුණාසමාපත්ති ඤාණං අනාවරණ මිති,
ඡ අසාධාරණානෙ' තෙ නත්වාන පූජයාම' හං.

243. තතො ච සත්තසත්තාහෙ ධම්මං සම්මසිතං නමෙ,
බ්‍රහ්මුනා යාචිතංඨානං ධම්මං දෙසයිතුං වරං.

244. ඉසිපතනම්හි මිගදායෙ ධම්මචක්කප්පවත්තනං,
තතො වෙළුවනාරාමෙ වසිතංඨානඤ්ච පූජයෙ.

245. තතො ජෙතවනං රම්මං චිරවුත්ථං මහෙසිනා,
අසාධාරණ මඤ්ඤෙසං යමකං පාටිහාරියං.

246. පාරිච්ඡත්තකමූලම්හි අභිධම්මඤ්ච දෙසනං,
සංකස්සනගරද්වාරෙ දෙවොරොහණකම්පි ච.

247. තථෙව හිමවන්තස්මිං මහාසමය දෙසනං,
වුත්තානෙ' තානි ඨානානි නත්වාන පූජයාම' හං,

---

242. මහාකරුණාසමාපත්තිඤාණං, මහාකරුණාසමාපත්තිඥානයද; අනාවරණං, අනාවරණඥානයද; ඡඅසාධාරණානි, ෂඩ් අසාධාරණඥානයද යන: එතෙ, මෙකීඥානයන්; අහං, මම; නත්වාන, වැඳ; පූජයාමි, පුදමි.

243. තතොච, ඉක්බිත්තෙන්ද; සත්තසත්තාහෙ, සත්සතියෙහිදී; ධම්මංසම්මසිතං, ධර්‍මසංමර්‍ශනයකළතැනට; හෙවත් මෙනෙහිකරණලැබූ තැනටද; බ්‍රහ්මුනා, සහම්පතීනම් මහාබ්‍රහ්මයා විසින්; වරං, උතුම්වූ; ධම්මං, ධර්‍මය; දෙසයිතුං, දෙසනු පිණිස; යාචිතංඨානං, අයැදිතැනටද; නමෙ, වඳිමි.

244. තතො, ඉක්බිති; ඉසිපතනම්හි, ඍෂිපතනයෙහි; මිගදායෙ, මෘගදායෙහිදී; ධම්මචක්කප්පවත්තනං, දම්සක්පැවැත්වූතැනටද; වෙළුවනාරාමෙ, වෙළුවනාරාමයෙහි; වසිතංඨානඤ්ච, වැඩවිසූතැනටද; පූජයෙ, පුදමි.

245. තතො, ඉක්බිති; මහෙසිනා, සර්‍වඥයන්විසින්; චිරවුත්ථං, බොහෝකල්විසූ; රම්මං, සිත්අලවියයුතුවූ; ජෙතවනං, ජෙතවනාරාමයද; අඤ්ඤෙසං, සෙස්සත්ට; අසාධාරණං, සාධාරණනුවූ; යමකංපාටිහාරියං, යම්මහපෙළහරපැවැත්වූතැනද.

246. පාරිච්ඡත්තකමූලම්හි, පරසතුරුක්මුලැ; අභිධම්මං, අභිධර්‍මය; දෙසනං අපි, දෙශනාකළතැනද; සංකස්සනගරද්වාරෙ, සකස්පුරදොර; දෙවොරොහණකං අපි, දෙවොරොහණයද.

247. තථාඑව, එසේම; හිමවන්තස්මිං, හිමාලයවනයෙහි; මහාසමයදෙසනං, මහාසමයසූත්‍රය දෙසූතැනදැයි; වුත්තානි, කියනලද; එතානිඨානානි, මෙතැන්; නත්වාන, වැඳ; අහං, මම; පූජයාමි, පුදමි.

## ජිනාලඞ්කාරය.

248\. චතුරාසීතිසහස්සෙහි ධම්මක්ඛන්ධෙහි සඞ්ගහං.
පිටකත්තයං යථාවුත්තවිධිනා පූජයාම'හං,

249\. මාරස්ස අත්තනො ආයුසඞ්ඛාරොස්සජනන්තිමෙ,
කුසිනාරාය මල්ලානං යමකසාලාන'මන්තරෙ.

250\. පණිධානම්හි පට්ඨාය කතකිච්චං අසෙසතො,
නිට්ඨාපෙත්වාන සො සත්ථා පරිනිබ්බායි අනාසවො.

251\. එවං නිබ්බායමානස්ස කතකිච්චස්ස තාදිනො,
චිරාගතා මහාකාරුණා න නිබ්බායිත්ථ කිඤ්චි'පි.

252\. යොවායං ධම්මො ච විනයො ච දෙසිතො සාධුකං මයා,
මම'ච්චයෙන වො සත්ථා ධාතුයො ච සරීරජා.

---

248\. චතුරාසීතිසහස්සෙහි, අසූසාරදහසක්පමණවූ; ධම්මක්ඛන්ධෙහි, දහම්කඳුවලින්; සඞ්ගහං, සඞ්ග්‍රහවූ; පිටකත්තයං, පිටකත්‍රයට; යථාවුත්තවිධිනා, යථොක්තවිධියෙන්; අහං, මම; පූජයාමි, පුදමි.

249\. අන්තිමෙ, අවසානයෙහි; කුසිනාරාය, කුසිනාරාවෙහි; මල්ලානං, මල්ලරජුන්ගේ; යමකසාලානමන්තරෙ, යුගමශාලවෘක්ෂයන්අතරෙහි; මාරස්ස, මාරයාහට; අත්තනො, තමන්වහන්සේගේ; ආයුසඞ්ඛාරොස්සජනං අපි, ආයුසංස්කාරහැරීතැනටද; පූජයාමි, පුදමි.

250\. පණිධානම්හිපට්ඨාය, ප්‍රණිධානයේපටන්; කතකිච්චං, කළකෘත්‍යයන්; අසෙසතො, නිරවශෙෂයෙන්; නිට්ඨාපෙත්වාන, නිමකොට; සො සත්ථා, ඒශාස්තෲතෙම; අනාසවො, ආශ්‍රවරහිතවූයේ; පරිනිබ්බායී, පිරිනිවීද.

251\. එවං, මෙසේ; නිබ්බායමානස්ස, (නිරුපධිශෙෂනිර්වාණධාතුවෙන්) පරිනිර්වාණයකරන්නාවූ; කතකිච්චස්ස, කළකෘත්‍ය ඇති; තාදිනො, (ඉෂ්ටානිෂ්ටයෙහි) එකස්වරූපවූ; (ශාස්තෲන්වහන්සේගේ) චිරාගතා, චිරකාලානුවර්තීවූ; මහාකාරුණා, මහත්වූකරුණාතොමෝ; කිඤ්චිපි, මඳකුදු; න නිබ්බායිත්ථ, නොපිරිනිවීය.

252\. යොඅයං, යම්මේ; ධම්මොච, ධර්මයෙක්ද; විනයොච, විනයෙක්ද; මයා, මාවිසින්; දෙසිතො, දෙශනාකරණලද්දේද; (ඒමේධර්මයහාවිනයද) සරීරජා, (මාගේ) ශාරීරිකවූ; ධාතුයොච, ධාතූහුද; මමච්චයෙන, මාපිරිනිවීමෙන්පසු; වො, තොපට; සත්ථා, ශාස්තෘවන්නේයයිද.

## ෂත්තසති.

253. අපරාජිතපල්ලඞ්කං බොධිරුක්ඛඤ්ච උත්තමං,
මම' ච්චයෙන වො සත්ථා' ත්‍යනුජානි මහාමුනි.

254. මම ඨානෙ ඨපෙත්වාන ධාතුං බොධිඤ්ච පූජිතුං,
අනුජානාමි තුම්හාකං සාධනත්ථං සිවඤ්ජසං.

255. තස්මා හි තස්ස සද්ධම්මං උග්ගණ්හිත්වා යථාතථං,
ය්වායං දෙසෙසි සම්බුද්ධො නත්වාන පූජයාම' හං.

256. තස්මා සාසපමත්තම්පි ජිනධාතු මසෙසිය,
විත්ථිණ්ණං චක්කවාළම්හි නත්වාන පූජයාම' හං

257. පරම්පරාගතානම්පි ජයමහාබොධිරුක්ඛතො,
සබ්බසං බොධිරුක්ඛානං නත්වාන පූජයාම' හං.

---

253. උත්තමං, ශ්‍රේෂ්ඨවූ; අපරාජිතපල්ලඞ්කං, අපරාජිත පර්‍ය්‍යඞ්කයද; බොධිරුක්ඛංච, අශ්වත්ථබොධිද්‍රැමයද; මමච්චයෙන, මාගේඇවෑමෙන්; වො, තොපට; සත්ථාඉති, ශාස්තෘවන්නේයයි; (සො) මහාමුනි, (යම්) සර්වඥරාජයෙක්; අනුජානි, අනුදත්සේක්ද.

254–255. හි (යස්මා) යම්හෙයකින්; යොඅයංසම්බුද්ධො, යම් මේ සම්බුදුවරයෙක්; ධාතුං, ධාතූත්ද; බොධිංච, බොධිද්‍රැමයද; මමඨානෙ, මාගේස්ථානයෙහි; හෙවත් මාමෙන්ගරුතන්හි; ඨපෙත්වාන, තබාගෙණ; සිවඤ්ජසං, නිවන්මග; සාධනත්ථං, සිද්ධකිරීමපිණිස; පුජිතුං, පුදන්නට; තුම්හාකං, තොපට; අනුජානාමි, අනුදනිම්යයි; දෙසෙසි, දෙසූසේක්ද; තස්මා, එහෙයින්; අහං, මම; තස්ස, උන්වහන්සේගේ; සද්ධම්මං, ශ්‍රීසද්ධර්මය; යථාතථං, තත්වූ පරිද්දෙන්; උග්ගණ්හිත්වා, ඉගෙණ; නත්වාන, අභිවාදනායකොට; පූජයාමි, පුදමි.

256. තස්මා, එහෙයින්; හෙවත් ශාරීරිකධාතූන් වඳිනුපුදනු පිණිස (අනුදත්හෙයින්) චක්කවාළම්හි, සක්වලෙහි; විත්ථිණ්ණං, විපුලාවූ; සාසපමත්තං අපි, අබැටක්පමණවූද; ජිනධාතුං, සර්වඥ ධාතුවක්; අසෙසිය, ඉතිරිනොකොට; අහං, මම: පූජයෙ, පුදමි.

257. ජයමහාබොධිරුක්ඛතො, ජයශ්‍රීමහාබොධිද්‍රැමයෙන්; පරම්පරාගතානං අපි, පරපුරෙන්පැවැත්තාවූද; සබ්බසං, සියලු; බොධිරුක්ඛානං, බොධිවෘක්ෂයන්ට; අහං, මම; නත්වාන, වැඳ; පූජයාමි, (පිදියයුතුසියලුවස්තූන්) පුදමි.

## ජිනාලඞ්කාරය.

258. යං යං පරිභුඤ්ජි භගවා පත්තචීවර මාදිකං,
සබ්බං තං පරිභොගධාතුං නත්වාන පූජයාම’හං.

259. යත්ථ කත්ථචි සයිතො ආසීනො චඞ්කමී, පි වා,
පාදලඤ්ඡනකං කත්වා ඨිතො නත්වාන පූජයෙ.

260. න සඤ්ජානන්ති යෙ බුද්ධං එවරූපොති ඤාතවෙ,
කතං තු පටිමං සබ්බං නත්වාන පූජයාම’හං.

261. එවං බුද්ධඤ්ච ධම්මඤ්ච සඞ්ඝඤ්චාපි අනුත්තරං,
චක්කවාළම්හි සබ්බෙහි වත්ථූහි පූජයාම’හං.

**ඉති සාධුජනානන්දජනනිදානෙ ජිනාලඞ්කාරෙ
බුද්ධපූජාවිධාන දීපනීගාථා නිට්ඨිතා.**

---

258. භගවා, භාග්‍යවත්තෙම; පත්තචීවරමාදිකං, පාසිවුරු ආදීවූ; යංයං, යමක් යමක්; පරිභුඤ්ජි, පරිභොගකළසේක්ද; අහං, මම; තංසබ්බං, ඒසියල්ල; පරිභොගධාතුං, පාරිභොගිකධාතූන්; නත්වාන, වැඳ; පූජයාමි, පුදමි.

259 යත්ථකත්ථචි, යම්කිසිතැනෙක්හි; සයිතො, (භගවත්තෙම) හොත්තේද; ආසීනො, (යම්කිසිතැනෙක්හි) වැඩහුන්නේද; අපි, යලිත්; චඞ්කමීපිවා, (යම්කිසිතැනෙක්හි) සක්මන්හෝකෙළේද; පාදලඤ්ඡනකංකත්වා, ශ්‍රීපාදලාඤ්ඡනය පිහිටුවා; ඨිතො, (යම්කිසිතැනෙක්හි) වැඩසිටිසේක්ද; (ඒස්ථානයන්) නත්වාන, වැඳ; පූජයෙ, පුදමි.

260. යෙ, යම්කෙනෙක්; බුද්ධං, බුදුන්: න සඤ්ජානන්ති, නොහඳුනද්ද; (තෙසං, ඔවුන්ට) එවරූපො ඉති, (බුදුහු) මෙබන්දෙයයි; ඤාතවෙ, දැනගනුපිණිස; කතං, කළාවූ; සබ්බංපටිමංතු, සැමප්‍රතිමාවන්වනාහි; අහං, මම; නත්වාන, වැඳ; පූජයාමි, පුදමි.

261. එවං, මේඋක්තප්‍රකාරයෙන්; අනුත්තරං, නිරුත්තරවූ; බුද්ධඤ්ච, බුදුන්ද; ධම්මඤ්ච, ධර්මයද; අපි, යලිත්; සඞ්ඝඤ්ච, සඞ්ඝයාද; චක්කවාළම්හි, චක්‍රවාටයෙහි; සබ්බෙහිවත්ථූහි, සියලුපූජාභිවස්තූවලින්; අහං, මම; පූජයාමි, පුදමි.

සාධුජන, හුදිජනයන්ට; ආනන්දජන, සන්තොෂගෙණදීමට; නිදානෙ, කාරණාවූ; ජිනාලඞ්කාරෙ, ජිනාලඞ්කාරනම් ප්‍රකරණයෙහි; බුද්ධපූජාවිධානදීපනීගාථා, බුඩපූජාවිධිය ප්‍රකාශකවූ ගාථාවෝ; ඉති, මෙතෙකින්; නිට්ඨිතා, නිමියාහ.

## ස ත් ත ස ඞ් ගි ත.

262. අඤ්ජලිඤ්ච පුබ්බෙ 'පිච අත්තභාවෙ
සබ්බෙහි පුඤ්ඤෙහි මයා කතෙහි,
පූජාවිධානෙහි ච සඤ්ඤමෙහි
භවෙ භවෙ මෙ පනි මෙ භවෙය්‍යුං.

263. සද්ධාහිරොත්තප්පබහුස්සුතත්තං
පරක්කමො චෙව සතී සමාධි,
නිබ්බෙධභාගී වජිරූපමා හි
පඤ්ඤා ච මෙ සිජ්ඣතු යාවබොධිං.

264. රාගඤ්ච දොසඤ්ච පහාය මොහං
දිට්ඨිඤ්ච මානං විචිකිච්ඡිතඤ්ච,
මච්ඡෙර ඉස්සාමලවිප්පහීනො
අනුද්ධතො චා' චපලො භවෙය්‍යං.

---

262. අඤ්ජලිංච, මේඅත්බැව්හිද; අපි, යලිදු; පුබ්බෙච අත්ත භාවෙ, පෙරඅත්බැව්හිද; මයා, (එතද්ග්‍රන්ථකර්තෘභූත බුද්ධරක්ෂිතාචාර්‍ය්‍යවූ) මාවිසින්; කතෙහි, කරණලද්දවූ; සබ්බෙහි පුඤ්ඤෙහි, සියලු පින්කරණකොටගෙණද; පූජාවිධානෙහිච, සියලු පූජාවිධිකරණකොටගෙණද; සඤ්ඤමෙහිච, ඉන්ද්‍රියසංයමකරණකොටගෙණද; භවෙභවෙ, ජාතියක් ජාතියක් පාසා; ඉමෙපන, මේ (මතු දක්වනුලබන ශ්‍රද්ධාහිරොත්තප්පාදී) ගුණයෝවනාහි; මෙ, මට; භවෙය්‍යුං, වෙත්වා.

263. සද්ධා, ශ්‍රද්ධාවද; හිරොත්තප්පං, හිරිඔතප්ද; බහුස්සුතත්තං, බහුශ්‍රැතභාවද; පරක්කමොච, පරාක්‍රමයද; සති, සමෘතියද; සමාධි, චිත්තෙකාග්‍රතාවද; නිබ්බෙධභාගී, නිෂේධයසෙවිනාවූ; වජිරූපමාහි, වජ්‍රසදෘශමවූ; පඤ්ඤාච, ප්‍රඥාවද; යාවබොධිං, බුදුවීම දක්වා; මෙ, මට; සිජ්ඣතු, සිදුවේවා.

264. රාගංච, රාගයද; දොසංච, ද්වෙෂයද; මොහංච, මොහයද; දිට්ඨිංච, මිථ්‍යාග්‍රහණයද; මානං, මානයද; විචිකිච්ඡිතංච, සැකසිත්ඇතිබවද; පහාය, හැර; මච්ඡෙර, මසුරුමලය; ඉස්සා, (මෙරමාගේසම්පත් නොඉවසීම් ලක්ෂණවූ) ඊර්ෂ්‍යාවය; මල, පාප මලය; (යනමෙයින්) විප්පහීනො, තොරවූවෙක්ද; අනුද්ධතොච, උඩඟුනුවූවෙක්ද; අචපලො, සුවිනීතයෙක්ද; භවෙය්‍යං, වන්නෙම්වා.

## ජි නා ල ඞ්කා ර ය.

265. භවෙය්‍ය'හං කෙන චි නප්පසය්හො
භොගො ච දීනෙහි භවෙ අනූනො,
භොගො ච කායොච මමෙ ස ලද්ධො
පරූපකාරාය භවෙය්‍ය නූනං.

266. ධම්මෙන මාතාපිතරො භරෙය්‍යං
වද්ධාපචායී ච බහූපකාරී,
ඤාතීසු මිත්තෙසු සපුත්තකෙසු
වුද්ධිං කරෙය්‍යං හිත මත්තනොච.

267. මෙත්තෙය්‍යනාථං උපසඞ්කමිත්වා
තස්ස'ත්තභාවං අභිපූජයිත්වා,
ලද්ධාන වෙය්‍යාකරණං අනූනං
බුද්ධො අයං හෙස්සති නාගතෙසු.

---

265. අහං, මම; කෙනචි, කිසිවකුවිසිනුත්; නප්පසය්හො, නොමැඩියහැක්කේ; භවෙය්‍යං, වන්නෙම්වා; දීනෙහි, දිළිඳුජනයන් හෙතුකොටගෙණ; අනූනො, නොඅඩුවූ; හෙවත් සම්පූර්ණවූ; භොගොච, භොගසම්පත්ද; භවෙ, වේවා (දිළින්දන්ට දීමෙන් අඩුනොවන්නාවූසම්පත් ලැබේවා යනුයි) මම, මාවිසින්; ලද්ධො, ලද්දාවූ; එසොභොගොච, මේසම්පත්ද; හෙවත් දිලිඳුන්ට හා යාචකයන්ට දීමෙන් අඩුනොවන්නාවූ මේසම්පත්ද; කායොච, ශරීරයද; නූනං, එකාන්තයෙන්; පරූපකාරාය, පරනට උපකාරපිණිස; භවෙය්‍ය; වේවා.

266. ධම්මෙන, දැහැමින්; මාතාපිතරො, මව්පියන්; භරෙය්‍යං, පොෂ්‍යයකරන්නෙම්වා; වද්ධාපචායීච, වෘද්ධාපචායනයකරන්නෙක්ද; (වෙම්වා) සපුත්තකෙසු, දරුවන්සහිතවූ; ඤාතීසු, නෑයන් කෙරෙහිද; මිත්තෙසු, සුහුදුන්කෙරෙහිද; බහූපකාරීච, බොහෝ උපකාරඇත්තෙක්ද; (වෙම්වා) අත්තනොච, තමහටද; (චග්ගහණ යෙන් "පරෙසං" යනුදු සඞ්ගෘහීතයි, පරෙසං, අන්හටද;) හිතං, හිතවූ; වුඩිං, වෘඩියක්; කරෙය්‍යං, කරන්නෙම්වා.

267. මෙත්තෙය්‍යනාථං, මෛත්‍රෙයසර්වඥයන්කරා; උපසඞ්කමිත්වා, එළඹ; තස්ස, උන්වහන්සේට, අත්තභාවං, ආත්මභාවය; අභිපූජයිත්වා, යහපත්වපුදා; අයං, මේතෙමේ; අනාගතෙසු, එෂ්‍යත් කාලයෙහි; බුද්ධොහෙස්සති, බුදුවන්නේයයි; අනූනං, නොඅඩුව; හෙවත් සම්පූර්ණව; වෙය්‍යාකරණං, විවරණ; ලද්ධාන, (දෙව්මිනිසුන් සහිත මහාභික්ෂු සංඝයාමධ්‍යයෙහිදී) ලැබ.

## සත්තසතිත.

268. ලොකෙසු කෙනා’ පි අනූපලිත්තො
දානෙ රතො සීලගුණෙසු සණ්ඨිතො,
නෙක්ඛම්මභාගී වරඤාණලාභී
භවෙය්‍ය’ හං ථාමබලූපපන්නො.

269. සීසඤ්ච මංසං මම හත්ථපාදෙ
සඤ්ඡින්දමානෙ’ පි කරෙය්‍ය ඛන්තිං,
සච්චෙ ඨිතො කාතු මධිට්ඨිතෙ ච
මෙත්තායු පෙක්ඛාය යුතො භවෙය්‍යං.

270. මහාපරිච්චාග මකත්වා පඤ්ච
සම්බොධිමග්ගං අවිරොධයන්තො,
ජෙත්වා කිලෙසෙ ජිතපඤ්චමාරො
බුද්ධො භවිස්සාමි අනාගතෙසු.

**ඉති සාධුජනානන්දනනිදානෙ ජිනාලඞ්කාරෙ
පත්ථනාදීපනීගාථා නිට්ඨිතා.**

---

268. අහං, මම; ලොකෙසු, සත්වයන්අතුරෙන්; නොහොත් තුන්ලෙව්හි; කෙනඅපි, කිසිවකුසමඟද; අනූපලිත්තො, ඇලුම් නැත්තෙක්ද: දානෙරතො, දීමෙහි තත්පරවූවෙක්ද; සීලගුණෙසු, සීලගුණයන්හි; සණ්ඨිතො, මනාවපිහිටියෙක්ද; නෙක්ඛම්මභාගී, නෛෂ්කම්‍යය සෙව්නෙක්ද; වරඤාණලාභී, උත්තමඥානලාභියෙක්ද; ථාමබලූපපන්නො–ථාම, කායශක්තිය; බල, ඥානශක්තිය යන මෙයින්; උපපන්නො, යුක්තවූවෙක්ද; භවෙය්‍යං, වන්නෙම්වා.

299. මම, මාගේ; සීසංච, හිසද; මංසං, මස්ද; හත්ථපාදෙ, අත්පාද; සඤ්ඡින්දමානෙඅපි, සිඳිනකල්හිදු; ඛන්තිං, ක්ෂාන්තිය; කරෙය්‍යං, කරන්නෙම්වා; සච්චෙ, සත්‍යයෙහිද; කාතුං, (සිතූයමක් සිදු) කරණුපිණිස; අධිට්ඨිතෙච, අධිෂ්ඨානයෙහිද; ඨිතො, සිටියෙක්; (වන්නෙම්වා) මෙත්තාය, මෛත්‍රියෙන්ද; උපෙක්ඛාය; උපෙක්ෂාවෙන්ද; යුතො, සමන්විතවූවෙක්ද; භවෙය්‍යං, වන්නෙම්වා.

270. පචමහාපරිච්චාගං, පස්මහපිදීම; හෙවත් පඤ්චමහාපරිත්‍යාගය. අකත්වා, කොට; ("අවජ්ජං" යනාදියෙහිමෙන් මෙහිදු අකාරය තද්භාවයෙහි වැටෙයි) සම්බොධිමග්ගං, සම්බොධිමාර්ගය; අවිරොධයන්තො, නොවරදමින්; කිලෙසෙ, සකලකෙලශයන්; ජෙත්වා, සිඳ; ජිතපචමාරො, දිනූපස්මරුන්ඇත්තේ; අනාගතෙසු, අනාගතයෙහි; බුද්ධො භවිස්සාමි, බුදුවන්නෙම්වා.

සාධුජන, හුදිජනයන්ට; ආනන්දන, සන්තොෂගෙණදීමට; නිදානෙ, කාරණාවූ; ජිනාලඞ්කාරෙ, ජිනාලඞ්කාරනම් ප්‍රකරණයෙහි; පත්ථනාදීපනීගාථා, ප්‍රාර්ථනාප්‍රකාශකවූ ගාථාවෝ; ඉති, මෙතෙකින්; නිට්ඨිතා, නිමියාහුයි.

## ජිනාලඞ්කාරය.

271. එවංහි බුද්ධභූතස්ස කතකිච්චස්ස තාදිනො,
පරිනිබ්බුතස්ස මල්ලානං යමකසාලානමන්තරෙ.

272. සත්තරසසතෙ වස්සෙ ගතෙ ලඞ්කාතලෙ තදා,
රොහණෙ සුචිවංසම්හි ජාතො පත්ථටකිත්තිමා.

273. බුද්ධරක්ඛිතනාමො සො භික්ඛූනං ගණවාචකො,
අභිධම්මනභෙ වායුවෙගො'ව මතියා ගතො.

274. ඤාණාසිතා'තිතික්ඛෙන ජිතමාරබලං ජිනං,
ජිනාලඞ්කාරනාමෙන අලඞ්කාරෙන'ලඞ්කරිං.

275. අප්පමාණගුණෙ තස්ස මුනිනො'නුස්සරතො සුඛං,
ජිනාලඞ්කාරනාමං තං පතිගණ්හාථ සාධවො!

---

271. එවංහි, මෙසේ; බුද්ධභූතස්ස, බුදුවූ; කතකිච්චස්ස, කළකිසඇති; තාදිනො, තාදීවූ; මල්ලානං, මල්ලරජුන්ගේ; යමකසාලානමන්තරෙ, යුගමශාලාභ්‍යන්තරයෙහිදී; පරිනිබ්බුතස්ස, (නිරුපධිශෙෂනිර්වාණධාතුවෙන්) පිරිනිවියාවූ; (සම්‍යක්සම්බුද්ධයන් සම්බන්ධවූ)

272. වස්සෙ, හවුරුදු; සත්තරසසතෙ, සතළොස්සියයක්; හෙවත් (එක්දහස් සත්සියයක්.) ගතෙ, ඉක්මියාවූ; තදා, ඒකාලයෙහි; ලඞ්කාතලෙ, ලක්දිව්තෙලෙහි; රොහණෙ, රුහුණු ජනපදයෙහි; සුචිවංසම්හි, පිරිසිදුවංශ යෙක්හි; ජාතො, උපන්නාවූ; පත්ථටකිත්තිමා, ප්‍රකටකීර්තිඇත්තාවූ.

273. භික්ඛූනං, භික්ෂූන්ගේ; ගණවාචකො, ගණවාචීවූ; අභිධම්මනභෙ, අභිධර්මනැමැති ආකාශයෙහි; වායුවෙගොඉව, පවන් වෙගයක්සේ; මතියාගතො, නුවණින් පැතිරගියාවූ; බුද්ධරක්ඛිතනාමො, බුද්ධරක්ෂිතනම්වූ; සො, ඒආචාර්‍ය්‍යපාදතෙම.

274. අතිතික්ඛෙන, ඉතාතියුණුවූ; ඤාණාසිතා, අභිනමාගීඥන නැමැතිඛඩ්ගයෙන්; ජිත, දිනනලද; මාරබලං, මරසෙන්ඇති; ජිනං, සර්වඥයා; ජිනාලඞ්කාරනාමෙන, ජිනාලඞ්කාරනම් ප්‍රකරණ නැමැති; අලඞ්කාරෙන, මණ්ඩනයෙන්; අලඞ්කරිං, සැරසීය.

275. සාධවො! හුදිජනයෙනි! තස්සමුනිනො, ඒසර්වඥයන්ගේ; අප්පමාණගුණෙ, ප්‍රමාණාතික්‍රාන්තගුණයන්; සුඛං, සැපසේ; අනුස්සරතො, සිහිපත්කරන්නාවූ; (බුද්ධරක්ෂිතාචාර්‍ය්‍යවූ මාගේ) ජිනාලඞ්කාරනාමං, (බුදුන්ගේ අප්‍රමාණ ගුණයන් රචනාකරණලද) ජිනාලඞ්කාරනම්වූ; තං, ඒමණ්ඩනය; පතිගණ්හාථ, (ශ්‍රවණොද්ග්‍රහණධාරණපරිප්‍රශ්නවිනතනාදිවිධියෙන්) ප්‍රතිග්‍රහණය කරව්.

## ස ත් ත ස ති ත.

276. ලද්ධාභිසෙකො වරපණ්ඩිතෙහි
ලඞ්කාතලෙ චොලියතම්බරට්ඨෙ,
වවත්ථිතො සුට්ඨුව තක්කිකෙහි
* අසඞ්ඛනීයො පන යෙන කෙනචි.

277. වීසට්ඨභාණවරමණ්ඩිත ගන්ථ පිණ්ඩො
මණ්ඩෙතු සාසනකරණ්ඩගතො යතීසො,
යො බුද්ධරක්ඛිත මහාචරියාසභෙන
සම්පිණ්ඩිතො විවිධකිත්තිසිරිංධරෙන.

278. බලං අනඞ්ගස්ස නුදං නිරන්තරං
නිරන්තරං ධම්ම මනුස්සරන්තා,
බලං අනඞ්ගස්ස නුදං නිරන්තරං
නිරන්තරං චිත්තමලං ජහාථ.

## ඉ ති ජි නා ල ඞ්කා රො නි ට්ඨි තො.

---

276. ලඞ්කාතලෙ, ලක්දිව්තෙලෙහිද; චොලියතම්බරට්ඨෙ- චොලිය, සොලීරටටඅයත්; හෙවත් දක්ෂිණ ඉන්දියාවේ කාඤ්චිපුරයටඅයත්වූ; තම්බරට්ඨෙ, තාම්‍රරාෂ්ට්‍රයෙහිද; හෙවත් තිණවල්ලියෙහිද; වරපණ්ඩිතෙහි, උත්තමපණ්ඩිතයන්ගෙන්; ලද්ධාභිසෙකො, ලැබූඅභිෂෙකඇති; තක්කිකෙහිච, තාර්කිකයන්විසිනුදු; සුට්ඨු, යහපතැයි; වවත්ථිතො, ව්‍යවස්ථාකරණලද්දවූ; යෙනකෙනචිපන, යම්කිසිවකුවිසින්වනාහි; අසඞ්ඛනීයො, නොගිණියහැක්කාවූ.

277. විවිධ, අනෙකප්‍රකාරවූ; කිත්තිසිරිධරෙන, කීර්තිශ්‍රියක් උසුලන්නාවූ; බුද්ධරක්ඛිත, බුද්ධරක්ෂිතනම්වූ; මහාචරියාසභෙන, පූජ්‍යාචාර්‍ය්‍යොත්තමයන්විසින්; සම්පිණ්ඩිතො, සම්පිණ්ඩනයකරණලද; යො, යම්; වීසට්ඨභාණවර, අටවිසිබණවරකින්; මණ්ඩිත, සරසනලද; ගන්ථපිණ්ඩො, ග්‍රන්ථපිණ්ඩයක්; (වේද) සො, ඒ ග්‍රන්ථපිණ්ඩය; හෙවත් ජිනාලඞ්කාරයතෙම; සාසනකරණ්ඩගතො, සම්බුද්ධශාසන නැමැති කරඬුවට පැමිණියේ; යතී, භික්ෂූන්; මණ්ඩෙතු, සරසනසේක්වා.

278. නිරන්තරං, සතතයෙන්; අනඞ්ගස්ස, පඤ්චබාණයාගේ; බලං, සාමර්ථ්‍යය; නුදං, පහකරන්නාවූ; නිරන්තරං, නිතර; හෙවත් අතරක්නැතිසේ; ධම්මං, ශ්‍රීසද්ධර්මය; අනුස්සරන්තා, සිහිකරන්නාවූ; (තොපි) අනඞ්ගස්ස, කාමදෙවයාගේ; බලං, ශක්තිය; නිරන්තරං, අනවරතයෙන්; නුදං, හැරපියමින්; නිරන්තරං, නිතොර: චිත්ත මලං, සිතෙහි හටගන්නාවූ රාගාදි කාලුෂ්‍යයන්; ජහාථ, හරිව්.

ජිනාලඞ්කාරො, ජිනාලඞ්කාරනම් ප්‍රකරණය; ඉති, මෙතෙකින්; නිට්ඨිතො, නිමියේය.

---

## ශු භ ම ස් තු.

---

"අසඞ්ඛාණීයො" සමහර

## ERRATA.

# ශොධන පත්‍රය.

| පිටු. | පෙලේ. | අශුඬ. | ශුඬ. |
|---|---|---|---|
| 3 | 21 | ශෙලක | ශෙලාක. |
| ,, | 28 | සදැළුා | සදැළු. |
| ,, | 29 | සුදනී | සූදනී. |
| 4 | 19 | පඩා | පඬා. |
| 5 | 1 | සිලෙන | සිලෙත. |
| ,, | 22 | අචාර | ආචාර. |
| 7 | 1 | අනාකූලං | අනාකුලං. |
| 8 | 18 | ඉඩී | ඉඩි. |
| 11 | 25 | | තෙ, ඒබුඩගුණයෝ. වන්‍දෙය්‍යා, වැන්ද යුත්තාහ. |
| ,, | 26 | සනොතගාෂණෙ | සනෙතාෂගෙණ |
| 18 | 26 | දළහංකතුවා | දළහංගණහතුවා |
| 21 | 34 | මේසේ | මෙසේ |
| 24 | 34 | අකාසගං | ආකාසගං |
| 25 | 16 | නිවසිතා | නිවාසිතා |
| ,, | 24 | වෙච | වෙව |
| ,, | 30 | සසූතා | සුසූකා |
| ,, | 32 | ලපිසු | ලපිංසු |
| 26 | 12 | ගජ්ජිංසු | ගජ්ජිංසු |
| 29 | 29 | පිරිවරණලද්දවූ | පිරිවරණලද්දේවී |
| 30 | 31 | අනුසය | අනුශය |
| 33 | 17 | (චතුරොසයෙන්). පිරුණාවූ. නො හොත් හරිතවූ | (චතුරොසයෙන්) ගෙණයන ලද්දවූ. හෙවත් හවොත් පතනියට ගෙණයන්නාවූ |
| 34 | 31 | නොදනීත් | නොදනිත් |
| 36 | 26 | ශ්‍රීයාදූනය | ශ්‍රීදූනය |
| 37 | 27 | නෛෂ්ක්‍රම්‍යා | නෛෂකම්‍යා |
| 39 | 7 | තදනතුපරි | තදනතුපරි |
| ,, | 26 | කොචිලෝ | සක්වාවෝ |
| 43 | 27 | පරිවාරත්සත්‍රිද | පරිවාරසත්‍රින්ද |
| 46 | 19 | දෙවඡරංඉව | දෙවචඡරංඉව |
| 50 | 10 | අරොපිත | ආරොපිත |
| ,, | 28 | අරොපණය | ආරොපණය |

| පිටේ. | පෙලේ. | අශුඩ. | ශුඩ. |
|---|---|---|---|
| ,, | 11 | මහ | මහා |
| 51 | 17 | ප්‍රහානය | ප්‍රහාණය |
| ,, | 20 | ගාථාපදයෙන් | ගාථාපාදයෙන් |
| 53 | 24 | ගුණවිශෙසයක් | ගුණවිශෙෂයක් |
| 55 | 11 | නිවරණ | නීරණ |
| 56 | 32 | අන්ධසස, මොහයෙන් අන්ධවූසියළුලොකයාගේ. | තමඅඳෙ, අඳුරුදුරුකරන්නාවූ. රවි, ළහිරුමෙන්. අන්ධසස, මොහයෙන්අන්ධවූ සියළු ලොකයාගේ. තමඅඳෙ, අඳුරුනසන්නාවූ-යයි සලකනු. |
| ,, | 33 | තමඅඳෙ, අඳුරුදුරුකරන්නාවූ, රවි, ළහිරුමෙන්ද. | |
| 58 | 6 | මජ්ඣීමාය | මජ්ඣිමාය |
| 60 | 32 | නාගේලය | නාගේළය |
| 63 | 37 | සෘක්‍ෂයකින් | සාක්‍ෂියකින් |
| 64 | 24 | මහත්ඩල්වර | මහත්ඹල්වර |
| 65 | 32 | පිඹින්ම | පිඹිවින්ම |
| 67 | 5 | අපරාජීතෙ | අපරාජිතෙ |
| 68 | 14 | එශාක්‍යමුනිතෙම | ඒශාක්‍යමුනිතෙම |
| 71 | 19 | මහාසහශ්‍රි | මහාසහස්රී |
| ,, | 20 | විසුඳුනුපෙතුං | විසුඳුනුපයිතුං |
| 75 | 11 | සතරාමරබ්‍රහමගණාහි | සතරාමරබ්‍රහමනණ |
| ,, | 12 | සතරාමරබ්‍රහමනණා | සතරාමරබ්‍රහමගණ |
| 76 | 9 | දූක්වූපරිද්දෙන් | සටදූක්වූපරිද්දෙන් |
| 77 | 18 | මූලද | බලද |
| 79 | 26 | සතරමහවීප | සතරමහාවීප |
| 80 | 28 | සුපිපජිතා | සුපුපජිතා |
| ,, | 38 | ත්‍රාණපත්‍රයෙන් | ත්‍රාණප්‍රත්‍යයෙන් |
| 85 | 14 | අනාවරණං, අනාවරණඥානයද. ඡඅසාධාරණානි, ෂට්අසාධාරණඥානයදයන. එතෙ මෙකීඥානයන්. | අනාවරණංඉති, අනාවරණඥානයදයන.එතෙ.මේ, ඡඅසාධාරණානි, ෂඩ්අසාධාරණඥානයන්ද– කියාසලකනු. |
| | 15 | | |
| ,, | 19 | බ්‍රහමනා | බ්‍රහමූනා |
| 88 | 18 | සීතො | සීතො |
| ,, | 21 | බුදූන් | බුදූන් |
| ,, | 22 | බුදුහු | බුදුහු |



